# ප්‍රජාශක්ති - 2020

**උපදේශකත්වය**

**ටී. ඒ. රණසිංහ**
අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**ඩබ්ලිව්. ජී. පී. වේරවැල්ල**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**එම්. එස්. එස්. නස්ලි**
සහකාර අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**සංස්කරණය**

**සී. කේ. ඩබ්ලිව්. අල්විස්**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**ඩබ්ලිව්. ඒ. ඩී. මංගලා චිත්‍රානි**
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**පිටකවරය**

එස්. පී. ඒ. එන්. කේ. දසනායක

**ප්‍රකාශනය**

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**මුද්‍රණය**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

CM 033216 - 1,000(2021/01)

## අතිරේක ලේකම්තුමියගේ පණිවිඩය

1974 වර්ෂයේ ආරම්භ කරන ලද ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ජන ජීවිතය නිවැරදි දිශානතියකට යොමු කිරීමේ හා ප්‍රජාව ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය අරමුණු කරගනිමින් කටයුතු කරන ජාතික මට්ටමේ සුවිශේෂී වූ ආයතනයකි.

1978 වසරේ විපර්යාකාරක වැඩසටහන ශ්‍රී ලාංකීය සංවර්ධන ක්ෂේත්‍රයට හඳුන්වාදීමට පුරෝගාමී වූ, මෙම ආයතනය සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය, දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගත් ජාතික මට්ටමින් මෙන්ම ජාත්‍යාන්තර මූල්‍ය සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් සඳහා ගලපාලීමට සෘජුවම මැදිහත් ව කටයුතු කර, ඒ සඳහා ඉහළ දයකත්වයක් ලබා දී ඇත. එම ක්‍රියාදමයන් ඔස්සේ යමින් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේද භාවිත කරමින්. සමාජ සජීවීකරණ ක්‍රියාවලිය තුළ වසර හතලිහකට අධික කාලයක්, මේ රටේ දිළිඳු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ ක්‍රියාවලියෙහිලා නොනිමි මෙහෙවරක කටයුතු කරමින් සිටී.

''රට හදන සෞභාග්‍යයේ දැක්ම'' තේමාව කරගනිමින් මේ වසරේ ප්‍රජාශක්ති සඟරාව එළි දැක්වේ. රටක් එලදායීව සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට යාමේ දී, ආර්ථික, සමාජීය, සංස්කෘතික, පාරිසරික හා ආධ්‍යාත්මික යන සෑම අංශයක් ඔස්සේ ම, එය ලඟාකර ගැනීමට උත්සාහ කිරීම අතිශයින්ම වැදගත් උපාය මාර්ගයකි. ඒ අනුව මෙවර ප්‍රජාශක්ති සඟරාවේ ලිපි සකස් වී ඇත්තේ එම මාතෘකා තේමා කරගනිමින් වන අතර, ක්ෂේත්‍රයේ කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන් මෙන්ම සංවර්ධන ක්‍රියාකාරීන් මෙහි ලිපි පරිශීලනය කිරීම තුළින් ඔවුන්ගේ සංවර්ධන මෙහෙවර වඩාත් එලදායීව ඉටුකර ගැනීමට එම අත්දැකීම්, ගලපා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**එච්. ඒ. හේමා පෙරේරා**
අතිරේක ලේකම් (මානව සම්පත් සංවර්ධන)
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා
ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

## අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

1970 දශකයේ ආරම්භ වූ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය දශක හතරකට අධික කාලයක් ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරන ආයතනයකි. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයේ සංවර්ධන ක්‍රියාකාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම තුළින් දිළිඳු ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ කාර්යයේ මෙම ආයතනය නිරතව සිටී. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය උපයෝගීකර ගනිමින් පුහුණුව තුළින් සංවර්ධන ක්‍රියාකාරීන් යහපත් චර්යාත්මක වෙනසකට ලක්කිරීම මගින් දිළිඳු ප්‍රජාව සංවර්ධන ක්‍රියාවලියට බද්ධ කරගැනීමේ සුවිශේෂී හැකියාවක් හා ඒ පිළිබඳ අත්දැකීම් සමුදායක් මෙම ආයතනය සතුව පවතී.

තවද පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන ඔස්සේ ක්‍රියාත්මක වෙමින් මෙහෙවර කරා යන ගමනේ දී ආයතනය මගින් එළිදක්වන ප්‍රකාශන සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව වර්තමාන රජය ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැංවීම උදෙසා ක්‍රියාත්මක වන කාලවකවානුවක රජයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන තේමාව කර ගනිමින් මෙවර ප්‍රජාශක්ති සඟරාව එළි දැක්වීමට කටයුතු කර ඇත.

අඩු ආදායම්ලාභී ප්‍රජාව සංවර්ධනයේ කොටස්කරුවන් ලෙසට පත්කර ගැනීමේ කාර්යයට උර දී සිටින සංවර්ධන ක්ෂේත්‍රයේ නිරත වූවන්ට ප්‍රයෝජනවත් වන පරිදි විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ලියවුණු ලිපි පෙළකින් මෙවර ප්‍රජාශක්ති සඟරාව සමන්විත වී ඇත. දිළිඳු ප්‍රජාවගේ සුභසිද්ධිය උදෙසා සංවර්ධන ක්‍රියාකාරීන් විසින් ඉටු කරන කාර්යයන්හි දී මෙම සඟරාව කියවීමෙන් ලබාගන්නා දැනුම ඔවුන්ට ප්‍රයෝජනවත් වනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ප්‍රකාශනය ඔබ අතට පත් කිරීම සඳහා ලිපි සම්පාදනය කරදුන් ලේඛක ලේඛිකාවන්ටත් ප්‍රකාශනය සංස්කරණය කළ මෙම ආයතනයේ නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

**ටී. ඒ. රණසිංහ**
අධ්‍යක්ෂ
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# සංස්කාරක සටහන

කිසියම් රටක් සංවර්ධනය කරා ලඟාවීමේදී එරටේ ආදයම් විෂමතාවය, විරැකියාව හා මන්ද පෝෂණය අඩුවීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ මට්ටමක පැවතීමත් යටිතල පහසුකම් වල දියුණුවත් පැවතිය යුතුයි. මේ සඳහා රටක පාලකයින් සිය සංවර්ධන ප්‍රතිපත්ති හා සංවරධන සැලසුම් තුළින් එය සාක්ෂාත් කර ගැනීමට උත්සාහ දරනු ලබයි. අප රට නිදහසින් පසු කාලය තුළ සංවර්ධනය වෙනුවෙන් නොයෙකුත් සංවර්ධන උපාය මාර්ග භාවිතයෙන් එය ලඟා කර ගැනීමට උත්සාහ දැරුවද එයට තවමත් හැකියාවක් ලබා ගැනීමට නොහැකි වී ඇත. විශේෂයෙන්ම දිළිඳුකම අපේක්ෂිත මට්ටමට අවම කරගැනීමට නොහැකි වීම හා ජීවන තත්ත්වයේ පැහැදිලි වෙනසක් නොවීම මෙන්ම සමාජ සාරධර්ම බිඳ වැටීම ප්‍රබල ලෙස ප්‍රදර්ශනය වීම වැනි සංසිද්ධීන් රට තුළ වර්ධනය වෙමින් පවතී.

වර්තමාන රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ඔවුන්ගේ තේමාව වන්නේ ''රට හදන සෞභාග්‍යයේ දැක්ම'' පෙරදැරි කරගත් වූවකි. එමගින් හුදෙක් ඵලදායි පුරවැසියෙක් සහ සතුටින් ජීවත් වන පවුලක්, ගුණ ගරුක, විනය ගරුක හා නීති ගරුක සාධාරණ සමාජයක් නිර්මාණය කිරීම තුළින් සෞභාග්‍යවත් දේශයක් ගොඩ නැංවීම අරමුණු කොට ඇත. රටක් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ආර්ථික, සමාජීය, සංස්කෘතික, පාරිසරික හා ආධ්‍යාත්මික අංශ ඔස්සේ එය ලඟා කර ගැනීමට උත්සාහ ගත යුතුයි. එය රටේ සියලු ප්‍රජාවගේත් රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම මහජන නියෝජිතයින්ගේ පූර්ණ දයකත්වයෙන් ලඟා කරගත යුතු වේ.

විශේෂයෙන්ම සංවර්ධන ප්‍රවාහයෙන් දුරස්ව සිටින ප්‍රජාව ඒ තුළට යොමු කර ගැනීම උදෙසා වවිධ ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. මෙහිදී පවුල මූලික කරගත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ඔවුන් සවිබල ගැන්වීම, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රධාන මෙහෙවර වේ. මේ සඳහා මානව සම්පත් සංවර්ධනය කළ යුතු අතර, ඒ වෙනුවෙන් සංවර්ධන ක්ෂේත්‍රයේ නිරතවූවන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා ගොඩ නැංවිය යුතුය. ඊට උරදීම සඳහා ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ ප්‍රකාශන අංශය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රජාශක්ති සඟරාවන් තුළින් විශාල මෙහෙයක් සිදු කරනු ලබයි. ඒ අනුව සෞභාග්‍යයේ දැක්ම පෙරදැරිකරගෙන 2020 වසර තුළ ප්‍රකාශයට පත් කරනු ලබන මෙම ප්‍රජාශක්ති සඟරාව තුළින් හුදෙක් එම අරමුණ ඉටු කර ගැනීම සඳහා ලිපි මාලාවක් එලි දැක්වේ. මෙය ප්‍රජාව සමග කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්ෂේත්‍රයන්හි නිරත නිලධාරීන්, වෘත්තිකයන්, සංවර්ධන වැඩකරුවන් සඳහා වඩාත් ඵලදායී වේ. එමෙන්ම මෙකී තේමාවට අදාලව පලවන මෙම ලිපි මගින් සංවර්ධන ඉලක්ක ලඟා කර ගන්නා ආකාරය පිළිබඳ වඩා හොඳ විමසුමක් පාඨකයා ට ලැබෙනු ඇත.

**සංස්කාරකවරු.**

# පටුන

*පිටු අංක*


| | |
|---|---|
| 01. දිළිඳුකම දුරලීම හා රට හදන සෞභාග්‍යයේ දැක්ම | 01 - 03 |
| 02. ජාතික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරියාගේ කාර්යභාරය නැවත හඳුනාගැනීම | 04 - 08 |
| 03. වැඩ ලෝකයේ ඉලක්ක සපුරා ගැනීමට නිපුණතා සංවර්ධන දශකය අර්ථවත් කරගමු | 09 - 12 |
| 04. සංස්කෘතිය, ආධ්‍යාත්මික සබැඳියාව මගින් සංවර්ධනය කරා යන ගමන් මග | 13 - 15 |
| 05. සෞභාග්‍යයේ දැක්ම හා ග්‍රාමීය සංවර්ධනය | 16 - 17 |
| 06. සොම්නස රජයන එලදායී ප්‍රජාවක් බිහිවන නීති ගරුක සාධාරණ සමාජයක් කරා..... | 18 - 20 |
| 07. වස විසෙන් තොර ආහාර සමාජගත කරමු | 21 - 23 |
| 08. සෞභාග්‍යයේ දැක්ම - යථාර්ථයක් වීමට ආකල්ප සංවර්ධනයේ වැදගත්කම | 24 - 31 |
| 09. කාන්තා ව්‍යවසායකත්වය | 32 - 39 |
| 10. හරිත විප්ලවයේ අනිසි බලපෑම අවම කර දේශීය කෘෂි කර්මාන්තය නංවාලමු | 40 - 42 |
| 11. සංවර්ධනයේදී පරිසරයේ ඇති වැදගත්කම | 43 - 47 |
| 12. සංවර්ධනය හා නූතන කෘෂි කර්මාන්තයේ ගමන් මග | 48 - 51 |
| 13. ගෝලීයකරණ අභියෝග : සංස්කෘතික වෙනස්වීම් හමුවේ සමාජ වැඩ පරිචයේ ඇති වැදගත්කම | 52 - 54 |
| 14. හඳුනා ගනිමුද කවුද මේ නිශා | 55 - 59 |
| 15. නිරෝගී ගම්මිරිස් වගාවකට මං පෙත | 60 - 61 |

# දිළිඳුකම දුරලීම හා "රට හදන සෞභාග්‍යයේ දැක්ම"

ලෝක ආර්ථික සමුළුව විසින් ආර්ථික වර්ධනය පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කොට ඇති න්‍යායාත්මක ආකෘති මගින් රටක සහ එහි පුරවැසියන්ගේ දිගුකාලීන සෞභාග්‍ය මට්ටම තීරණය කරනු ලබන වඩාත්ම වැදගත් සාධකය ලෙස ඵලදායිතාව හඳුනාගෙන ඇත. ඵලදායිතාව තීරණය වන්නේ කාර්යක්ෂමතාව හා සඵලතාව මගිනි. දශක තුනක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ පැවති අභ්‍යන්තර ගැටුම්කාරී වාතාවරණය රටේ සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළ අතර, අභ්‍යන්තර ගැටුම් අවසන් වී වසර ගණනාවකින් පසුව ද, කැපී පෙනෙන වර්ධනයක් නොමැති දේශීය හා විදේශීය අංශවල ක්‍රියාකාරිත්වය හා අඩු ඵලදායි වර්ධන තත්ත්වය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකයට එහි උපරිම ධාරිතාවට ළඟා වීමට නොහැකි වී ඇත.

1948 එනම් නිදහස ලබන අවදියේ දී අපගේ සංවර්ධන ගමන් මග ආරම්භ වූයේ සංසන්දනාත්මකව ඉහළ ආර්ථික සෞභාග්‍යයක් ද, පුළුල් ශුභසාධක පද්ධතියක් ද, සැලකිය යුතු තරම් හොඳ මට්ටමේ දියුණු යටිතල පහසුකම් ජාලයක්ද, ලිබරල් දේශපාලන ක්‍රමයක් ද සහිතවය. එහෙත් ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය පැහැදිලි දර්ශනය, නිවැරදි ප්‍රතිපත්තිය හා දේශපාලනික විනය අපට පිහිටා නොතිබුණි. මුල සිඳුණු විට ගසෙහි පැවැත්මක් නොමැතිවනවාසේ, වේගවත් සමාජ හා ආර්ථික වර්ධනයකින් තොරව අපගේ ආදායම් වර්ධනය ද ශුභසාධන ක්‍රමයද ලිබරල් දේශපාලන ක්‍රමයද යන සියල්ල අවිච්ඡින්නව නොපවතී. යටත් විජිත සමයේ ආරම්භවුණු සමාජ ශුභසාධන ප්‍රතිපත්ති නිදහසින් පසුව තවදුරටත් පුළුල් වී ගියේය. මෙහි විශේෂ ලක්ෂණයක් වූයේ ඒවා අඩු ආදායම් ලබන දිළිඳු ජන කොටස් ඉලක්ක කරගෙන නොව, රටේ සමස්ත ජනගහනයම ආවරණය වන පරිදි දිවයින පුරා ව්‍යාප්ත වූ ක්‍රමයක් වීමය. ඒ ඒ ප්‍රදේශවල පවතින සම්පත් හා ජනතාවගේ අවශ්‍යතා හඳුනාගෙන නිවැරදි භාවිතයක් හා ක්‍රමවේදයක් යටතේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොවිනි. බොහෝ දුරට මේවා හුදු දේශපාලනික අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක කළ ඒවා විය.

රටක රාජ්‍ය පාලනය අර්ථවත් වීමට නම් පුරවැසියන්ගේ සමාජ හා ආර්ථික ගැටලුවලට ඉහළ මට්ටමේ හා පිළිගත හැකි විසඳුම් ලබාදීම අනිවාර්ය වේ. එසේ නොවන කල ජයග්‍රහණය කරන ලද රාජ්‍යයේ (පක්ෂයේ) පාලන කාලය කෙටිවන අතර නියමිත පාලන කාලය ගෙවා දමනු ලබන්නේද විවිධ සමාජ, දේශපාලනික හා පංති ගැටලු මධ්‍යයේය. ශ්‍රී ලංකාව ඇතුලු බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල ඉතිහාසයේ මෙන්ම වර්තමානයේදීත් බොහොමයක් රජයයන් කොපමණ ගැටලු පැනනැගුනද තම බලය අත්හැරීම වෙනුවට පාලන කාලය දීර්ඝ කර ගැනීමට උත්සාහ කරනු දක්නට ලැබේ. එම තත්වය රටේ ආර්ථික පරිහානිය තවදුරටත් තීව්‍ර කිරීමට හේතු වූ බව අතීත අත්දැකීම් අනුව අපට පැහැදිලි වේ.

1994 දී ඇති වූ දේශපාලනමය වෙනස්කම් සමග එතෙක් ක්‍රියාත්මක වූ ජනසවිය වැඩසටහන වෙනුවට නව වැඩසටහනක් 'සමෘද්ධි' වැඩ සටහන නමින් 1995 දී හඳුන්වා දෙන ලදී. සමෘද්ධි වැඩසටහන ජනසවි වැඩසටහනට වඩා අංශ කීපයකින් ඉදිරි පියවරක් වශයෙන් හැඳින්විය හැකිය. මේ යටතේ පිහිට වූ සමෘද්ධි බැංකුව සහ සමාජ රක්ෂණ ක්‍රම, දිළිඳු ජනයා තුළ තම ආර්ථික හැකියාවන් පිළිබඳව විශ්වාසය ගොඩනැගීමේ දී විශාල කාර්යභාරයක් ඉටු කළේය. ජනසවිය වැඩසටහන හා සසඳා බලන විට සමෘද්ධි වැඩසටහන දේශපාලනීකරණය වීම ඉතා ඉහළ බව කෙනෙකුට ප්‍රකාශ කළ හැකිය. වැඩසටහන්හි සමස්ත ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයම දේශපාලන අනුග්‍රහයෙන් පත්වීම් ලැබුවෝ වූහ. රට පුරාම සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වුවද අපේක්ෂා කළ ප්‍රතිඵල නොලැබීමට හේතු වූ ප්‍රධාන කාරණයක් ලෙස බොහෝ දෙනා පෙන්වා දෙන්නේ ඉහත කී දේශපාලනීයකරණය හා දෝෂ සහගත ප්‍රතිලාභීන් තෝරාගැනීමේ ක්‍රමවේදයයි.

මෙවන් පසුබිමක් තුළ නිර්බාධකරණ ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුළ සිටිමින් ආර්ථික ප්‍රතිපත්තියේ වැදගත් වෙනස්කම් කීපයක් හඳුන්වාදීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ නව රජය ''**රට හදන සෞභාග්‍යයේ දැක්ම**'' වැඩසටහන යටතේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් මැයෙන් සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන මගින් දේශීය කෘෂිකර්මාන්තය, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත. ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ යළි පෙළගැස්මක් සටහන් කරමින් සැකසුණු මෙම වැඩසටහන ශක්තිමත් ජාතික ආර්ථිකයක් ගොඩනගා ගැනීම සඳහා ජාතිකවාදී ආර්ථික ප්‍රතිපත්තියක අවශ්‍යතාව පෙන්නුම් කර ඇත. ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ මෙම නව ප්‍රවේශය මගින් දිළිඳු ජනතාවට හිතකර ආර්ථික වෘද්ධි ක්‍රියාවලියක අවශ්‍යතාව ඉස්මතු කොට තිබේ. එහිලා ග්‍රාමීය ආර්ථිකය සහ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා ඇති අතර, ග්‍රාමීය සහ නාගරික අංශ අතර පවත්නා ආර්ථික විෂමතාව අඩු කිරීමටත් දිළිඳු ජනයාට සහන සැලසීමටත් විශේෂ අවධානයක් යොමු කොට තිබේ.

ආහාරවලින් ස්වයංපෝෂිත වීමත් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමත්, අපනයන ආදායම ඉහළ නංවා ගැනීමක්, ශක්තිමත් දේශීය ව්‍යවසායක පංතියක් නිර්මාණය කරගැනීමත්, රැකියා නියුක්තිය වැඩිකිරීමත් අරමුණ කර ගනිමින් වැඩසටහන් රැසක් දැනටමත් මේ යටතේ ක්‍රියාවට නංවා තිබේ. ඒවා අතර රටේ අවශ්‍යතාවට ප්‍රමාණවත් තරමින් දේශීයව නිෂ්පාදනය කළ හැකි සියලුම ආහාර ද්‍රව්‍ය ආනයනය නතර කිරීම විශේෂයෙන් වැදගත්ය. රටේ ආහාර නිෂ්පාදනය ඉහළයාම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් මෙම ප්‍රතිපත්තිය නිසා සිදුවනු ඇති අතර, වාර්ෂිකව කෙරෙන විශාල ආනයන වියදමක් නතර කරගැනීමට හා දේශීය නිෂ්පාදකයාට තම ආදායම ඉහළ නංවා ගැනීමටද හැකි වනු ඇත. ඒ අනුව 1977 සිට මෙරට ක්‍රියාත්මක වූ වෙළඳාම මූලික කරගත් ආර්ථික ක්‍රමය වෙනුවට අපේ රටේ නිෂ්පාදනය කළහැකි දේ හොඳින් හඳුනාගෙන, එම නිෂ්පාදන දියුණු කොට ජාත්‍යන්තර වෙළෙඳපල දක්වා වැඩි දියුණු කිරීමට හා ඒ මගින් අපනයන දිරි ගන්වා විදේශ විනිමය උපයන ආකාරයේ දැක්මක් හා වැඩපිලිවෙළක් මේ තුළ අන්තර්ගත වේ.

ඒ අනුව ආර්ථික සංවර්ධනයේ දී හා ඵලදායි රැකියා උත්පාදනයේ දී පෞද්ගලික අංශය ප්‍රධාන දයකත්වයක් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. රජයේ කාර්යභාරය වනු ඇත්තේ ව්‍යාපාරික පරිසරය වැඩි දියුණු කිරීමත්, ප්‍රධාන ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පාදනය සිදු කිරීමත්ය. පෞද්ගලික අංශයේ සංවර්ධනයට අවහිර කරනු ලබන බාධක සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ඇති අතර, ගෝලීය ආර්ථිකය සමග ඒකාබද්ධ වීමට සහාය ලබා දෙනු ඇත. මේ සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග අතර නව ආයෝජකයින්ට හා දැනට ක්‍රියාත්මක නිෂ්පාදකයින්ට විවිධ බදු සහන රාශියක් ලබාදීම, 4% ක් වැනි අඩු පොලියක් යටතේ ව්‍යාපෘති හා නිෂ්පාදන ණය ලබාදීම, තෝරා ගත් භාණ්ඩවල ආනයන සීමා කිරීම, කොරෝනා වසංගතය නිසා ඇති වූ පාඩුව අවම කරගැනීම සඳහා ණය ආපසු ගෙවීමේ කාලය හා පොලී අයකිරීම ප්‍රමාද කිරීම, ගෙවතු වගා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා මූල්‍ය සහයෝගිතාව සැපයීම, දේශීය ආයෝජන දිරි ගැන්වීමේ අපේක්ෂාවෙන් මහ බැංකු පොලී අනුපාත සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ දැමීම ආදිය දැක්විය හැකිය. මූල්‍ය සම්පාදන කටයුතු මූලික වශයෙන් සිදුකරනු ලබන්නේ රජයට අයිති ප්‍රධාන සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, මහජන බැංකුව හා ලංකා බැංකුව මගිනි.

නව රජයේ ''රට හදන සෞභාග්‍යයේ දැක්ම'' වැඩසටහන යටතේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකය මගින් යෝජනා කර තිබෙන්නේ ජනතාවට සහනාධාර දීමේ ප්‍රතිපත්තිය ඉක්මවා ගිය පුද්ගලයා සක්‍රීය ලෙස නිෂ්පාදන ක්‍රියාවලියට හසු කරගන්නා ප්‍රායෝගික වැඩපිළිවෙලකි. ඇත්තටම මෙය කිසියම් පුද්ගලයෙකුට කෑම සඳහා මාලුවෙක් දීම වෙනුවට බිලී පිත්තක් දීමකි. දිගින් දිගටම සහනාධාර සැපයීම උදාසීන ජාතියක් නිර්මාණය කිරීමේ මූලික පියවර වන අතර, එය හුදු රැවටීමක් මිස ඵලදායී මිනිසෙකු බිහි කිරීමේ නිවැරදි උපායමාර්ගයක් නොවේ.

කෙසේ වුවද, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකීමේ දී, සියලුම දෙනාට එකග විය හැකි ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් රටට

නොමැති වන්නේ දේශපාලන පක්ෂවල න්‍යාය පත්‍රවලට අනුව කලින් කලට ජාතික සංවර්ධන ප්‍රතිපත්ති වෙනස් වන බැවිනි. එබැවින්, ගෝලීය වෙළෙඳපොළ තුළ තරඟ කිරීම සඳහාත්, දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහාත් බලයට පත්වන රජයයන්ගේ දේශපාලන ප්‍රතිපත්තිවලට ස්වාධීනව, ස්ථාවරභාවයෙන් හා විනිවිදභාවයෙන් යුතු දිගුකාලීන ප්‍රතිපත්ති සැකසීමට සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. ප්‍රතිපත්තිමය අස්ථාවරත්වය මගින් වෙළෙඳපොළ අවදානම් තත්ත්වය ඉහළ නංවන අතර, එමගින් ආයෝජකයන්ගේ විශ්වාසය පළුදු විය හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විදේශීය සෘජු ආයෝජන ලැබීම පහළ යා හැකි අතර, පෞද්ගලික අංශය විසින් කරන දේශීය ආයෝජනද අඩු වනු ඇත. එබැවින් දේශීය ආර්ථිකය පිළිබඳ ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැංවීම සඳහා අතීතයේ පැවතුන කඩින්කඩ ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති සහිත සංස්කෘතියෙන් ඉවත්වීම වැදගත් වන අතර, ඒ වෙනුවට පැහැදිළි ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් දැඩි කැපවීමකින් යුතුව ක්‍රියාවට නැගිය යුතුව ඇත. එමෙන්ම, නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය රටක තරඟකාරිත්ව ඉහළ නංවන ප්‍රධාන සාධක බැවින් දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ යන දෙඅංශය තුළම ඉහළ අගය එකතු කිරීමකින් යුතු භාණ්ඩ හා සේවා සාර්ථකව නිපැයීමට හා අලෙවි කිරීමට හැකි දැනුම පාදක කරගත් ව්‍යවසායකයන් ධෛර්යවත් කිරීමට ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුය.

අපනයන ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්‍ෂණය උපයෝගි කර ගැනීමට දිරිමත් කිරීම, ජාත්‍යන්තර වෙළෙඳපොළට සහ සැපයුම් දමවලට ප්‍රවේශ වීමට ඇති අවස්ථා වර්ධනය කිරීම, ජාතික මට්ටමේ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම හා සාම්ප්‍රදායික හා නැගී එන කර්මාන්ත යන දෙඅංශයම සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික කුසලතාවයන්හි අඩුපාඩු පිරවීම අවශ්‍ය වේ. ආර්ථික පරිවර්තනය සඳහා බලපෑමක් ඇති කළ හැකි, ආර්ථික සංවර්ධනය අරමුණු කරගත් නව ව්‍යවසායයන්, නිර්මාණශීලී ව්‍යාපාර ආකෘති හා නිෂ්පාදන සහ සේවාවන් වෙත යොමුවීම වැදගත් වේ. නව නිපයුම් සඵල කර ගැනීම සඳහා, නවෝත්පාදන ව්‍යාපාර ආකෘති ස්ථාවර කිරීමට මුල්‍ය පහසුකම් ලබාදීම සහ නව ව්‍යාපාර වාණිජකරණය හා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය ලබාගැනීමට අවස්ථාව ලබාදීම අතිශය වැදගත් වේ. ශ්‍රී ලංකාව, කලාපීය හෝ ගෝලීය වෙළෙඳපොළ අරමුණු කරගත් නව ව්‍යාපාර ආකර්ශණය කර ගැනීමට හා පවත්වාගෙන යෑමට අපේක්‍ෂා කරනු ලැබේ නම් ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරනු ලබන නව්‍යතා දිරිමත් කරන ප්‍රතිපත්ති සම්මිශ්‍රණයක් මගින් සරල හා පහසුකම් සලසන ලද ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. එවන් උපායමාර්ගික වැඩපිළිවෙලක් හා අවංක උත්සාහයක් තුළ පමණක් ඉහත කී ''රට හදන සෞභාග්‍යයේ දැක්ම'' වැඩසටහන යටතේ යෝජිත ජනතා කේන්ද්‍රීය ආර්ථිකය මගින් දිළිඳුකම දුරුවී සේවා නියුක්තිය, ආදායම හා පුරවැසියන්ගේ ජීවන මට්ටම ඉහළ ගොස් අපේක්ෂා කරන ලද හා සැලසුම් කරන ලද ප්‍රතිඵල අත්කර ගැනීමට හැකිවනු ඇත.

**මහාචාර්ය එච්. එම්. ඩබ්ලිව්. ආරියරත්න හේරත්,**
අංශාධිපති,
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

# ජාතික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරියාගේ කාර්යභාරය නැවත හඳුනාගැනීම

## හැඳින්වීම

නිදහස් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා දශක ගණනාවක් තිස්සේ අපමණ උත්සාහයන් දරා ඇත. ඒ සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවා ඇති අතර ඒවායේ ප්‍රමුඛ අරමුණ වූයේ වෙනත් බොහෝ අපේක්ෂාවන් සමග ප්‍රධාන වශයෙන් ජාතික නිෂ්පාදනය වැඩි කිරීමය. එම වැඩසටහන් ක්‍රියාවට නංවන ලද ක්‍රමවේදය වූයේ ජාතික මට්ටමින් සැලසුම් කර දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් ක්‍රියාවට නැංවීමයි. ප්‍රගති සමාලෝචන රැස්වීම්, ප්‍රගති වාර්තා, පරීක්ෂා කිරීම්, පැවරීම්, නියෝග දීම් මගින් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සිදු කරන ලදී. ඇතිවන සෑම අවශ්‍යතාවයක දීම අද වුවත් ක්‍රියාවට නැගෙන්නේ මෙම පිළිවෙත්මය. එසේ වුවත් අපේක්ෂිත ප්‍රතිඵල දිනා ගැනීමට අසමත්ව ඇති බවට මැසිවිල්ලක් සෑම අංශයකින්ම නැගේ. මේ පිළිබඳව විවිධ සංවාද ඇත. විවිධ අත්හදාබැලීම් සිදුකර ඇත. එසේ වුවත් නව අත්හදාබැලීම් සිදුකිරීම නිරන්තරව සිදුවිය යුත්තකි. එහෙත් එබඳු උත්සාහයන්හිදී සංවර්ධනය පිළිබඳව හෙලනු ලබන දෘෂ්ඨියේ ප්‍රබල වෙනස්කම් සිදුවිය යුතුය.

සංවර්ධනයේ පූර්ව අවශ්‍යතාවක් වන්නේ පුද්ගලයාගේ ජීවන විලාසිතාවේ හා ජීවන තත්ත්වයේ ගුණාත්මක වර්ධනයකි. තරගයට වඩා සහයෝගය වැදගත්ය. මානව අභිමානය, සමාජ සාධාරණත්වය තහවුරු විය යුතුය. ඒ සඳහා ජනතාවගේ අර්ථවත් සහභාගිත්වය අවශ්‍ය වේ. එහි දී ජනතාව දෙස බැලිය යුත්තේ ඔවුන් සංවර්ධනයේ ප්‍රතිඵල භුක්ති විඳින්නන් ලෙස පමණක් නොව එහි සැබෑ ක්‍රියාකාරීන්, නිර්මාණකරුවන්, කර්තෘවරුන් වශයෙනි. එකී උත්සාහයන්හි දී ප්‍රධාන වශයෙන් ජනගහනයේ පහළම තලයේ සියයට පණහක (50%) ආර්ථික කටයුතුවල ස්වරූපයේ, නිෂ්පාදන ක්‍රියාවලියේ, ජීවන විලාසිතාවේ දැනුවත්ව සිදු කරනු ලබන විධිමත් වෙනස්වීම් සිදුවිය යුතුය. ජනගහනයේ මෙම සියයට පනහේ තීරුව සක්‍රිය ලෙස නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගී කරගැනීමෙන් තොරව සිදු කරනු ලබන උත්සාහයන් සැබවින්ම මායාවක් වනු ඇත.

කිසියම් ගැටලුවක් මතු වී එය විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමේදී හඳුනාගෙන ඇති සුපුරුදු ක්‍රමවේදය වන්නේ නැවත නැවත රාජ්‍ය ආයතන පිහිටුවමින් නිලධාරීන් දස දහස් ගණන් පත් කරමින් එම ගැටලු විසඳීමට උත්සාහ දැරීමය. එහි දී ජනතාව ඊට ක්‍රියාශීලී ලෙස සහභාගී කරගැනීම පිළිබඳව දක්වන්නේ අල්ප උනන්දුවකි. ඒ නිසා බොහෝ උත්සාහයන් අපතේ යයි. එය ජාතික ආර්ථිකයට අතිරේක බරක් එක්කොට ඇති බව සියලු දෙනාට වැටහෙන කරුණකි. කෙසේ වුවත් රටක් වශයෙන් ඉදිරියට යාමට නම් අහෝසි කළ නොහැකි මෙම ආයතන, ඒවායේ නිලධාරීන් නව ආකල්ප තුළ සන්නද්ධ කොට විකල්ප අත්හදා බැලීම් සිදු කළ යුතුය. මෙය එවැන්නකි.

## ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නව ප්‍රවේශයක අවශ්‍යතාව

රාජ්‍ය නිලධාරීන්ගේ විශේෂයෙන් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යභාරයේ වැදගත්කම හා බැරෑරුම්කම තහවුරු කරනු ලබන කරුණු රාශියක් වර්තමානයේ ඉස්මතු වී ඇත. එනම් වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දී ඇති දරුණු හා ගැඹුරුතම අර්බුදය ආර්ථික අර්බුදයයි. මෙම අර්බුදයේ ප්‍රධාන හා සුවිශේෂ වැදගත්කමක් උසුලන්නේ විදේශ විනිමය ගැටලුව බවත් හඳුනාගෙන ඇත. එම අර්බුදයන්ට මුහුණදීමේ දී නිෂ්පාදන ආර්ථිකයක් කෙරෙහි යොමු විය යුතු බවටද අදහස් පල වේ. එහි දී අවධානයට යොමු නොවූ සෙයක් පෙනෙන කාරණයක් මෙහි දී මතුකර පෙන්වීම අවශ්‍ය වේ. එනම් එබඳු ආර්ථිකයකට එක් පුද්ගලයෙකු විසින් එක් කරනු ලබන සුළු දායකත්වය ජාතික ආර්ථිකයට පමණක් නොව විදේශ විනිමය කෙරෙහිද අති විශාල බලපෑමක් එල්ල කරනු ලබන බවයි. ප්‍රධාන අපනයන භෝග වන තේ, රබර්, පොල් නිෂ්පාදනයට කුඩා වතු හිමියන්ගේ ක්‍රියාපිළිවෙලේ සුළු වෙනස්කම්

මත ඇති කරනු ලබන ඉතා සුළු වර්ධනය ජාතික ආර්ථිකයට අති විශාල තල්ලුවක් දෙනු ඇත. නිදසුනක් ලෙස එය තව දුරටත් මෙසේ විස්තර කළ හැකිය. දැනට වාර්තා වන පරිදි කුඩා තේ වතු හිමියන් ලක්ෂ පහකි. එම පිරිස එක් නිෂ්පාදකයෙකු සතියකට ග්‍රෑම් සියයකින් තම නිෂ්පාදන ප්‍රමාණය වර්ධනය කර ගත හොත් ජාතික ආර්ථිකයට ඇති කරන බලපෑම අති මහත්ය. එසේම සුළු රබර් නිෂ්පාදකයා තම රබර් නිෂ්පාදන ප්‍රමාණය සතියකට ග්‍රෑම් සියයකින් වැඩි කර ගතහොත් ඇති කරන බලපෑම තේරුම් ගත යුතුය. කුඩා නිෂ්පාදකයාගේ වැදගත්කම තේරුම් ගත යුත්තේ ඒ අයුරිනි. මෙහිදී අදහස් කරනු ලබන්නේ තේ, රබර් පමණක් නොව පසුව සඳහන් කරන භෝග, වෙනත් නිෂ්පාදන රාශියකද මෙම වෙනස්කම් සිදු කළ හැකි බව හා එම ඇති කරන වර්ධනය ජාතික ආර්ථිකයට අති විශාල බලපෑමක් එල්ල කරනු ලබන බවයි. විවිධ ආයතනවලට සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරීන් මෙහි දී වැදගත් වන්නේ ඉහත නිෂ්පාදකයින් සමග කෙලින්ම ගනුදෙනු කරනු ලබන්නේ ඔවුන් බැවිනි.

මෙහි දී ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව කෙටි විමසුමක යෙදීම බෙහෙවින් වටිනේය. ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විෂයානුබද්ධව විමසුම් ඇසක් හෙලුවහොත් අපගේ මනසේ ඇඳෙන චිත්‍රය මෙවැන්නකි. එක් පසෙක දැනුම හා සම්පත් කරපින්නාගත් නිලධාරී රොත්තකි. අනෙක් පස එම නිලධාරීන් පිළිබඳව දැන හෝ නොදැන ජීවන බරින් මිරිකී ප්‍රශ්න රැසක් මැද විඩාපත් බහුතර ජනතාවකි. මෙම ලිපියේ මීට පෙර සඳහන් කළ ජනගහනයෙන් සියයට පනහක තීරුව මෙයට අයත් වේ. ඒ අතරම එම දැනුම හා සම්පත්වලින් ප්‍රයෝජන ලැබිය හැකි ගම්වල වෙසෙන දැනුම සම්පත් හා හැකියාව ඇති කීපදෙනෙකි. නිලධාරීන් වෙත පැවරෙන ඉලක්ක සැපිරීම සඳහා ඔවුන්ගේ අවධානය යොමු වන්නේ මෙම කීපදෙනා වෙතය. එසේ වන්නේ ඔවුන් සමග කටයුතු කිරීම පහසු මෙන්ම වාසිදායක ද වන බැවිනි. මේ නිසා අති විශාල ජනතාවක් සංවර්ධනයේ ඵල නෙලාගත නොහැකිව අසරණව සිටී. ඇතැම් ස්ථානවල දැකිය හැකි සුවිශේෂී තත්ත්වයන්ට යටත්ව මෙය පොදු තත්ත්වයකි.

මෙකී තත්ත්වයන්ට විසඳුම් සෙවීම වහ වහා කළ යුතු තත්ත්වයක් වර්තමානයේ ඉස්මතුව ඇත. එබැවින් මෙහි දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ දස දහස් ගණන් වූ ක්ෂේත්‍ර නිලධාරියාගේ භූමිකාව වෙතය. එහි දී දිගු කලක් තිස්සේ සිදු කරන ලද පුහුණු කටයුතු හා ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර කටයුතුවලින් ලත් අත්දැකීම් හා දැනුම විමසා බලා නව ප්‍රවේශයක් පිළිබඳව සංකල්පගත කළ කරුණු විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට උත්සාහ කෙරේ. එය සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ දී භාවිත කරනු ලබන කාර්යබද්ධ පර්යේෂණයකට අදාළ වන්නක් බැවින් සටහන් කිරීමේ දුෂ්කරතා පලවුවත් එම දුෂ්කරතා පසෙක ලා අදාළ පිරිස්වලට ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට ඉදිරිපත් කරනු ඇත. එසේම එය සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය, සහභාගිත්ව ගැමි විමසුම වැනි ප්‍රායෝගික වැඩසටහන් උචිත ලෙස ගලපා ගනිමින් විස්තර කිරීමකි.

## නව ප්‍රවේශය යොදාගත හැකි ක්ෂේත්‍ර කිහිපයක්

ශ්‍රී ලංකාවේ දැනට දක්නට ලැබෙන සෑම නිෂ්පාදනයකටම හා නව නිෂ්පාදනවලට අදාළව ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයක් හෝ කිහිපයක් ඇත. ඒ සෑම ආයතනයකටම අදාළ සේවාවන් ජනතාව කරා ගෙනයාම අරමුණු කරගත් නිලධාරී පිරිසක් සිටී. ඔවුහු දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, ග්‍රාමසේවා නිලධාරී වසම් මට්ටමින් කටයුතු කරමින් සිටිති. එබඳු ක්ෂේත්‍ර කිහිපයක් හා ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන මෙහි දක්වා ඇත. මේ ආකාරයට එක් කළ හැකි තවත් බොහෝ ආයතන තිබිය හැකිය.

- වී ගොවිතැන - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
- පොල් වගාව - පොල් වගා කිරීමේ මණ්ඩලය
- තේ වගාව - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- රබර් වගාව - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
- ගම්මිරිස්, කරාබු, එනසාල්, කුරුඳු - සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව
- කජු වගාව - කජු සංස්ථාව
- කිරි ගොවීන් හා සත්ත්ව නිෂ්පාදන - ව්‍යවසාය සංවර්ධන අංශ විද්‍යා හා තාක්ෂණ ආයතනය

මෙම ආයතන නඩත්තු කිරීම සඳහා ජාතික අයවැයෙන් හා විවිධ ව්‍යාපෘති මගින් අති විශාල මුදලක් වැය කෙරේ. එම ආයතනවලට සම්බන්ධ සියලුදෙනා විසින් තමන්ගේ ක්‍රියාකාරකම්, නිමැවුම්, ප්‍රතිඵල ගැඹුරින් සිතා බැලිය යුතුය. එබඳු කල්පනාවක දී නව අත්හදා බැලීම්, නව ප්‍රවේශයන් පිළිබඳව අවධානය යොමු වනු ඇත. එසේ වුවහොත් තම ආයතන සතු සම්පත් හා දැනුම අදාළ පිරිස් වෙත කාර්යක්ෂමව හා ඵලදායක ලෙස ලබාදීම සඳහා වන නව ක්‍රම හඳුනාගත හැකි වේ. එබඳු වූ වැඩපිළිවෙලක් තුළින් ඔවුන්ගේ ජීවන මට්ටමේ මෙන්ම ජාතික ආර්ථිකයේ ද අති විශාල වෙනසක් සිදු වනු ඇත.

## නව ප්‍රවේශය සඳහා එළඹීම

නව සංවර්ධන උත්සාහයක දී බහුතර ජනතාවට, විශේෂයෙන් පහළම තීරුවේ සියයට පනහ සඳහා ප්‍රතිඵල අත්කර දීමේ නව ප්‍රවේශයක අවශ්‍යතාව මීට පෙර සඳහන් කර ඇත. ඒ සඳහා අප සතු අත්දැකීම් බොහෝය. ඒවා පිළිබඳව විවිධ ප්‍රශංසා මෙන්ම විවේචන ද ඇත. කෙසේ වුවත් අප ඒ සියල්ලෙන් අත්දැකීම් ලබා ගත යුතුය. එබඳු නව අත්හදා බැලීමක දී ඊට සම්බන්ධ වන සියලුදෙනාගේ ආකල්ප තියුණු වෙනසකට භාජනය විය යුතුය. එබඳු ආකල්ප වෙනසක් සිදු කිරීම සඳහා ඔවුන් තමන් හා තමන් මෙතෙක් කරන ලද සංවර්ධන කටයුතු පිළිබඳව මොහොතක් නැවතී විශ්ලේෂණාත්මක ආවර්ජනයක යෙදීම අවශ්‍ය වේ. ඒ සමගම නව ප්‍රවේශයක් පිළිබඳ සියුම් කල්පනාවක නිමග්න විය යුතුය.

එහි දී

- තමන් මෙතෙක් ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන්, ඒවා ක්‍රියාත්මක කළ ආකාරය, ඒවායේ ඵල ලැබූවන්, ප්‍රතිඵල ලැබීමට අසමත් වූවන්, එසේ වීමට හේතු.

- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී තමන් වෙත ඉහළින් ලබා දෙන ඉලක්ක (දැනුම හා සම්පත් සමග) තමන් විසින් සැලසුම් කර ප්‍රජාව අතරට ගෙන ගොස් ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක කළ බව හා එසේම ආධාර බෙදා දීම, උපදෙස් දීම, කටයුතු පැවරීම තමන් මෙතෙක් කළ උපාය මාර්ග බව.

- කිසියම් හැකියාවක් ඇති සීමිත පිරිසක් සමඟ කටයුතු කර තමන් වෙත පවරා දී ඇති ඉලක්ක සැපිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති බව.

- මෙම සියලු කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් (සියලු වගකීම් නිලධාරීන් දැරීම) මිනිසුන්ගේ දැනුම මොට වී හැකියාවන් යටපත් වී ඔවුන් නිෂ්ක්‍රීය, අනුන් මත යැපෙන පිරිසක් බවට පත් වී ඇති ද යන්න.

- තමන්ගේ සහාය අනිවාර්යයෙන් ලැබිය යුතු සුළු ගොවීන්, සුළු වැවිලි කරුවන්, සුළු නිෂ්පාදකයින්ගේ ජීවිතවල ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනසක් ඇති කිරීමට තමන් අසමත්ව ඇත් ද යන්න.

- ආර්ථික වශයෙන් පහළම තීරුවේ වෙසෙන සියයට පනහද තමන්ගේම ඉලක්ක පිරිසක් බවත් ඔවුන් වෙනුවෙන් ඉටු විය යුතු රාජකාරී මෙන්ම සමාජ වගකීමක් ද ඇති බව.

- බොහෝ විට සිදු වූයේ යම් යම් කරුණු තමන් තේරුම් ගැනීම මිස ප්‍රජාව සමඟ තේරුම් ගැනීම නොවන බව. ( දත්ත හා තොරතුරු නිලධාරියාගේ ප්‍රයෝජනය සඳහාය යන අදහස)

- ප්‍රජාව සමඟ තොරතුරු රැස් කිරීම, ප්‍රශ්න හඳුනාගැනීම, විසඳුම් සෙවීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම වඩා යෝග්‍ය බව.

- වර්තමානයේ දී බොහෝ දෙනාගේ සංවාදයට භාජනය වී ඇති ආදායම් පරතරය දිනෙන් දින වැඩිවීම කෙරෙහි තමාගේ කටයුතු ද බලපා ඇති බව.

- ප්‍රජාවගේ දියුණුව උදෙසා සංවර්ධන ක්ෂේත්‍රය තුළ මෙතෙක් භාවිත කොට ඇති විවිධ උපාය මාර්ග අධ්‍යයනය කොට කලට ගැලපෙන නව උපාය මාර්ග වෙත යොමුවිය යුතු බව.

මෙම අවබෝධය සමඟ තම ඉදිරි කටයුතු සැලසුම් කරගත හැකි ආකාරය පිළිබඳව දළ වශයෙන් සිදු කරනු ලබන මග පෙන්වීමක් මෙහි දී සිදු කෙරේ. එහි දී අනුගමනය කළ හැකි ක්‍රියාපිළිවෙල හා එකිනෙක අවස්ථාවල දී අදාළ කරගත හැකි විෂය පථය පිළිබඳව දළ අදහසක් මෙහි ඉදිරිපත් කර ඇත.

- ව්‍යාප්ත සේවාව පිළිබඳව තමන් සතු සම්පත් හා දැනුම පිළිබඳව නිසි තක්සේරුවකට එළඹීම.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහාය ඇතිව තමන් සතු සම්පත් හා දැනුම භාවිත කරමින් වැඩි ප්‍රයෝජනයක් අත්කර ගත හැකි, එම සම්පත් හා දැනුම බෙහෙවින් අවශ්‍ය ග්‍රාම නිලධාරී වසමක් තෝරා ගැනීම.

- කටයුතු ඇරඹීමට අපේක්ෂා කරන වසමේ රාජ්‍ය නිලධාරීන් හා ග්‍රාමීය නායකයින් පෞද්ගලිකව හමුවීම. තමන් ආරම්භ කිරීමට අපේක්ෂා කරන සංවර්ධන කාර්යය පිළිබඳව ඔවුන් සමඟ සංවාදයක යෙදීම හා ඒ සඳහා සහාය දීමේ වැදගත්කම මෙන්ම අවශ්‍යතාව ද ඔවුන්ට වටහා දීම.

- හඳුනාගත් නිලධාරීන් හා ග්‍රාමීය නායකයින් අතරින් වඩා සුදුසු පිරිසක් (සාමාන්‍යයෙන් 10 - 12 පිරිසක්) පොදු ස්ථානයකට කැඳවීම.

- මෙම රචනාවේ සඳහන් කොට ඇති සියලු කරුණු හා තමන්ගේ දැනුම උපයෝගී කර ගනිමින් ඔවුන් සමඟ සංවාදයක් ගොඩනගා ගැනීම හා අදාළ ක්‍රියාකාරකම්වල යෙදීම.

## ග්‍රාමීය නිලධාරීන් හා නායකයින් සමඟ සංවාදය හා ක්‍රියාකාරකම්

එහි දී

- තමන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන කාර්යය එහි දී ප්‍රයෝජනයට ගත හැකි තම ආයතනය සතු සම්පත් හා දැනුම පිළිබඳව පැහැදිලි කර දීම.

- සේවාව අවශ්‍ය පිරිස කවුරුන්දැයි සහභාගිවන්නන් සමඟ සාමූහිකව තේරුම් ගැනීම.

- එම පිරිස හඳුනාගැනීම සඳහා ගමේ දළ සිතියමක් සකස් කිරීම උචිත බව පෙන්වා දී ඔවුන් සමඟ සිතියමක් සකස් කිරීම.

- පළමුව ගමේ පාරවල්, පොදු ස්ථාන, ඉඩම් සමඟ නිවාස සටහන් කිරීම හා නිවෙස් පිළිවෙලින් අංකනය කිරීම.

- එම අංක අනුව එකිනෙකා පිළිබඳව තොරතුරු වෙනම සටහනකට ගැනීම. ඊට පුද්ගලයාගේ නම, රැකියාව, පවුලේ සාමාජික සංඛ්‍යාව, ඉඩමේ ප්‍රමාණය, වගාවන්, ඒවායේ ස්වභාවය, වෙනත් වෘත්තීන් වැනි කරුණු ඇතුලත්වීම සුදුසුය. මීට අමතරව තමන් මැදිහත්වන ක්ෂේත්‍රයට අදාළ අවශ්‍ය වේ යැයි හැඟෙන තොරතුරු ඇතුලත් කිරීම සුදුසුය. (මෙම අභ්‍යාසය කිරීම සඳහා සහභාගිත්ව ගැමි විමසුමේ සිතියම්කරණය අධ්‍යනය කිරීම සුදුසුය.)

## ප්‍රතිලාභීන් සමඟ පෞද්ගලිකව සිදු කරන සංවාද

මෙම අවස්ථවේ දී ක්ෂේත්‍ර නිලධාරියා විසින් දළ වශයෙන් හඳුනාගෙන ඇති ප්‍රතිලාභී පිරිස පෞද්ගලිකව මුණ ගැසී සංවාද ගොඩනගා ගැනීම සහ තමා වෙත ලැබී ඇති තොරතුරු නිවැරදි කර ගැනීම, නව තොරතුරු ඇතුලත් කිරීම, අනවශ්‍ය තොරතුරු ඉවත් කිරීම සිදු කළ යුතුය.

මෙම කටයුතු අවසන් වන විට වසම පිළිබඳව මූලික තොරතුරු ක්ෂේත්‍ර නිලධාරියා සතුව පවතී. ඉන්පසු ක්ෂේත්‍ර නිලධාරියා විසින් හඳුනාගෙන ඇති ප්‍රතිලාභීන් පෞද්ගලිකව හමු වී සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. මෙම අවස්ථාවට උචිත පරිදී ග්‍රාමීය නායකයෙක්, නිලධාරියෙක් සහභාගි කර ගැනීම සුදුසුය. මෙබඳු සාකච්ඡාවල දී ප්‍රයෝජනයට ගතහැකි කරුණු කිහිපයක් මෙහි සඳහන් කර ඇත. ගම්වාසීන්ගේ ආදායම හා වියදම, එදිනෙදා ජීවිතයට මුහුණ දෙන ආකාරය, (ජීවන ක්‍රියාවලිය) එහි දී මතුවන ප්‍රශ්න, ඒ සඳහා ඔවුන් විසින් හඳුනාගෙන ඇති විසඳුම්, ඒවායේ

වාසි, අවාසි, ඔවුන්ගේ වගාවන්, නිෂ්පාදන, ඒවායේ ස්වභාවය, අවශ්‍ය නම් වැඩි දියුණු කිරීමට ඇති ඉඩකඩ, එයට ඇති බාධා, අලෙවිය, ලැබෙන ප්‍රතිඵල, නිෂ්පාදන හෝ වගාවන්ගෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන්නේ නම් වෙනත් ආදායම්, කුලී වැඩ වැනි වෙනත් රැකියාවල නිරත වන්නේද, ඒවාට දුර බැහැර යාමට සිදු වන්නේද, එවිට තම වගාවන්, නිෂ්පාදන නඩත්තු කරන්නේ කෙසේද වැනි කරුණු ඒ අතර වේ. සංවර්ධන නිලධාරියා විසින් ප්‍රශ්න මතු කරමින් ඔවුන් සංවාදයට යොමු කළ යුතු අතර ඒ සමග ඔවුන් පිළිබඳව සැබෑ තත්ත්වය තමන් තේරුම් ගන්නා අතරම ඔවුනටද තේරුම් ගැනීමට සැලැස්විය යුතුය. මෙම සංවාදය උනුනුන් පෝෂණය වන සංවාදයක් විය යුතුය. මීළඟට සිදුවිය යුත්තේ ප්‍රතිලාභීන් සංවිධානගත කිරීමයි.

## සංවිධානගත කිරීම හා සැලසුම්කරණය

තමන් හඳුනාගෙන ඇති ප්‍රතිලාභීන් නිශ්චිත අරමුණක් ඔස්සේ සංවිධානය කොට ඔවුන් විසින් අරඹනු ලබන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සුදුසු සංවිධාන ව්‍යුහයක් සැකසීම හා සංවර්ධන කටයුතුවලට මග පෙන්වන සැලසුම්කරණ වැඩපිළිවෙලක් මේ අවස්ථාවේ දී ඇති විය යුතුය.

ඒ සඳහා

- පෞද්ගලිකව හමු වූ සියලු ප්‍රතිලාභීන් පොදු ස්ථානයකට කැඳවීම. මෙම අවස්ථාවට ප්‍රජා නායකයින් හා නිලධාරීන් හැකි අයුරින් සහභාගි කර ගැනීම.
- මෙතෙක් මෙම රචනාව තුළ සාකච්ඡා කළ සියලු කරුණු ඔවුන් සමඟ සංවාදයකට ලක් කිරීම.
- තමන්ගේ ඉලක්ක පිරිස මුහුණ දෙන ප්‍රශ්න ගැටලු ඔවුන් සමඟ හඳුනා ගැනීම.
- සියලුදෙනා සමාන ප්‍රශ්නවලින් පීඩා විඳින්නන් බව අවබෝධ කර දීම.
- සාමූහික උත්සාහය තුළ මෙම ප්‍රශ්න ජය ගතහැකි බව පෙන්වා දීම.
- නිෂ්පාදකයින්/ වගාකරුවන් නිශ්චිත අරමුණක් ඔස්සේ සංවිධානය කිරීම.
- ප්‍රතිලාභීන්ගේ වගාවන් / නිෂ්පාදන දියුණු කිරීම සඳහා මෙන්ම නව වගා / නිෂ්පාදන ඇරඹීම සඳහා ආයතනවලින් ලබා දෙන සම්පත් හා තමන් සතු සම්පත් ඵලදායක ලෙස යොදා ගනිමින් ක්‍රියාත්මක කළ හැකි සැලස්මක් සකස් කිරීම.

  (ක්‍රියාකාරකම්, සම්පත්, උපාය මාර්ග, කාලය, වියදම්, වගකීම් ආදිය සුදුසු පරිදි ඇතුලත් කළ හැකිය.)
- සකස් කරන ලද සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන්, නිලධාරීන් ඇතුලත් කමිටුවක් පත් කිරීම.
- සුදුසු ඇගයුම් මෙහෙයුම් වැඩපිළිවෙලක් සැකසීම.

මෙම රචනාවේ දී නව ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම පිළිබඳව සටහන ඉතා සැකෙවින් සඳහන් කොට ඇත. එය එසේ වන්නේ එම විස්තරය සටහනකට ගැනීමේ කාර්යය අතිශය දුෂ්කර කටයුත්තක් බැවිනි. එසේම එය ඉතා දීර්ඝ විස්තරයක් බැවින් මෙබඳු කෙටි රචනාවකට ඇතුලත් කිරීම අසීරු වන හෙයිනි. එහෙත් සංවර්ධන වැඩකරුවන් වශයෙන් තමන් ලබා ඇති බොහෝ අත්දැකීම් හා දැනුම ප්‍රයෝජනයට ගනිමින් මෙම කාර්යය තමනට සුදුසු ලෙස ගලපා ගැනීම ක්ෂේත්‍ර නිලධාරියා සතු කාර්යයකි.

**ඩී. සී. රණසිංහ,**
විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ පුහුණු හා පර්යේෂණ නිලධාරි,
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# වැඩ ලෝකයේ ඉලක්ක සපුරා ගැනීමට නිපුණතා සංවර්ධන දශකය අර්ථවත් කරගමු

සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් කර ගැනීම උදෙසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පෙරළියක් ඇති කරමින් 2021 - 2030 දස වසර නිපුණතා සංවර්ධන දශකය ලෙස රජය විසින් නම් කර ඇත. හෙට දින ලොව දිනන පුහුණු ශ්‍රම බලකායක් නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාව ඉටුකර ගැනීම පිණිස රජය නිපුණතා සංවර්ධන දස වර්ෂය නම් කරන්නට වූවේය. මෙහි දී දරුවකුගේ පාසල් අධ්‍යාපනය තුළ ඔහු හෝ ඇයගේ අභිමථාර්ථ හා සාමාර්ථ පිළිබඳව අවධාරණය කිරීම ඉතා වැදගත් වෙයි. එසේම පාසල් අධ්‍යාපනයෙන් පසුව ගනු ලබන තීරණය තරුණයාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වෙයි. ධනාත්මකව ජීවිතය දෙස බලන ශිෂ්‍යාට ජය හිමිවන අතර, උපේක්ෂා සහගත චරිත හඳුනාගෙන ඔවුන්ටද ජීවිතයේ විශිෂ්ට වූ මාර්ගය පෙන්වාදී යහ මඟට ගැනීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ සමස්ත පාසල් 10,167 ක් තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 4,165,964 ක් අධ්‍යාපනය ලබන අතර 2019 වර්ෂයේ උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල සුදුසුකම් ලද පිරිස 181,126 කි. නමුත් විශ්වවිද්‍යාල වරම් හිමිකර ගන්නේ 30,668 ක් පමණි. එසේම අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය අසමත්වීමෙන් හා ඊට ප්‍රථමයෙන් පාසල් හැරයාමෙන් 100,000 ක පමණ පිරිසක් මේ වන විට පාසල් අධ්‍යාපනයට ආයුබෝවන් කියා ඇත. දළ වශයෙන් වාර්ෂිකව 250,000 ක් පමණ පිරිසක් මේ අනුව උසස් අධ්‍යාපන වරම් අහිමි වී සමාජයට එකතු වෙති. මේ තරුණ ගහණය ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන වැඩසටහන මගින් රටේ සීඝ්‍ර ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීමට රජය ඉලක්ක කරයි. නිපුණතා සංවර්ධන දශකය මගින් මෙම තරුණ පිරිස වැඩ ලෝකයට පුහුණු ශ්‍රමිකයින් ලෙසින් සමාජගත කිරීම පිළිබඳව කතා කරයි. ඒ සඳහා රජය සතුව විධිමත් හා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඇත. එහි පළමුවැන්න නම් පාසැල් අධ්‍යාපනය ඵලදායී ලෙස පෙළගැස්වීමයි. ඒ අනුව දැනට දිවයිනේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව 371 සිට 1,165 දක්වා ගෙනයමින් ජාතික පාසලක අත්දැකීම සෑම දරුවෙකුටම ලැබීමට සලස්වනු ලබයි. මේ වන විට මෙරට පවතින අධ්‍යාපන කොට්ඨාස 312න් 125කම එක් ජාතික පාසලක් හෝ නොමැත. මේ හිදැස් ආවරණය කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය සැලසුම් සකස් කර ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ මීට පෙර විවිධ රජයන් විසින් ඇතිකළ ප්‍රතිසංස්කරණ අතර ඇති ඉසුරු පාසල් වැඩසටහන, නවෝද්‍යා පාසල් සංකල්පය, පාසල් දහසේ වැඩසටහන හා ළඟම පාසල හොඳම පාසල වැනි වැඩසටහන් හි සාරය රජය විසින් නව වැඩසටහන සඳහා උකහා ගනු ලබයි. ජාතික පාසලක් සමග ප්‍රාථමික පාසල් ජාලගත කෙරේ. විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය හඳුන්වා දෙනු ලබයි. එනම් මෙරට විභාග සමත් වන පිරිස එකම ආකෘතියක දක්ෂතා හා හැකියාවන් සහිත පිරිසක් වී ඇති බැවින් ඒ වෙනුවට විවිධ හැකියාවන්ගෙන් යුක්ත විවිධ ස්වරූපයේ පිරිසක් ශ්‍රම හමුදවට යොමු කරවීම එමගින් අපේක්ෂා කරයි. ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබ රැකියා පෝලිම්වල සිටින දස දහස් ගණන් උපාධිධාරීන් රටේ සංවර්ධනයට සිදුකරන දායකත්වය අවම මට්ටමක ඇත. මෙය හුදෙක් අදාළ උපාධිධාරීන්ගේ ගැටලුවක් නොව නූතන අධ්‍යාපන රටාවේ ඇති බරපතල ඛේදවාචකයකි.

එබැවින් ශ්‍රී ලංකාව වෙනස් කිරීම සඳහා මෙරට අධ්‍යාපනය වෙනස් කිරීම අනිවාර්යයෙන්ම කළයුතු බවට නැවතත් අවධාරණය කරමි. මෙහිදී

* පාසැල් අධ්‍යාපනයේ ස්වරූපය හා අන්තර්ගතය වෙනස් කිරීම
* විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා යාවත්කාලීන කිරීම හා නව මංපෙත් විවර කිරීම
* වෘත්තීය අධ්‍යාපනය හා කාර්මික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

යන ක්‍රියාමාර්ග ත්‍රිත්වයම ගත යුතුය. අධ්‍යාපනය කුමක් සඳහාද යන ගැටලුවට මෑතක් වන තුරු නිශ්චිත පිළිතුරක් ලබාදීමට හෝ අර්ථකථනය දීමට නොහැකි වී තිබුණි. නමුත් අධ්‍යාපනය යන්න ජාතික සංවර්ධනය සඳහාය යන්න මේ වන විට නිශ්චිතව හඳුනාගෙන ඇත. එනම් අපේ අධ්‍යාපන ක්‍රමවේද මෙන්ම අධ්‍යාපනයේ යෙදවුම් හා නිමවුම් සියල්ලත් අධ්‍යාපන ක්‍රමයෙන් බිහිවෙන මානව සම්පතත් ජාතික සංවර්ධනයට පිටිවහලක් විය යුතුය. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වැඩි කර ගැනීමට, රට සංවර්ධනයේ නව ඉසව් කරා යාමට, නව නිපැයුම් බිහිවීමට, තාක්ෂණික විප්ලවයක් මෙරට ඇති කරන්නට, විදේශ විනිමය වැඩිකර ගැනීමට, කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට නම් නූතන අධ්‍යාපනයේ වෙනස්කම් රැසක් අනිවාර්යයෙන් කළ යුතුය. මෙහිදී පෙර සඳහන් කළ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේදය බොහෝ ඉවහල් වේ.

අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් විය යුතු මෙන්ම එමගින් පාසල් වාරය යන්න මූලිකවම වෙනස් කළ යුතුය. සෑම පංති කාමරයක්ම ඉගෙනුම් මධ්‍යස්ථානයක් (Learning Center) ලෙස ප්‍රවර්ධනය වේ. ඒ තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සාකච්ඡා කිරීම, පර්යේෂණ කිරීම, අත්හදා බැලීම, ක්‍රියාකාරකම් කිරීම, තර්ක කිරීම, විවාද කිරීම, ඇතුළුව ඉගෙනීමට අදාළ සියලු කාර්යයන් කිරීමට ඉඩකඩ විවර වෙයි. ''විනීතව හැසිරෙන්න'', ''නිශ්ශබ්දවන්න'', වැනි පුවරු පාසලේ පුස්තකාලයට පමණක් සවි කරනු ලබයි. මෙම අධ්‍යාපන ක්‍රමයෙන් රජය All Rounder/Full Option පුරවැසියෙක් අපේක්ෂා කරයි. න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමින් යුක්ත නිර්මාණශීලී හා විවේචනාත්මක මෙන්ම සහජීවනයෙන් වැඩ කිරීමට කැමති නිපුණතාවෙන් පිරිපුන් පිරිසක් සමාජයට දයාද කළ යුතුය. එමගින් රජයේ රැකියා අපේක්ෂා කරන පිරිසක් පමණක් නොව, විදෙස් රැකියා සඳහා වෘත්තිකයින් සූදානම් කිරීමත්, පුද්ගලික අංශයේ සේවය කරන පිරිසක් හා තවත් කීපදෙනෙකුට රැකියා ලබාදෙන ව්‍යවසායකයින් පිරිසක් ද බිහි කිරීම රජයේ අපේක්ෂාවයි.

අප රටට විදේශ විනිමය වැඩි වශයෙන්ම ගෙන එන ක්ෂේත්‍ර පිළිබඳව විමසීමේදී

* විදෙස්ගත ශ්‍රමිකයින්
* ඇඟලුම් ක්ෂේත්‍රය
* තේ අපනයනය
* සංචාරක ව්‍යාපාරය
* තොරතුරු තාක්ෂණය

යන විෂයන් ඉතා වැදගත් වෙයි. නමුත් අපේ අධ්‍යාපන ක්‍රමය මගින් ඉහත ක්ෂේත්‍රයන්හි ආදායම් ඇති කිරීමට සිදුකරන දායකත්වය ඉතා අඩු මට්ටමක ඇති බව අමුතුවෙන් කිවයුතු නොවේ. කෙටියෙන්ම පැවසුවහොත් විදෙස්ගත ශ්‍රමිකයින් නිපදවීමේදී, ඇඟළුම් සේවිකාවන් හෝ කාර්යය මණ්ඩල සැකසීමේදී, තේ කර්මාන්තය උදෙසා, ධීවර කාර්යයන් සඳහා අපේ වර්තමාන අධ්‍යාපනයෙන් සිදුකරන බලපෑමක් නැති තරම්ය. සුළු හෝ බලපෑමක් කරන්නේ නම් ඒ සංචාරක ව්‍යාපාරය හා තොරතුරු තාක්ෂණය සඳහා පමණි. සංචාරක කර්මාන්තයේ ප්‍රගමණය සඳහා හොටෙල් පාසල් සෑම පළාතකටම එකක් බැගින් ස්ථාපනය කර ඇති අතර, සූපවේදී පාඨමාලාවන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් දිවයිනේ ඕනම ප්‍රදේශයකින් අධ්‍යයනය කළ හැක. නමුත් බොහෝ පාඨමාලා පුහුණුලාභීන් නොමැතිවීමෙන් සන පූර්ණය නොමැතිව පවත්වාගෙන යයි. තොරතුරු තාක්ෂණයේ නිරත සේවක පිරිස 146,000කි. නමුත් අද වන විට මෙම ක්ෂේත්‍රයේ විශාල ඉල්ලුමක් නිර්මාණය වී ඇත. රුපියල් ලක්ෂ ගණනක වැටුපකට පහසුවෙන් ගමන් කරන මෘදුකාංග ඉංජිනේරුවන් සඳහා ලෝකයේ ඇතිවී තිබෙන ඉල්ලුම් සාක්ෂාත් කිරීමට අපේ අධ්‍යාපන ක්‍රමය අපොහොසත් වී ඇත. 2019 වර්ෂයේදී මෙම ක්ෂේත්‍රයේ ඉල්ලුම 21,216ක් වූ නමුත් අපට සැපයීමට හැකි වූයේ 9,076ක් පමණි. එනම් අදටත් සුදුසුකම් සහිත 12,140ක් සඳහා පුරප්පාඩු ඉතිරිව ඇත. කෙසේ නමුත් 2022 දී තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ශිල්පීන් 200,000ක් සඳහා ඉඩක් ඇත. මේ සඳහා පුහුණු ශ්‍රමිකයින් අපි නිපදවිය යුතුය.

21 සියවසේ පළමු කාර්තුවේ සිටින අප හතරවන කාර්මික විප්ලවයට ගැලපෙන පරිදි අධ්‍යාපනය සහ රජයේ අභිමතාර්ථ සංශෝධනය කරගනු ලබන්නේ මේ අනුවය. තාක්ෂණික විෂය ධාරාවෙන් උසස් පෙළ විභාගයට පෙනී සිටින ප්‍රමාණය ඉහළ අගයකට ගෙන ඒමත්, ඊට සමගාමීව විද්‍යා, ගණිත හා වාණිජ විෂය ධාරාවෙන් උසස් පෙළට පෙනී සිටින පිරිස ක්‍රමක්‍රමයෙන් වැඩි කිරීමත් වැදගත් වෙයි. එමෙන්ම කලා විෂයධාරාවේ ගුණාත්මක බව වැඩිකර ගැනීම සඳහා කලා විෂයන්ට සුවිශේෂී දක්ෂතා පෙන්වන

අයට ප්‍රමුඛතාව ලබාදීම වටී. එනම් කලා විෂයන් යන්ත අදක්ෂයන්ගේ හෝ නිර්මාණශීලී නොවන අයගේ පාරාදීසයක්ය යන තේමාවෙන් නිදහස් කර එම විෂයන්ටද එම විෂයන් හදරන ශිෂ්‍යන්ටද අභිමානයක් ගෙන දිය යුතුය. එමෙන්ම 13 වසරක සහතික කළ අධ්‍යාපනය මගින්ද දරුවන්ට ද්විතීය අධ්‍යාපනය සඳහා යොමුවීමට අවස්ථාවක් විවරව ඇත. පසුගිය 2019 අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින ශිෂ්‍ය පිරිසෙන් 90,508ක් පමණ එතැන් සිට පාසල් ගමන නතර කර දමයි. සෑම වසරකම අ. පො. ස. උසස් පෙළ විභාග යෙන් පසු 30,668ක් පමණ විශ්වවිද්‍යාල වරම් ලබාගත් පසු 150,000ක පිරිසක් විධිමත් අධ්‍යාපන ක්‍රමය අවසන් කරයි. මේ අනුව විමසන කල්හි සාමාන්‍යයෙන් වසරකට යෞවනයින් 250,000 ක් පමණ සමාජයට අරමුණක් රහිතව එකතු වෙයි.

උසස් පෙළ විභාගය සමත් වන නමුත් ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් වීමට නොහැකි වූ අයට රාජ්‍ය විශ්වවිද්‍යාල, මණ්ඩප හා ඇකඩමි කීපයකටද අයදුම් කළ හැකිය. මේවා අතර දේශීය වෛද්‍ය විද්‍යායතනය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනය හා ස්වාමි විපුලානන්ද සෞන්දර්යය විශ්වවිද්‍යාලය වෙයි. ඇකඩමි ලෙසින් යාපනය විශ්වවිද්‍යාලයේ රාමනාදන් ඇකඩමිය ද මණ්ඩප ලෙසින් ශ්‍රී පාලි මණ්ඩපය, වව්නියා මණ්ඩපය හා ත්‍රිකුණාමලය මණ්ඩපයද ක්‍රියාත්මක වෙයි. තවත් දරුවන් පිරිසක් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහාද ඇතැමෙක් ජාතික හෙද පුහුණු ආයතනය හා උසස් තාක්ෂණ ආයතන සඳහාද ඇතුලත් වී මව්බිමේ සංවර්ධනය සඳහා සූදානම් වේ. එමෙන්ම විශ්ව විද්‍යාල විද්‍යායතන 06 ක් ද ක්‍රියාත්මක වෙයි. නිපුණතා සංවර්ධන දශකයනට යොමුවන ශ්‍රී ලාංකික යෞවනයාට මෙම අධ්‍යාපන ආයතන පද්ධතියෙන් දැවැන්ත පිටිවහලක් සපයයි. එමෙන් ම මෙරට ජාතික විශ්වවිද්‍යාලය සඳහා ඇතුළත් වීමට නොහැකි වූ නමුත් උසස් පෙළ විභාගය සමත් වූ සිසුන්ගේ අභිමථාර්ථ සාධනය කිරීම පිණිස රජය මගින් උපරිම රුපියල් ලක්ෂ අටක් දක්වා වූ පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ක්‍රියාවට නංවා ඇත. මේ ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මගින් අනුමත පුද්ගලික විශ්වවිද්‍යාල 10 ක් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවන අතර පාඨමාලා 50 ක් එමගින් ආවරණය කෙරේ. SLIIT, NSBM, SIBA, CINEC, CA, SRI LANKA, SANASA, HORIZON, KIU, SLTC, SAEGIS, එම විශ්වවිද්‍යාලයන්ය. යමෙකුට මේ පිළිබඳව තොරතුරු අවශ්‍ය වේ නම්, www.studentloans.mohe.gov.lk මගින් දැනගත හැකිය.

නිපුණතා සංවර්ධන දශකයේ මූලික අරමුණ මෙම තරුණ ප්‍රජාව ඉලක්ක කර වෘත්තීය පුහුණුව කාර්මික අධ්‍යාපනය, තාක්ෂණික හුරුව විධිමත් පරිදි ලබා දී පුහුණු ශ්‍රමිකයන් ලෙසින් සමාජ ගත කිරීමයි. ඒ සඳහා සූදානමින් ආයතන රැසක් අප සතුව පවතින අතර අළුතින් පුහුණු ආයතන රැසක් ස්ථාපිත වීමටද නියමිතය.

- වෘත්තීය පුහුණු අධිකාරිය (VTA)
- කාර්මික විද්‍යාල (TEC)
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA)
- තාක්ෂණ විද්‍යාල (COT)
- කොරියන් ටෙක් (K tec)
- ඉංජිනේරු තාක්ෂණ ආයතනය (IET)
- තරුණ සේවා සභාව
- හොටෙල් පාසල්
- විශ්වවිද්‍යාල විද්‍යායතන
- ජාතික ව්‍යාපාර කළමණාකරන ආයතනය (NIBM)
- සී/ස ජාතික ව්‍යාපාර කළමණාකරන විද්‍යායතනය (NSBM)
- සාගර විශ්වවිද්‍යාලය
- ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස විද්‍යායතනය (GERMAN TEC/SLGTI)
- ජපන් ටෙක් (AETI)
- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය (UNIVOTEC)

වැනි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන රැසක් මෙම කාර්යය සඳහා සූදානමින් සිටි, නිපුණතා සංවර්ධන රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති මෙම ආයතන මගින් මූලිකවම පාඨමාලා 200 කට වඩා වැඩි ප්‍රමාණයක් පවත්වාගෙන යනු ලබන අතර කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල මගින් සිදුකරන පාඨමාලා, විදුලි විද්‍යුත් හා විදුලි සංදේශ, මුදල් බැංකු හා කළමනාකරණ, භාෂා, ලෝහ හා මෘදු ලෝහ ඉංජිනේරු, මෙකාටොනික් තාක්ෂණය, සම්භාණ්ඩ හා පාවහන්, කාර්යාල කළමනාකරණ, රෙදිපිළි හා ඇඟළුම්, ආහාර තාක්ෂණය, ලී වැඩ ශිල්පී, කෘෂිකාර්මික, වැවිලි හා පශු සම්පත්,

මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තුව, ඉදිකිරීම්, මැණික් හා ස්වර්ණාභරණ ආදී ක්ෂේත්‍ර ගණනාවක් මේ ආයතන මගින් ආවරණය වෙයි.

මීට අමතරව බොහෝ පෞද්ගලික ආයතන රැසක්ම වෘත්තීය අධ්‍යාපනය ප්‍රචලිත කිරීමේ නිරතව සිටියි. එසේම අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත අධි තාක්ෂණ විශ්වවිද්‍යාල 10 ක් නුවරඑළිය, කළුතර, හම්බන්තොට, මාතලේ, පුත්තලම, මන්නාරම, මුලතිව්, ගාල්ල, පොළොන්නරුව, හා කෑගල්ල දිස්ත්‍රික්ක සඳහා ඉදිකිරීමට යෝජනා වී ඇත. මෙම විශ්වවිද්‍යාල මගින් තොරතුරු තාක්ෂණය, ජෛව තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණය මූලික කරගත් විෂයන් රැසක් උගන්වනු ලබයි. එක් අධ්‍යයන වර්ෂයක් සඳහා මෙම එක් ආයතනයකට නවක සිසුන් 1500 බැගින් බඳවා ගැනීම සඳහා සැලසුමක් ඇත ඒ අනුව වසරකට 15000 ක් අධි තාක්ෂණ විශ්වවිද්‍යාලයන්ගෙන් පමණක් අධ්‍යයන කාර්යයන් සඳහා එක් වෙති. මෙය නිපුණතා සංවර්ධන දශකය වෙනුවෙන් තබන ලද අති දූවැන්ත පියවරකි.

කාර්මික විද්‍යාල, තාක්ෂණ විද්‍යාල, වෘත්තීය පුහුණු අධිකාරිය හා නයිටා ඇතුළු අනෙකුත් පුහුණු ආයතන මගින් වාර්ෂිකව 150000 ක් පමණ බඳවා ගනිති. උසස් තාක්ෂණ ආයතන විශ්වවිද්‍යාල විද්‍යායතන, පුද්ගලික ආයතන, ආදිය මගින් තරුණ තරුණියන් සුදුසු වෘත්තීන් සඳහා සූදානම් කිරීම මගින් දැනට 30% ක වන නුපුහුණු ශ්‍රමික පිරිස 10% දක්වා අඩුකර ගැනීම රජයේ අරමුණයි. නිපුණතා සංවර්ධන දශකය රජය මගින් ආරම්භ කරනු ලබන්නේම ජාතික සංවර්ධනය සඳහා මෙම මානව සම්පත ඵලදායීව ලබා ගැනීම සඳහාය. මෙම ආයතන හා පාඨමාලා ඒ සඳහා මහඟු පිටිවහලක් සපයයි.


එමෙන්ම උක්ත කාර්යයන් සාධනය කරගැනීම පිණිස සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම නිපුණතා සංවර්ධන නිලධාරියෙක් සේවයේ නිරතව සිටියි. එමෙන්ම රජයේ පුහුණු ආයතනයන්හි වෘත්තිය මාර්ගෝපදේශන නිලධාරියෙක් බැගින් සිටිති. මේ සියලුම නිලධාරීන්ගේ හා අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින්ගේ මැදිහත් වීමෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් ඉලක්ක කර ගන්නා ලද, ''නිපුණතා සංවර්ධන දශකය'' වෙත යාමට අවශ්‍ය උත්තේජනය ධෛර්යය හා මෙහෙයවීම නොඅඩුව ලැබෙනු ඇත.

**ඕ. ජී. දිනේෂ් ජේ. නවරත්න,**
නිපුණතා සංවර්ධන නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ගලිගමුව.

## සංස්කෘතිය, ආධ්‍යාත්මික සබැඳියාව මඟින් සංවර්ධනය කරා යන ගමන් මග

ගස්වැල්, තුරුලතා, සතා සිව්පාවුන් මෙන්ම මානව වර්ගයාද අපූරු විශ්වයේ කොටස්කරුවන් වශයෙන් සියලු දායාදයන් භුක්ති විඳිමින් ජීවත්වනු දැකීම ම කෙතරම් අපූර්වත්වයක් ගෙන දේද? ගස්වැල්, වන සත්වයාට සාපේක්ෂව, මානවයා තම බුද්ධි වර්ධනයෙන් ඉදිරියෙන්ම සිටින නිසාමදෝ මිනිසා විටකදී හුදෙක් ගහකොළ, වන සතුන්ගේද, භූමියේද සතුරන් ලෙසින් හැසිරෙනු දැකීම කොතරම් අවාසනාවක් වන්නේද? සංවර්ධනයත් සමඟ කාලීන වශයෙන් සිදු වී ඇති පාරිසරික ව්‍යසනයේ නියමුවා මිනිසා වීම ප්‍රතිඵලයක් වශයෙන් අද වන විට ලොව පුරාවටම අතොරක් නැතිව විවිධ වර්ගයේ ස්වභාවික ව්‍යසනයන් රාශියක් උද්ගත වී ඇත. එනම්, නායයෑම්, සුළි කුණාටු, භූමිකම්පා, ටෝනාඩෝ, El-nino, සුනාමි ආදිය එලෙස හඳුනාගත හැකිය. මිහිතලය මත ඇති සම්පත් ක්ෂණයකින් උදුරා ගන්නා එවැනි ස්වභාවික විපර්යාසයන් හමුවේ මානව වර්ගයාට හුදෙකලා වීමට සිදු වී තිබෙනු දැකිය හැකිය.

නූතන සමාජයේ මේ වන විටත් මෙකී ස්වාභාවික ව්‍යසනයන්හි වේගවත් වර්ධනය නිසා පරිසරයට හිමිවිය යුතු නිසි තැන දීමට මිනිසා පෙළඹුනි. එබැවින් ශබ්ද කෝෂයන්ට නව වචන එකතු වෙමින් විශ්ව කෝෂය හා බැඳුණු තිරසර සංවර්ධනය, ජෛව විවිධත්වය,



ස්ථානීය සංරක්ෂණය ආදි නොයෙකුත් උපක්‍රමයන් අප හා එක් වී ඇත. මේ සියලු නිර්නායකයන් තුළින් අපේක්ෂා කරනුයේ හෙට ඉපදෙන අනාගතයේ එළිය දකින දරුවාට සුපිරි ලෝකයක් දායාද කර දීමටය. ඒ අතුරින් අද වන විට වඩාත් ආන්දෝලනයට ලක්ව ඇති තිරසර සංවර්ධනය මඟින් අපේක්ෂා කරනුයේ පවතින සම්පත් අනාගතයට ඉතිරි කර දීමයි. මෙය සාර්ථක කර ගැනීමේ උපාය මාර්ගයක් වශයෙන් නිල්ල පිරුණු රටක්- පැහැසර අනාගතයක්, අපි වවමු රට නඟමු, ගසක් වවා රටක් හදමු ආදි තේමාවන් අප අතරට එක්ව ඇත. දඩයම් යුගය ආදි සන්නිවේදනය නොදියුණු පුරාණ අතීතයේදී ද ආදි මුතුන්මිත්තන් යහපත් හෙටක් උදා කර දීම සඳහා අද දිනය යහපත් කර ගැනීමේ වටිනා කාර්යය සඳහා ඇප කැපවී කටයුතු කර ඇති බවට දෘෂ්‍යමාන වන පුරාතන සාක්ෂි ඉතිරි කොට ඇත. එම සාක්ෂි අද අපට වෙස් වළාගත් දේව ආශීර්වාදයක් වී ඇත. පුරාතනයේ සංස්කෘතිය, සංවර්ධනය අධ්‍යාත්මය දියුණු කිරීම උදෙසා නොදියුණු සන්නිවේදන මට්ටමක සිට වුවද ඉතා කාර්යක්ෂමව කටයුතු කර ඇති බව අපේ පැරණි දාගැබ්, වෙහෙර, විහාර, උයන් වතු මණ්ඩප සාක්ෂි දරයි. නිදසුනක් ලෙස, අතීතයේ සිගිරිය අපට පෙන්වා දිය හැක. මෙහි ඇති විශ්මය අදටත් නූතනයේ ඉංජිනේරුවන් මවිතයට පත් කරනු ලබයි. තවද, රිටිගල වැනි ආරණ්‍ය සේනාසනයක් වෙත මනස ගෙන ගිය කල්හි එම පුදබිමේ ඇති පුස්තකාල, ඔසු උයන්, ගිලන් මධ්‍යස්ථාන, රාජසභා නිර්මාණයන් සිදුකර ඇති ආකාරය පුදුමය දනවයි. මානසික ඒකාග්‍රතාවය සඳහා ජීවත් වන ලෙනගල, කැසිකිලිය පවා මනා ශික්ෂණයක් ඇතිව එම ශරීර කෘත්‍යයන් සිදු කළ යුතු ආකාරය පිළිබඳව පෙර පුහුණුව ලබා දේ. සක්මන් මළුව පවා ශාරීරික සුවතාව හා ආගමික සබැඳියාව ඇතිවන ලෙස සිදු කිරීමට මඟ පෙන්වයි. වටිනා ඔසු උයන් රිටිගල වන භූමිය තුළ පිහිටා ඇත. කෘත්‍රීම ශීතාගාර කුටීර වෙනුවට පුරාතනයේ වායු සමනය කරන ලද කාමර ද ඉදිකර තිබුණි. (පින්තූර)





එම කුටීර වර්තමාන සමාජයේ මෙන් කෘත්‍රිම වායු කාරක භාවිතයෙන් තොර වූ හුදෙක්ම ගල් කණු හා ස්වාභාවික ජලය පමණක් භාවිත කරමින් සකසන ලද ශීත කාමර ලෙසින් ඉදි වී ඇත. එමගින් දැඩි හිරු රැසින් වන හානිය අවම කර ගැනීමට අතීතයේ මුතුන් මිත්තන් සමත් වී ඇත.

වනය, රාජ්‍ය නායකයා ඇතුලු රට වැසියන් එදා දේවත්වයෙන් පුදනු ලැබීය. පුරවැසියන් ස්වභාවධර්මය හා අනුගත වෙමින් තිරසර පැවැත්ම උදෙසා ඇප කැපවී කටයුතු කළහ. අද මෙන් නොව, නව කොන්ක්‍රීට් ඉදිකිරීම් උදෙසා වටිනා දැව සම්පත බිමට නොහෙලන ලදී. පරිසරයට අවම හානි වන ආකාරයෙන් සියලු ඉදිකිරීම් සිදු කරන ලදී.

අද වන විටත් සොබාදහමේ අනූන චමත්කාරජනක රෝස තිරුවානා කන්ද සහිත නාමල් උයන එකල රජ දවස රජු මෙහෙයවීමෙන් සිරකරුවන් ලවා රෝපණය කරවන ලද්දකි. මෙමගින් තිරසාර සංවර්ධනයට ඔවුන් කෙසේ ළඟාවූවේද යන්න මදක් විමසා බැලිය යුතුය. සිරකරුවන් සඳහා නා ගස් රෝපණයට පෙළඹුවේ මතු බුදුවන මෛත්‍රී බුදුන් වහන්සේ නා ගස පාමුල බුදු වන බවට බෞද්ධාගමිකයන් තුළ පවතින විශ්වාසය සාක්ෂාත් කරගනු සඳහා එම සිරකරුවන්ගේ සිත්සතන් ආගමික සන්හිඳියාවට පෙළ ගැස්වීම උදෙසාය. තවද ඉදිකර ඇති බෙහෙත් ඔරු, ගිලන්හල ආදිය එය තවත් ශක්තිමත් කරවන්නකි. අතීත සටහන් මගින් මේ භූමිය තුළ ඔවුන් උදෙසා භාවනා වැඩසටහන් දියත් කර ඇත. එබැවින් වරදකරුවා සමාජයට මුහු කිරීමට පෙර මානසික ආතතිය හා කායික තුලනය ඇති කිරීම නොදියුණු සන්නිවේදන යුගයන් තුළ පවා වඩාත් දියුණු මට්ටමින් සිදුව ඇත.

පැරණි සමාජය තුළ පැවති එකිනෙකා හට ගරු කරන්නා වූ වැවයි-දාගැබයි-ගමයි- පන්සලයි ආගමික හා සංස්කෘති සබැඳියාව අද පවතින මුහුණු පොතේ (FB) අපට ලබා ගත නොහැක. පැල් කවි, පාරු කවි, පතල් කවි, ගැල් කවි, ගොයම් කවි, කුරහන් කවි ආදිය මගින් උකහා ගත් ආත්මීයගත වෘත්තීයමය රිද්මය අදටත් අප අතර නොනැසෙමින් පුංචි දරුවාගේ පෙළ පොතට ඇතුලත් කර මින් අප අද සොයා යන්නේ කුමක්ද? හුදෙක්ම උඩුගම්බලා පීනන සමාජයකට යහපත් තිරසාර හෙටක් උදාකර ලීමය. එබැවින් ඉතිහාසය අනාගතයට සුදුසුම මග පෙන්වන පෙර ගමන් කරුවාය.

විශ්වයටම පොදු දොරටුවක් නොතිබුණු අතීතයේ ඩොලර්, යෙන්, යුරෝ, නොතිබුණු එම යුගයේ ශ්‍රී ලාංකිකයන් සහලින් ස්වයංපෝෂිත රටක්ව පෙරදිගට සහල් අපනයනය කළ බව පොළොන්නරු යුගය සාක්ෂි දරයි. එහි රජ කළ මහා පැරකුම්බා රජු "අහසින් වැටෙන එක දිය බිඳුවක්වත් ප්‍රයෝජනයට නොගෙන අපතේ යාමට ඉඩ නොදෙමි'' වැනි ධනාත්මක දර්ශනයක් සනිටුහන් කරවූවේ ද ක්‍රියාවේ නැගුවේ ද මිනිසාගේ පෙර වාසනාවකටය. එය පූර්වාදර්ශයක් කර ගනිමින් අපි අද වැසි ජල ටැංකි වියළි කලාපය පුරා ව්‍යාප්ත කර ඇත.

අතීතයේ ජීවත්වූ මානවයා ස්වභාවධර්මය තුළින් ලබාගත් උසස්වූ මානසික සන්සුන්භාවය

තුළින් ස්වයංජනනය වන්නාවූ යහපත් ආකල්ප පැවති පින්බර රටක ඉපදීමට ලැබීමද වාසනාවකි. නමුත් සීමිත සම්පත් තුළින් අසීමිත අවශ්‍යතා සපුරා ගැනීමට වෙර දැරීමනම් ජාතියේ අවාසනාවකි. මන්ද අද වන විට මුදලට හා තරඟකාරිත්වයට මුහුණ දෙමින් එකිනෙකා පසු කරමින් නැගී සිටීමට උත්සහ දරන සමාජයක කොටස් කරුවන් වීම අභාග්‍ය සම්පන්න වේ. නූතන ලෝකයට එල්ල වී ඇති කොරෝනා වසංගත තත්ත්වයද මෙකී ප්‍රතිඵලයක් ලෙස අපට හඳුනාගත හැකිය. මේ නිසා සොබාදහම මානව වර්ගයාට දුන් කදිම දඬුවමක් ලෙස හැඳින්විය හැක.

හෙට මව් කුසින් එළිය දකින දරුවාට අද දින සිට තරඟයට මුහුණදීමට සූදානම් කිරීමට අප සැරසෙන්නේ නම් තරඟකරුවන් සිටින පිටියක නියත වශයෙන් ඔහු ද සිටිනු ඇත. නමුත් සාරධර්ම, ආධ්‍යාත්මික සන්හිඳියාව නොහඳුනන තරඟකරුවෙකු වීම කාන්තාරයේදී මී පැණි කැවා සේය. මන්ද තිරසාර සංවර්ධනය ඇති කරන්නේ සතා සිව්පාවා නොව මිනිසාය. ස්ථිරසාර සංවර්ධනයක් සඳහා යන ගමනේදී ආධ්‍යාත්මික, සංස්කෘතිය සාරධර්ම වලට පිටු පා යා නොහැක. තමන් අදහන ආගම තුළින් ලබාගත් ශික්ෂණය හා අතීත ප්‍රෞඪත්වය, සංස්කෘතිය හා අත්දැකීම් හඳුනාගනිමින් ඊට නිසි ගෞරවය ලබා දෙමින් තිරසාර ලොවක් ගොඩ නැංවීමට මේ සුදුසුම කාලයයි.

මේ අනුව රටක් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ආර්ථික, සමාජීය, සංස්කෘතික, පාරිසරික හා ආධ්‍යාත්මික අංශ ඔස්සේ එය ළඟා කර ගැනීමට උත්සාහ ගත යුතුය යන්න සොබා දහම අපට කදිම පාඩමක් උගන්වා අවසන්ය.

**එච්. ජී. ටී. ඩී. හේවාවසම්,**
සංවර්ධන නිලධාරි,
කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
පොළොන්නරුව.

## සිඳු ධනේශ්වර ඇද ගනී ගැමි (නදීකාවන්)

ඉවුරු විකා ගං දැල පුළුල් කොට
කටු පඳුරු වන ලැහැබ් මත සොඳුරුකම බඳිමින්
පළිගු මිණි කැට මතු කොට යට කොට
ගලයි නදිය සිඳු කරා බියෙන් චකිතයෙන් .........

ගුණ සුවඳ ගමේ පිපී රැව් දුන්
හෙළ සිරිත් මානව හැදියාව..............
නගරයට බිලි කොට උස් මහල් තුළ හිඳ
සන්තාලියනි......
යන්නෙ නොවේ නුඹ ............
ඇද ගනී රුදුරු ධනවාදීන්

දිළිඳු බවේ සාපයෙන්
ආර්ථික අහේනියෙන්
රැකියා පිපාසයෙන්
ධනවාදි උමතුවෙන්
නොවෙද ? ...........
නිහඬවම මට කියන් ............

**සමන් කුමාර මාරසිංහ**
මානව සම්පත් සංවර්ධන නිලධාරි
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
වාරියපොල.

# ”සෞභාග්‍යයේ දැක්ම” හා ග්‍රාමීය සංවර්ධනය

දකුණු ආසියාව තුළ ශ්‍රී ලංකාව තවමත් ගැමි ආර්ථිකයකින් යුක්ත, මුළු ජනගහනයෙන් 77% ක් පමණ යැපුම් කෘෂිකර්මයෙන් ජීවත් වන සමාජයකි. නිදහස ලබා වසර 72 ක් ගත වුවද, අසාමාන්‍ය ලෙස දිස්වන සමාජ අසාධාරණයත්, නාගරික සූරාකෑමත්, සාගතය සහ මන්ද පෝෂණයත් හේතු කොට ගෙන තමන්ට හඬක් නැති ග්‍රාමීය දිළිඳු ජනතාව 1948 න් පසු තවමත් අවම ජීවන තත්ත්වයක් පවත්වාගෙන යමින් වසර පහකට වරක් ලැබෙන සමාන ඡන්ද අයිතිවාසිකම පමණක් බුක්ති විඳින පිරිසක් වෙති. විවිධ දස අවුරුදු, පස් අවුරුදු ආදී සැලසුම් ක්‍රියාත්මක වුවද මොවුන්ගේ සමාජය ගොඩ නැගීමට එම සැලසුම් සමත් වූයේ නැත. එමෙන්ම නොයෙකුත් ජනතාවට සහන සලසන ව්‍යාපාරයක් වූ ජනසවිය, සමෘද්ධි, දිවිනැගුම ආදී රාජ්‍යයේ සංවර්ධන යාන්ත්‍රණයන් මගින් එතරම්ම පිහිටක් නොවූ අතර, තවමත් විශාල ප්‍රතිශතයක් දුගී බවේ තීරක රේඛාව ඉක්මවා යාමට හැකියාවක් නැත්තෝ වෙති. මෙම කෙටි ලිපියේ අරමුණ වන්නේ අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ”සෞභාග්‍යයේ දැක්ම”නැමැති ශ්‍රී ලාංකික සමාජයේ පුද්ගලයා කේන්ද්‍රකරගත් සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ”ග්‍රාමීය සංවර්ධනය” සඳහා සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන අදහස් පිළිබඳව කෙටියෙන් විමසා බලන්නටය.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දසවන පරිච්ඡේදය ”ගම සමග පිළිසඳර” නම් කොටසින් ශ්‍රී ලංකාවේ ගම්මාන 25000 ක මිනිසුන්ගේ අදහස් සම්පිණ්ඩනය කිරීමෙන් ග්‍රාමීය සංවර්ධනයට යථාර්තයක් ලබාදීම සඳහා නව ප්‍රවේශයකින් මෙම ලියවිල්ල සකස් කර තිබේ. තවද මෙම ලේඛණයේ අන්තර්ගතය ප්‍රතිපත්ති පුස්තකයක් ලෙස වසා ආරක්ෂා කළ යුක්තක් නොව සැබෑ ලෙස ක්‍රියාත්මක කළ යුතු සමාජ යථාර්තයක් බව පෙනේ. මෙම ප්‍රතිපත්ති සටහනේ ගම පිළිබඳව සඳහන් වන්නේ මේ ආකාරයෙනි.

”ගම හුදකලාව සංවර්ධනය කිරීම ඉටුනොවූ ඓතිහාසික සිහිනයක් පමණයි. ගම සෘජුවම රජය සමග සම්බන්ධව සංවර්ධනය කිරීමට යාම ද අසාර්ථක ව්‍යාපාතියකි. ගම ජාත්‍යන්තර වෙළෙඳපල යා කරන ගෝලීය සැලැස්ම ද අපේක්ෂාවක් පමණයි. ඒ වෙනුවට ගම පළමුව යා කළ යුත්තේ ප්‍රදේශයක් සමගයි. නගරය මෙගා ප්‍රදේශයක් (Metropolitan Area) ලෙස ප්‍රතිනාගරීකරණය වෙමින් නගර සීමාවෙන් පහළට ව්‍යාප්තවන විට ගම ප්‍රාදේශිකය දක්වා ප්‍රතිග්‍රාමීයකරණය හරහා ඉහළට ව්‍යාප්තවන විට මුළු රටම සංවර්ධනය වන්නේ තනි ප්‍රදේශයක් ලෙසයි.

ශ්‍රී ලංකාවේ ගම හුදකලා වූවක් නොවේ. එහි යථාර්තය තේරුම් ගැනීමට නම් තදාසන්න ගම් වල ආර්ථික සමාජීය හා සංස්කෘතික තත්ත්වයන් සමග සම්බන්ධ විය යුතුය. මේ යථාර්තය ග්‍රහණය කර ගැනීම සෞභාග්‍යයේ දැක්මේ අදහස වේ. මේ අනුව ගම සමස්ත වශයෙන් ඔසවා තැබීමට අවශ්‍ය සාමුහික අනුමැතිය ලඟාකර ගත හැකි යාන්ත්‍රණයක් මෙම ප්‍රතිපත්තියේ අන්තර්ගත වී තිබේ.

### ජන මූල මණ්ඩල සහ ජනමූල මධ්‍යස්ථාන

ජනතාව කේන්ද්‍රකරගත් සමාජ ආර්ථික සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාවේ සියලුම ග්‍රාම සේවා නිලධාරි වසම්වල ජන මූල මණ්ඩල ස්ථාපිත කෙරේ. ජන මූල මණ්ඩලය යනු සමස්ත ග්‍රාම සේවා වසම තුළ සමාජ සංවර්ධනය සහ සුබ සාධනය පිළිබඳව සාමුහික තීරණ ගැනීමේ යාන්ත්‍රණය ස්ථාපිත කොට ඇති ආයතනයයි. මෙම ආයතනය තුළ ගමේ පන්සලේ ස්වාමීන්වහන්සේ මෙන්ම අන්‍ය ආගමික පූජකයන් වහන්සේලා, උගත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, තරුණ ප්‍රජා නායකයින්, මෙන්ම ග්‍රාම සේවා නිලධාරි වසම තුළ සුවිශේෂ කාන්තා නියෝජනය අනිවාර්ය අංගයක් වන අතර, ඔවුන්ගේ මූලික වගකීම වන්නේ ගමේ අඩුපාඩු සොයා බලා ඊට පිළියම් කිරීමයි. ගමේ සංවර්ධනයට අවශ්‍ය සියලුම

සුවිශේෂ තීරණ මෙහිදී ගනු ලබන අතර, ගමේ මාර්ග, වගාවන් සඳහා  වාරි ජල පහසුකම්, පානීය ජලය, විදුලිය, කෘෂිකර්මාන්ත, ධීවර කර්මාන්ත මෙන්ම සියලු ආකාරයේ සංවර්ධනය කළ හැකි කර්මාන්ත, ගමේ වැසියන්ගේ අවශ්‍යතා සඳහා ඉදිවන පෙර පාසැල්, මාතෘ නිවාස, ළමා සායනය, ප්‍රජා ශාලාව ක්‍රීඩා පිටි මේ සියල්ල ජන මූල මණ්ඩලය මගින් තීරණය කොට ඉදි කෙරේ. මීට අමතරව ගමේ කැලි කසළ කළමණාකරණය සහ නඩත්තුව, අපද්‍රව්‍ය කළමණාකරණය. සුළු කර්මාන්ත සඳහා අවශ්‍ය තාක්ෂණය, උපකරණ හා සේවා අධීක්ෂණය හා පසුවිපරම ජනමූල මණ්ඩලය මගින් සිදුකෙරේ.

**ජන මූල මධ්‍යස්ථානය**

ග්‍රාමීය සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය ජන මූල මණ්ඩල මධ්‍යස්ථානයයි. ඒ සඳහා නිශ්චිත මධ්‍යස්ථානයක් ඉදිවන අතර, එහි ගම හා සම්බන්ධ සියලු නිලධාරින්ගේ නිල නිවහනයි. ග්‍රාම නිලධාරී, කෘෂි පර්යේෂණ නිලධාරී, පවුල් සෞඛ්‍ය නිලධාරි ඇතුළු සියලු නිලධාරින් මෙහි සිට සේවය කල යුතු අතර, මෙම මධ්‍යස්ථානයෙහි තරුණ තරුණියන්ට අවශ්‍ය (E Learing E library) විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානයක් මෙන්ම විද්‍යුත් පුස්තකාලයකින් සමන්විත වනු ඇත. මෙම ස්ථානයේ ප්‍රධාන සන්නිවේදන මධ්‍යස්ථානයක් නිර්මාණය වන අතර, මෙහිදී ළමා අවශ්‍යතා සපුරාලන මධ්‍යස්ථානයක්, පරිගණක මධ්‍යස්ථානයක් මෙන්ම විද්‍යුත් ගුරු ශිෂ්‍ය මධ්‍යස්ථානයක් ඉදිවනු ඇත.

මෙම සමස්ත ක්‍රියාදාමය තුළ ආත්ම ගරුත්වයකින් යුක්ත පොහොසත් ව්‍යාපාරික ගැමියෙක් නිර්මාණය කිරීම පරම අභිලාෂය වේ. මේ ක්‍රියාවලිය සමග සාම්ප්‍රදායික ගෘහ කර්මාන්තවලට සුවිශේෂ ස්ථානයක් හිමිවන අතර, බොහෝ අතිරේක ග්‍රාමීය නිෂ්පාදන රාශියක් මගින් ශ්‍රම බලකායට රක්ෂා සපයනු ඇත. මේ මගින් නිපදවන කර්මාන්තවලදී සියලු ආකාරයේ ග්‍රාමීය සම්පත් උපයෝගී කරගනු ලබන අතර, පන්, මැටි, බීරලු, කොහු වේවැල්, ලණු, පැදුරු, වැටකේ ආශ්‍රිත කර්මාන්ත මෙන්ම ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය ජෑම්, බටර්, අච්චාරු ආදී දේවල් ග්‍රාමීය අංශය මගින් නිපදවා පුළුල් වෙළෙඳපොලකට සපයනු ඇත. එමෙන්ම බොහෝ විට අපතේ යන ද්‍රව්‍යවලින් කෙරෙන නිෂ්පාදනවලට යහපත් වෙළෙඳපොලක් ලබාදීමෙන් ගැමියාගේ අතමිට සරු කිරීම පරම අභිලාෂය වේ. තවද ගෘහ ආර්ථිකයට සම්බන්ධ ගෙවතු වල වැවෙන සියලු බව බෝග අමුද්‍රව්‍ය වශයෙන් නොව නිමිද්‍රව්‍ය වශයෙන් සකස් කෙරේ. අඹ, කොස්, දෙල්, කෙසෙල් ආදී දේවල් වල එලදාව විජලනය කිරීම මගින් හෝ නැවත සකස් කිරීම මගින් විශිෂ්ට නිමි භාණ්ඩ බවට පත් කොට දේශීය වෙළෙඳපලට හෝ ජාත්‍යන්තර වෙළෙඳපලට යැවෙන අතර, මේ මගින් ගැමියාගේ අතමිට සරුවනු ඇත.

**කාන්තාව සහ ග්‍රාමීය සංවර්ධනය**

සෑම සංවර්ධන ක්‍රියාමාර්ගයකදීම මෙන්ම ව්‍යවසායකත්වයකදී ග්‍රාමීය කාන්තාවට ලැබුණේ ප්‍රමුඛ නොවූ ස්ථානයකි. මෙම ග්‍රාමීය සංවර්ධන කාර්යයේදී නිරන්තරයෙන් අතරමැදියන්ගේ සූරා කෑමට ලක්වූ කාන්තාව ශක්තිමත් කොට ඇයගේ ශ්‍රම දායකත්වයට සහ නිර්මාණශීලිත්වයට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත. කාන්තාවගේ ව්‍යවසායක ගුණය ප්‍රගුණ කරමින් ඇයගේ දක්ෂතා, කුසලතා සහ සහජ හැකියාවන්ට ඉඩ සැලසෙන අතර, ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩ නැංවීමට ඇයගේ ප්‍රශංසනීය දායකත්වය ප්‍රමුඛවනු ඇත.

වසර 72 ක් මුළුල්ලේ හුදකලාව තැබූ ගම හෙවත් කුඩාම මිනිස් ඒකකයේ වෙසෙන මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ඔවුන් විසින්ම නිශ්චය කිරීමත්, සාගතය හා මන්ද පෝෂණය පිටු දැකීමටත්, අසංවර්ධනය සංවර්ධනයක් බවට පත් කෙරෙමින් ජලය, විදුලිය, නිවාස ආදී මූලික අවශ්‍යතා ඉටු කිරීමට වාර්ෂික අය වැයෙන් නිශ්චිත මුදලක් වැය කොට සුඛිත මුදිත ග්‍රාමීය ආර්ථිකයක් ගොඩනංවාලීමත් මෙම ග්‍රාම සංවර්ධන ක්‍රියාදාමයේ මූලික අභිලාෂය වේ.

**මහාචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත්**
සමාජ විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

## සොම්නස රජයන ඵලදායී ප්‍රජාවක් බිහි වන නීති ගරුක සාධාරණ සමාජයක් කරා...........

ඵලදායි පුරවැසියන් සහ සතුටින් ජීවත්වන පවුලක් ගොඩනැංවීම තුළින් අප ජීවත් වන සමාජය තුළ බිහි කළ හැකි සර්ව සාධාරණ, ගුණ ගරුක හා නීති ගරුක සෞභාග්‍යමත් දේශයක් වත්මන් හා අනාගත පරපුර උදෙසා අත්පත් කර දීම වත්මන් මානව සංහතියේ උත්තරීතර වගකීමක් බවට පත්ව ඇත. මේ උදෙසා තනි තනි පුද්ගලයන් වශයෙන් සේම සමස්ත සමාජය විසින්ම ලබා දිය යුතු හා අත්පත් කර ගත යුතු සමාජීය හා ආධ්‍යාත්මික වගකීම් මෙන්ම යුතුකම් කොටසක් අප සැම විසින් ප්‍රගුණ කළ යුතුව ඇත.

සමාජයක ඵලදායි පුද්ගලයෙක් ගොඩනැගීම තුළ, ඔහු උපත් දා සිට තමා ජීවත්වන කාල පරාසය පුරාම තමා විසින්ම හා අන් අය වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් වගකීම් රාශියකින් බැඳී සිටී. එහිදී සමාජයක් තුළ ඒ සමාජයේ ගුණාත්මක බව පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක වන අදෘශ්‍යමාන හස්තයක් ලෙස බලපවත්නාවූ ප්‍රබලවූත් වඩාත් විශිෂ්ටවූත් සංසිද්ධියක් පවතී. එය වනාහි තමා විසින් ගොඩනගා ගනු ලබන සුවිශේෂී හර පද්ධතියකින් සැදුම් ලත් මානව ධර්මතා පද්ධතියකි. මානව ධර්මතාවල ස්වභාවය සමාජයෙන් සමාජයට, පුද්ගලයාගෙන් පුද්ගලයාට, කාලයෙන් කාලයට වෙනස්වීමට භාජනය වීමයි. මේ යථාර්තය අවබෝධ කර ගත් පුද්ගලයා තම පුද්ගල සංවර්ධනය මෙන්ම රටේ ජාතියේ අභිවෘද්ධිය වෙනුවෙන් ස්වයං මෙහෙවරක යෙදී තම ජීවිකාව ගෙන යනු ලබන්නේය.

පුද්ගල සන්තානය තුළ ගොඩනැගී තිබෙන්නාවූ ප්‍රබල කාරණා හයක් ගැන සඳහන් කිරීම වටී. එනම් එය ලකාරයෙන් ඇරඹෙන සරල වචන කීපයකි. නමුත් මෙයින් විද්‍යමාන වන ප්‍රබල සමාජ ප්‍රතිඵලයන් පුද්ගල ජීවිත සුගතියට හෝ අගතියට පත් කිරීමටත්, සොම්නස හෝ දොම්නස තුළ ක්‍රියාත්මක වීමටත් අවැසි මඟ පෙන්වා දේ. එවන්වූ කරුණු ලෙස පුද්ගලයා ජන්මයෙන් උරුම කර ගනු ලබන්නාවූ ළය හා මොළය මෙන්ම ඉන් පසු තමා විසින් අත්පත් කර ගනු ලබන බුදලය, බලය, කුලය හා නිලය වශයෙන් පෙන්වා දිය හැකිය. මෙහිදී පුද්ගලයා වඩාත් සංවේදී හා ප්‍රබල ලෙස ඉස්මතු කර කටයුතු කරනු ලබන්නේ තමා උපතින් උරුම කරගනු ලබන සුවිශේෂී දේහ අංගයන්ට වඩා සමාජය විසින් හා පුද්ගලයා විසින් උරුම කර ගනු ලැබූ හා ලබන්නාවූ භෞතික හා සමාජ අගයන් කෙරෙහිය. එය වත්මන් සමාජ සංස්කෘතික අභියෝග හමුවේ අරුමයක් නොවීමටද ඉඩ ඇත. කෙසේ නමුත් ඵලදායී හා සොම්නස පිරුණු සමාජ පුද්ගලකු වීම උදෙසා ප්‍රබල ලෙස බලපානු ලබන්නේ හා ලැබිය යුත්තේ උක්ත කරුණු ඔස්සේ විමසා බැලීමේදී මොළය හා ළය (හදවත) වර්ධනය කර ගැනීමයි. ඒ තුළ මානව දයාව හා බුද්ධියෙන් සමලංකෘතවූ අසිරිමත් ප්‍රජාවක් බිහිවන බව මාගේ අදහසයි. එහිදී තමා විසින් දැඩි පරිශ්‍රමයක් දරා හා කැපවීමක් කොට අත්පත් කර ගනු ලබන්නාවූ බුදලය (ධනය), කුලය, නිලය හා බලය තුළින්ද තම පවුලේ හා සමාජයේ සංතෘෂ්ටිය උදා කර ගැනීම උදෙසා ප්‍රබල හේතු සාධක උද්දීපනය වන බවත්, එය පුද්ගල බද්ධ කාරණාවක් ලෙස පැවැතීම විමසිය යුතුය. එනම් සමබර පෞරුෂයක් හා ප්‍රගතිශීලී පුද්ගල චර්යාවක් පවත්වා ගෙන යාමට තුඩු දෙන ප්‍රබල සාධක ලෙස මෙම කරුණු උකහා ගත යුතු බව නොවලහා කිව යුතුය.

පුද්ගල සංතෘෂ්ටිය තුළින් ඇතිවන සෞභාග්‍යයේ රන් අරුණළු දසත විදා හැරලීම උදෙසා වඩා වැදගත් වන්නාවූ තවත් කාරණාවක් ලෙස පුද්ගල ඵලදායීතාවය ප්‍රබල හේතුවක් ලෙස පෙන්වා දිය හැකිය. මෙහිදී ඵලදායි පුද්ගලයා තමාට මෙන්ම තමා අවට වෙසෙන සමස්ත ප්‍රජාව උදෙසාම සඵලදායි හා කාර්යක්ෂම සේවාවක් සපයන්නෙකු ලෙස අර්ථ දැක්විය හැකිය. ඒ සඳහා පුද්ගලයා විසින් වඩා වර්ධනය කළ යුතු පුද්ගල හැකියා හා ලැදියා මෙන්ම ධනාත්මක ආකල්පයන්ගෙන් පරිපූර්ණ ආධ්‍යාත්මික සුවතාවයකින් යුත් පෘථුල තැනැත්තෙකු සේ තම තත්ත්වය ආරෝපණය කර ගත යුතුය. ඒ සඳහා කාල කළමණාකරණය, හිත්‍යෂී අන්තර් පුද්ගල සම්බන්ධතාවය, මනා භාෂා හා සන්නිවේදන කුසලතාවයෙන් සන්නද්ධවීමත්, යහපත් චින්තන වින්දන ශක්තියකින් යුත් සුගම

මෘදු කුසලතාවයන්ගෙන් ආඪ්‍ය කෙනෙකු බවට පත්වීමත් වඩා වැදගත් වේ.

පුද්ගල පෞරුෂය තමා සතුවූ අයුරින් පවත්වාගෙන යාමට වඩා එය වඩාත් උත්කෘෂ්ට ලෙස භාවිත කිරීම තුළ ඵලදායී මානව සම්බන්ධතා වර්ධනය කර ගැනීමටත් පවුල් ජීවිතය තුළ සාමකාමී හා සමානතික පවුල් පසුබිමක් ඇති කර ගැනීමත් තවත් වැදගත් කරුණකි. මෙහිදී ස්ත්‍රී පුරුෂ සම්බන්ධය, දූ දරු හා ඥාති හිතවත් සම්බන්ධතාවයන් සමබරතාවයෙන් පවත්වාගෙන යාම පුද්ගල ජීවිතයේ සතුට පවත්වා ගැනීමට මහඟු රුකුලක් වනු ඇත. තම සමීපතමයා හා සුහද පිළිසඳර හා ඉහළ ආගන්තුක සත්කාරයත් අන්‍යයා අවබෝධයෙන් කටයුතු කිරීම මෙන්ම ඇගයීම ඉහළ ලෙස පවත්වා ගැනීමත් මෙහිලා වැදගත් මෙහෙයක් ඉටු කරන බව කිව යුතුය.

එසේම සතුට ළඟා කර ගැනීම වෙනුවෙන් ස්වභාව ධර්මය අගය කිරීම හා ආරක්ෂා කිරීමත් ඒ තුළ යථා ස්වභාවය අවබෝධ කොට ගෙන ජීවත් වීමත් සිදුවිය යුතුය. එහිදී අප අවට පරිසරය ගහ කොළ සතා සිව්පාවා මෙන්ම ජීවී අජීවී සියලු දෑ තම අභිමතය පරිදි පරිභෝජනයෙන් වැළකී එය අනාගත පරපුර වෙනුවෙන් දායාද කිරීමේ මහඟුකාර්යයේ කොටස් කරුවකු ලෙස හැසිරිය යුතුය. තවද පුද්ගලයා තම ශරීර හා මානසික සෞඛ්‍ය පිළිබඳවද වඩාත් සැලකිල්ලෙන් කටයුතු කරයි නම් ඔහු තුළ නිබඳවම සතුට රඳා පැවැත්මක් දක්නට ලැබේ. එනම් කායික වශයෙන් නිරෝගී පුද්ගලයා තුළ මානසික සෞඛ්‍ය ඉහළ මට්ටමක පවතින අතර එහිදී ඉවසීම හා ආතතිය පාලනය කර ගැනීමේ ස්වයං විනය ඔහු තුළ ජනිත වීම මඟින් තමාගේ හා පවුලේ සහජීවනය අඛණ්ඩව පවත්වාගෙන යාමට සහාය ලබා දේ.

එසේම මේ සෑම සියලු කාරණාවන් කෙරෙහි දර්ශනාත්මක චින්තනයෙන් යුතුව කටයුතු කළ යුතුය. එනම් පවත්නා දෙය හා ඒ අයුරින්ම දැකීමට එහා ගිය තම මනස හා බුද්ධිය සමඟ එකිනෙක කලතා භක්තියෙන් හා ප්‍රඥාවෙන් යුතුව නිවරැදි දෘෂ්ටියෙන් ක්‍රියා කිරීමයි. තවද සාර්ථකත්වයේ අභිලාශයෙන් යුත් පුද්ගලයෙක් තුළ ආත්ම ශක්තිය, අධිෂ්ඨාන ශක්තිය හා දරා ගැනීමේ ශක්තියෙන් යුත් ධනාත්මක චින්තනයෙන් යුතුව කටයුතු කිරීමත් උපක්‍රමශීලී සිතුවිලි හා දැනුම පදනම් කොටගත් උතුම් වින්දනයකින් යුත් තැනත්තෙකු ලෙස කටයුතු කිරීමත් කළ යුතුය. පුද්ගලයෙකු සත්‍ය වශයෙන්ම ජීවත් විය යුත්තේ අපට ආවේණික ප්‍රශ්න සමඟ ජීවත්වීමට ඉගෙන ගෙනය. ඒ සඳහා සාර්ථකත්වය, යහපත් වින්දනය සහ සතුට ප්‍රබල හේතු සාධක බව පෙන්වා දිය හැකිය.

මානව සාරධර්ම පිළිපදින්නා හා එය අගය කරමින් ඒ අනුව කටයුතු කරන්නා රටේ සමාජයේ සමාජ සම්මතයන්ට එරෙහිව කටයුතු කරන්නෙකු නොවන්නේය. එවන් තත්ත්වයක් තුළ ඔහුගෙන් සමාජයටත් සමාජයෙන් ඔහුටත් යහපත් ප්‍රතිචාරයක් මිස දුරාචාරයක් සිදු නොවේ. එම හේතු නිසා නීති රීති හා සමාජ සම්මත හර පද්ධති, සාරධර්ම හා අගනාකම් සුරකීම මෙන්ම පවත්වාගෙන යාම කෙරෙහි මෙවන් අය තුළින් විශාල පිටිවහලක් ලැබෙනු නියතය. එය සර්ව සාධාරණ සමාජයක් ගොඩ නැඟීමට අත්‍යාවශ්‍ය කාරණාවක් වන්නේය.

අප විසින් මෙපමණක් සාකච්ඡා කරනු ලැබූයේ ඵලදායි පුරවැසියෙක් සහ සතුට සොම්නස රැඳුන පවුලක් තුළින් බිහිවන සෞභාග්‍යමත් දේශයක් ගොඩනැඟීමට හැකි වන්නාවූ මාර්ගය පිළිබඳවය. කෙසේ වුවද මෙවන්වූ තත්ත්වයක් ළඟා කරගැනීමේදී අප මුහුණ දෙන හා ජය ගත හැකි අභියෝග කීපයක් ද සැකෙවින් පහදා දීමට අවස්ථාවක් කර ගනිමි.

මානව වර්ගයා වශයෙන් උතුම් හා ඉහළ මට්ටමක ජීවත්වන මනුෂ්‍ය සත්ත්වයා තුළ අත්‍යන්ත වශයෙන් බැඳී පවතින්නාවූ තවත් කාරණාවක් වන්නේ ගැටුම්කාරී චින්තන ස්වභාවයන්ය. එනම් පුද්ගල සන්තානය තුළ ප්‍රබල වශයෙන් බලපවත්වන්නාවූ සංකීර්ණ චිත්තවේගීමය ක්‍රියාවලියක් මේ ගැටුමට හේතු පාදක වේ. ගැටුම වූකලී ගැඹුරු විග්‍රහයක් ලෙස සාකච්ජා කළ හැකිවුවද මා මෙහිදී අපේක්ෂා කරනු ලබන්නේ පුද්ගලයා තුළ ගැටුම්කාරි චින්තන විපර්යාසයන් ගොඩනැඟීමට බලපාන්නාවූ තත්ත්වයන් හා එය තෘප්තිමත් ජීවිතයක් කෙරෙහි කරනු ලබන බලපෑම සරලව පෙන්වා දීමටයි.

පුද්ගල සිතුවිලි ධාරාවන් තුළ ප්‍රධාන වශයෙන්ම ගැටුම ආකාර කීපයකට ක්‍රියාත්මක වේ. එනම් තමා හා තම සිතුවිලි සමඟ ඇති කර ගනු ලබන ගැටුම, තමා හා අන්‍යයන් සමඟ ඇති කර ගනු ලබන ගැටුම මෙන්ම තමා හා ස්වභාව ධර්මය සමඟ ගොඩනඟා ගනු ලබන

ගැටුම වශයෙනි. මෙහිදී සමාජ දේශපාලන, ආර්ථික හා සංස්කෘතිමය ආදී නන්වැදෑරුම් තත්ත්වයන් තුළ මෙම ක්‍රියාදාමය පුද්ගලයා හා ගැටුම්කාරී වාතාවරණයක් නිර්මාණය කරයි. එහිදි පුද්ගලයා නිරන්තරයෙන් ඔහු සමඟ ගැටුම්කාරී මානසික අවපීඩන තත්ත්වයකට මුහුණ දේ. උදාහරණයක් ලෙස යම් නිලධරයෙක් රාජ්‍ය වත්කමක් හෝ සම්පත් අනිසි හා නීති විරෝධි ලෙස භාවිතා කිරීමක් කළේයැයි සිතමු. එහිදී සැබවින්ම කල්පනාකාරීව තම සිතුවිලි ධාරාව මෙහෙයවන්නේ නම් එහිදී කරනු ලැබූ අගති සහගත ක්‍රියාව පිළිබඳ ඔහු නිරන්තරයෙන් චිත්තවේගීමය අර්බුදයකට ලක්ව තමා තම සිතුවිලි සමඟම ගැටුමක් නිර්මාණය කර ගනී. ඒ තුළ නිර්මාණය වන පුද්ගල සිතුවිලි ධාරාව සරල තැනින් ආරම්භව සමහර අවස්ථාවල ස්වාභිමානී සමාජ තත්ත්වය අහිමි කර ගන්නා තත්ත්වයකට ලක්වීමට ඉඩ හසර තමා විසින්ම උදා කර ගනී.

එසේම පුද්ගලයා නිරන්තරයෙන් සමාජය හා කටයුතු කිරීමේදී අන්‍යයන් හා අදහස් ක්‍රියාවන් හා අන්තර් පුද්ගල සම්බන්ධතා මෙහෙයවීමේදී යම්යම් අවස්ථාවල සරල තත්ත්වයේ සිට ගැඹුරු තත්ත්වයන් කරා ගැටුම්කාරි ප්‍රස්තෘතයන් නිර්මාණය කර ගනී. නිදසුනක් ලෙස බස් රථයක ගමන් කරනා විට එයට ගොඩවූ අවස්ථාවේ සිට බස් රථයෙන් බැසීම දක්වාවූ කාල පරාසය තුළ මගීන් හා විවිධ ගැටුම් කායිකව හා මානසිකව ගොඩනැගෙන ආකාරය ඔබ මඳක් සිතා බලන්න. මේ කරුණුවලට අමතරව වඩාත් වැදගත් වන්නේ මානවයා ස්වභාව ධර්මය සමඟ ඍජුව මෙන්ම වක්‍රව ඇතිකර ගන්නා ගැටුම්ය. ඒවා තුළ විසඳා ගැනීමට අපහසු හා එකිනෙක බැඳී පවතින ගැටුම් දාමයක් නිර්මාණය වීම වැළක්විය නොහැකිය. එනම් යම් තැනක ස්වභාව ධර්මයට පිටුපා ක්‍රියාත්මකවේද එය මානව සංහතියේ පැවැත්ම අඩාල කිරීම හෝ විනාශ කිරීම දක්වාම ඉදිරියට දිවයයි.

මෙවන් ආකාරයට ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික වශයෙන් ගැටුම්කාරී වාතාවරණයන්ගෙන් විනිර්මුක්තව සරල වාම් දිවි පැවත්මකින් යුක්තව ජීවිතය ගත කිරීමට හැකිනම් පුද්ගලයන් තුළ මා පූර්වයෙන් සඳහන් කළ සතුට සමාදානය හා නීති ගරුක සමාජ සත්ත්වයකු නිර්මාණය වීම සක්සුදක් සේ පැහැදිලිය. එවැනි සමාජයක් දැක්ම ඔබ අප සැමගේ ප්‍රාර්ථනය විය යුතු නොවන්නේද? ඒ සඳහා ප්‍රමාද නැත. සියලු දෙනා එක්ව මේ සෞභාග්‍යමත් දේශයේ සොඳුරු දැක්මට එක සිතින් පෙළ ගැසෙමු.

**සමන් කුමාර මාරසිංහ**
මානව සම්පත් සංවර්ධන නිලධාරි
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වාරියපොල.

# වස විසෙන් තොර ආහාර සමාජගත කරමු

පාරම්පරික මුතුන් මිත්තන් අප රටේ සරුසාර පොළොවේ කාබනික බෝග වගාව ස්ථාපිත කරමින් ඉන්දියන් සාගරයේ මුතු ඇටය වන අප මාතෘභූමිය පෙරදිග ධාන්‍යාගාරය ලෙස මිහිපිට බැබළවීය. අතීතයේ සිටි අපගේ හෙළ ගොවියා පරිසර හිතකාමී කාබනික ගොවිතැන් ක්‍රම මගින් වස විසෙන් තොර ආහාර සමාජගත කරන ලදි. එවන් ආහාර පරිභෝජනය කිරීම තුළින් අපගේ මුතුන් මිත්තන් ජවසම්පන්න නිරෝගීමත් පරම ආයුෂ විඳිමින් අග හිඟයෙන් තොර ජාතියක් ලෙස ජීවත් වූයේය.

නමුත් වර්තමාන ගොවියෝ අධික මුදලක් පිටරටියන්ට දී විදේශික ආක්‍රමනශීලී වස විෂ සහිත රසායනික පොහොර, පලිබෝධනාශක, වල්නාශක, විදේශික බීජ කරපින්නා ගනිමින් රසායනික බෝග වගාව තුළ අතරමං වී වස විස බහුල සමාජගත කරමින් සමස්ත පරපුරත් වගාවට අදාළ සියලු පාරිසරික පද්ධතීන් විනාශ මුඛය කරා ගෙන ගොස් ඇති බව පෙනේ.

පාරම්පරික හෙළ ගොවියා ලංකාවට ගැළපෙන භෝග වර්ග වගා කළ අතර, එම භෝග පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යාමට දේශීය බීජ සකස් කර සංරක්ෂණය කර ගත් බව ඉතිහාසයේ සඳහන් වේ. එසේම පසේ සරුබව රැක ගැනීම සඳහා ස්වභාවික දිරාපත් වූ ශාක හා සත්ව අවශේෂ ස්වභාවික කාබනික පොහොර ලෙස භාවිත කළේය.

ස්වභාවික කාබනික පොහොර විශේෂ කිහිපයක් පහත සඳහන් වේ.

- ❖ ගිනිසිරියා කොළ පොහොර - පාංශුජීවීන් වර්ධනය වේ. පසේ නයිට්‍රජන් ප්‍රතිශතය ඉහලයයි. ශාක වර්ධනයට උපකාරී වේ.
- ❖ කැකුන කොළ පොහොර - මඩ පොහොරක් ලෙස ක්‍රියාකරයි. පසේ කිවුල අඩු කරයි.
- ❖ කරඳ කොළ පොහොර - පනු රෝග අවම කරයි. පාංශු පෝශක වැඩිකරයි.
- ❖ මී කොළ පොහොර - පාංශු පෝශක වැඩිකරයි. පළිබෝධ හානීය අවම කරයි.
- ❖ පිදුරු පොහොර - පසේ කාබනික තත්ත්වය ඉහළ දමන අතර, පසේ ස්වභාවය දියුණු කරයි. පුරාණ හෙළ ගොවියා ශාක අවශේෂ බොහෝමයක් පසේ සරු බව වැඩිකිරීමට යොදාගත් බවට සාක්ෂි ඇත.
- ❖ ගොම පොහොර, කුකුල් පොහොර හා එළු පොහොර පස සරු කර ගැනීමට හෙළ ගොවියා භාවිත කර ඇත.
- ❖ දැව අඟුරු භාවිතයෙන් පාංශුපෝෂක වැඩි තරමක් රඳවා ගැනීමට හැකි බව හෙළ ගොවියා දැන සිටියේය. වර්තමානයේ චාකෝල් ලෙස පර්යේෂණ මට්ටමේ පවතී. දැව අඟුරු දියමලන් කෑම පාලනය කරයි.
- ❖ පාංශු පෝෂක ප්‍රතිපෝෂනය කිරීම සඳහා පාංශු ජීවි දියර පොහොර අතීතයේ භාවිතා වී ඇත. දැනට ඉන්දියාවේ ගොවියා ජීවමුත්‍රම් නම් පොහොර බහුලව භාවිතා කරයි.
- ❖ ගොවිතැනට විශ්ව ශක්තියෙන් නිර්මාණය කරන ලද අං පොහොර අපගේ හෙළ ගොවියා අතීතයේදී භාවිතා කර ඇත.

ගොවිතැනට ජීවින්ගෙන් බලපාන උවදුරු වලක්වා ගැනීමට ස්වභාවික හා කාබනික ක්‍රම අතීතයේදී භාවිතා කර ඇති ගුරුකම්

01. **යාගහෝම හා සෙත් ශාන්ති**

ගොවිතැන ආරම්භයේදීත් අවසානයේ- දීත්, ආහාර පරිභෝජනයේදීත්, රෝග වසන්ගත තත්ත්වයන්හිදීත් බාර වීම යාගහෝම පැවැත්වීමේ සංස්කෘතියක් පැවති බවට සාක්ෂි ඇත.

02. **යන්ත්‍ර මන්ත්‍ර**

වගාවට හානී කරන කෘමි සතුන් මර්දනය, ඌරන්ගේ හානීය මර්දනය, ඉපියන්, ගුල්ලන්ගේ මර්දනය සඳහා රතන සූත්‍රයේ ගාථා මතුරා වගාව ආරක්ෂා කරගෙන ඇත. එසේම අස්වැන්න වැඩි කර ගැනීමට, සතුරන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට රතන සූත්‍රයෙන් මැතිරීම, පිරිත් පැන් ඉසීම, පිරිත් කළ පොල් මලක් සිටුවීම ආදී ක්‍රම භාවිතා කර ඇත. රිළවුන්ගේ හානි වළක්වා ගැනීමට "ඕං නමෝ කුන්ද මුබ බන්ද බන්දනේස්වා යන ගාථාව 108 වරක් නොපෑගුන ගල් ගෙන මතුරා ඉඩමේ මායිමේ වැලලීමෙන් එම උවදුර වලක්වා ගත හැකිය. සත්ව හානී වැළැක්වීමට සබ්බ පාපස්ස අකරනං ගාථාව භාවිතා කර ඇත.

03. **කෙම් ක්‍රම හා බෝග සාත්තුව**

වගාව සියලු සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට කෙම් ක්‍රම හා බෝග සාත්තු ක්‍රම විශාල ප්‍රමාණයක් අතීතයේදී භාවිත කර ඇත. දුම් කෙම හිරු එළිය වැටෙනවාත් සමගම ක්‍රියාත්මක කළ යුතුයි. ගස් කොලන් වලට දුම් වැදීමට සැලැස්වීමෙන් ශාක පත්‍රවලට කාබන් ඩයොක්සයිඩ් වායුව ලැබේ. එවිට පත්‍රය තුළ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සීඝ්‍රව සිදු වී වැඩිපුර ආහාර නිෂ්පාදනය කරයි. එවිට ගස වැඩිපුර ඵල දරනු ඇත. එමෙන්ම හානී කරන සතුන් බොහොමයක් ශාකයෙන් ඉවත් වේ. එම නිසා වගාව ආරක්ෂා වේ. මේ සඳහා පවනේ වියලාගත් අමුකොළ, කජු ලෙලි ආදීය යොදා ගත හැකිය. කබලකට ගිනි අඟුරු දමා ඉහත අමුද්‍රව්‍ය එකතුකර හිමිදිරි උදයේ ගස් අතර තබන්න.

කෙම් ක්‍රම කිහිපයක් - අහු කෙම, අඹ කෙම, සිවුරු කෙම, මුබබන්ද කෙම, මුත්‍රා කෙම, මෝල්ගස් කෙම හා මෙට්ට කෙම

04. **විශ්ව ශක්තිය යොදා ගැනීම**

හිරුගේ ශක්තිය මත මුළු ලොව එනම් ශාක ලෝකය හා සත්ව ලෝකය රඳා පවතින බව නොරහසකි. එසේම අනෙකුත් ග්‍රහ වස්තූන්ගේ බලපෑම බෝග වගාව කෙරෙහි දැඩිලෙස බලපානු ඇත.

05 **කයනු හතරේ කෘෂිකාර්මික ක්‍රම භාවිතය**

I **කලට** II **කන්නයට** III **කයියට** IV **කර්ණයට** පුරාණ ගොවියා වගා කටයුතු කර ජය ගත්තේය.

I. **කලට**- හිරුගෙන් සඳුගෙන් ගමන් චක්‍රයට අනුව එක් එක් වගාවන් කිරීමට සුදුසු මූර්තිය සොයා බලා කටයුතු කිරීම. මෙහිදී හෝරාව තිථිය නැකත ආදිය වැදගත් වේ. වගාවේදී මූලික බිම් සැකසීමේ සිට අස්වැන්න ගබඩා කිරීම පරිභෝජනය දක්වා මෙම සුභ මූර්ති වැදගත් වේ. වගාව සතුන්ගෙන් රැක ගැනීමට ද මෙම මූර්ති වැදගත් බව ගොවියා දැන සිටියේය.

II. **කන්නයට** - ගොවිතැනේදී ප්‍රධාන සාධකය ජලයයි. ලංකාවට වර්ෂාව ලැබෙන කාලය අනුව වගා කාල සටහන නිර්මාණය වී ඇත. ඒ අනුව යල මහ යනුවෙන් වගාකන්න දෙකකි. මෙම කන්න අතර අතර මැදි කන්නයක් ඇත. හෙළ ගොවියා වගාව තෝරා ගැනීමේදී කන්නය පිළිබඳ පුළුල් අධ්‍යනයක් කිරීමෙන් පසු බෝගය තෝරා ගෙන ඇත. ජලයට අමතරව සුළඟ වැඩි අඩු කාලය අනුව වගාව තෝරා ගැනීමට හෙළ ගොවියා වගබලා ගත්තේය.

III. **කයියට** -හෙළ ගොවියා ගොඩ මඩ වගාව තුළ ක්‍රියාත්මක වූයේ

ඒක පුද්ගලික නොව සමූහ කණ්ඩායම්ගතවය. කණ්ඩායම්ගත අත්තම් ක්‍රමය අනුව ගොවිතැන කර ඇත. ඒ තුළින් එකිනෙකාගේ දැනුම හුවමාරු කර ගනිමින් සාමය සමගිය සාමූහික බව ගොඩනැංවීය. සාමූහිකව වගාකිරීමෙන් වගාවට වන සියලුම හානි අවම කර ගත හැකිය. සමස්ත උවදුර සැමට බෙදී යනු ඇත. ගොවියාගේ ආර්ථිකය සමතුලිතව පවත්වාගෙන යාමට මෙම ක්‍රමය වැදගත්වේ.

IV. **කර්ණයට** - සුභ මුහුර්තියට වගා කිරීමේ ක්‍රමය සුවිශේෂී අවස්ථාවකි. ගොවිතැනේදී හානි පමුණුවන නොයෙක් ජීවීන් අතරින් ඌරා, ගවයා, එළුවා, කුකුළා, අලියා, රිලවා, දඬුලේනා, පක්ෂීන් කැපී පෙනේ. එක් එක් සතුන් ක්‍රියාශීලීවන මූහුර්තිය නොහොත් කර්ණය අවබෝධකරගෙන තිබුණි. කෘෂිකර්මයට හානි නොකරන සිංහයා දිවියා වැනි සතුන්ගේ මුහුර්තියට අනුව වගා කළේය. තමන්ගේ උපත් නැකතත් සුබ දවසක් අනුව දිවි කර්ණය හෝ සිංහ කර්ණය භාවිතා කර ගොවිතැන් කළේය. ඌරු, ගව, එළු, කුකුල්, ගජ කර්ණය ගොවිතැනට අසුභයි. නමුත් අසුභ කර්ණ සුභ කරගත හැකි විශේෂ ක්‍රමද භාවිතා කර ඇත.

06. **ජීවීන්ගෙන් වගාවට වන හානි වැළැක්වීමේ ක්‍රම** (ගස් තීන්ත කිරීම, සතුන් බය කිරීම තුළින් පලවා හැරීම හා ගස් අප්‍රිය කිරීම)

ගොවිතැනේදී අනේක විද උවදුරු පැමිණේ. ඒවා මග හරවා ගැනීමට පහත ක්‍රම භාවිතා කළේය.

- සතුන් බය කිරීම හා පලවා හැරීම - විරූපී හැඩයක් ඇති පඹයෙකු සිටුවීම, ටක බැදීම, වක්කඩේ දිය හොල්මන් සවි කිරීම, සුළං පෙති සවි කිරීම, සුළං ටක සවි කිරීම, පොල් ලෙලි රිටි සිටුවීම, උගුල් ඇටවීම, මදු ගැසීම, මැලියම් සහිත කහපාට කොඩි එල්ලීම, රැලි සහිත පටි බැඳීම හා කම්බි හෝ නූල් ඇදීම
- ගස් අප්‍රිය කිරීම - ගස් වලට හානි කරන සතුන්ට ගස් අප්‍රිය කරන ආකාරයේ ක්‍රම භාවිතා කර ඇත.

කොළ කන සතුන් සඳහා වගාවට ගොම දියර ඉසීම, මුත්‍රා ඉසීම, අළු ඉසීම, කදුරු දර පිළිස්සීම දැවි තෙල් පෙග වු රෙදි කැබලි එල්ලීම, කහ පාට සිවුරු කැබලි හෝ ඉටිකොල එල්ලීම

වර්තමානයේදී වගාවේ උවදුරු මැඩපැවැත්වීම සඳහා කෘෂි රසායන භාවිත කිරීම සුලභ කරුණකි. එම නිසා වස විෂ සහිත ආහාර සමාජගත වීම තුළින් ජනතාව බහුල ලෙස රෝගී වී හමාරය. උග්‍ර විෂසහිත රසායනික පළිබෝධනාශක වර්තමානයේ භාවිතා වුව ද ඒ වෙනුවට පුරාණ හෙළ ගොවියා විසින් දේශීය ශාක සාරයන් කාබනික පළිබෝධනාශක ලෙස භාවිත කළේය. එසේ භාවිත කළ කාබනික ශාක සාර කීපයක් පහත දැක්වේ.

❖ කොහොඹ කොළඇට පොතු ශාරය, කළවැල් ශාරය, හබරළ ශාරය, අරලිය ශාරය, කරඳ ශාරය පනු රෝග සඳහා විශේෂයි.

කොළ කොඩ වීම සඳහා පැපොල් ශාරය, පාප්ප ආලේපය විදේශීක ආක්‍රමණශීලී ත්‍රස්තවාදී ශාකයන් බොහෝමයක් උග්‍රවිෂ සහිත බැවින් පළිබෝධකයන් හානි නොකරයි. එම ශාකවල ශාරය කෘමිනාශක ලෙස භාවිතා කළ හැකිය.

**එච්. එම්. ඉන්ද්‍රපාල**
හිටපු කලාප කළමනාකරු
ශ්‍රී ලංකා හදබිම අධිකාරිය.

# සෞභාග්‍යයේ දැක්ම - යථාර්ථයක් වීමට ආකල්ප සංවර්ධනයේ වැදගත්කම

සෞභාග්‍යයේ දැක්ම තුළින් විවිධ අංශ ඔස්සේ ශ්‍රී ලංකාව සංවර්ධනය කරා ගෙන යනු ලබන දිශානතිය නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ලෙස ප්‍රකාශයට පත් කොට ඇත. මේ සඳහා භෞතික, ස්වාභාවික, මූල්‍ය, ප්‍රාග්ධන ආදී සම්පත් හා වත්කම් කෙතෙක් තිබුනද නිර්මාණශීලී සැලසුම් කෙතෙක් තිබුනද මානව සම්පතට අවශ්‍ය නිවැරදි මඟ ගැන්වීම සිදු නොවන තාක් එය තවත් සංවර්ධන මිරිඟුවක් ලෙස දිස්වනු ඇත. සංවර්ධන සැලසුම් කෙතෙක් ශක්තිමත් වුවද ඇතැම් විට ඒවා අසාර්ථක විය. තවත් විටෙක සංවර්ධන සැලසුම තුළ අලංකාර නැති වුවද මානව සම්පත තුළ විභව ශක්තීන් වර්ධනය කරමින් එය සක්‍රීය තත්වයට පත් කිරීම තුළ නොසිතූ විරූ ලෙස සංවර්ධන අපේක්ෂාවන් සාධනය කර ගැනීමට හැකි වූ අවස්ථා ලාංකීය සමාජය තුළින් මෙන්ම ලෝකයේ විවිධ ප්‍රජාවන් හා රටවල් ඇසුරින්ද අපට මනාව පෙන්නුම් කර ඇත.

මෙහි සාකච්ඡාවට බඳුන්වන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අරමුණ වන ''සංවර්ධනය'' යථාර්ථයක් බවට පත් කර ගැනීමෙහිලා පවතින අභියෝග හා බාධාවන් බොහෝමයකි. ඒ අතුරින් මෙහිදී මානව සම්පත ලෙස ලාංකික සමාජයේ සියලු ප්‍රජාව තුළින් නිරූපිත පොදු මනෝභාවයන් කෙරෙහි අවධානය යොමු කරමි. එනම් ''ආකල්ප'' නමැති සංකල්පය හා එහි භාවිතය පුද්ගල හා සමාජ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඇති කරනු ලබන බලපෑම කෙබඳුද යන්න සලකා බැලීම වැදගත් වේ. ආකල්ප පුද්ගලයාගේ සෑම අංශයකටම බලපායි. අධ්‍යාපනික, ලිංගික , සාමාජීය, ආගමික, අධ්‍යාත්මික ආදී ජීවිතයේ සියලුදෑ සම්බන්ධයෙන් දක්නට හැකි වේ. පාසලේ විෂය තෝරා ගැනීම සිදු වන්නේ ආකල්ප මතය. ධනාත්මක ආකල්ප ඇති පාසල්වලට දරුවන් යැවීමට දෙමව්පියෝ වෙහෙසෙති. ළමුන්ගේ හෝ දෙමාපියන්ගේ ධනාත්මක ඇගයීමට ලක් වන විෂයයන් හැදෑරීමට ළමුන් යොමු වෙයි. විවාහ සහකරු හෝ සහකාරිය තෝරා ගැනීමේදීද ආකල්ප වලට විශාල භූමිකාවක් පවතී. යහළුවන් වශයෙන් ආශ්‍රය කරන්නේ එකිනෙකා කෙරෙහි ධනාත්මක ආකල්ප ඇති නිසාය. අප යමක් මිලදී ගැනීමට පෙළඹෙන්නේද අදාළ භාණ්ඩය කෙරෙහි දක්වන ධනාත්මක ආකල්පය නිසාය. මෙලෙස ආකල්ප අප ගේ ජීවිතවල හැම තැනකටම බලපානු ලබයි. එබැවින් ආකල්ප යනු ජීවිතය යැයි කීම නිවැරදිය.

ආකල්ප පිළිබඳ සංකල්පය ඇසුරින් ලාංකික සමාජ ප්‍රජාවන්ගේ ගති ලක්ෂණ විග්‍රහ කරන විට පොදුවේ පිළිගත් සාම්ප්‍රදායික මතයක් පවතී. බොහෝ විට පසුගාමී ආකල්ප දරන පුද්ගලයින්ගෙන් සැදුම්ලත් සමාජයක්ය යන්න එම පිළිගැනීමයි. බොහෝ විට ඔවුහු තාර්කික සත්‍ය සෙවීමට වඩා අතාර්කික මායාවන්ට ප්‍රිය කරයි. දුෂ්කර කර්තව්‍යයන් ජය ගැනීමට උත්සාහ දැරීමට වඩා එය අත්හැර දැමීමට පෙළඹේ. නැහැ, බැහැ, පලක් නැහැ, ප්‍රයෝජනයක් නැහැ, වැඩක් නැහැ වැනි පසුගාමී මන්දෝත්සාහී වචන ගොන්නකින් මනස පුරවාගෙන කාලයට කිසිදු වටිනාකමක් නොදෙන අතර කළ යුතු කාර්යය හෙට දිනට කල් දැමීම වැනි පොදු ගති ස්වභාවයන් රාශියක් ප්‍රකට කරනු ලබයි. මෙවැනි පසුබිමක් සහිත සමාජයක සංවර්ධනය භෞතික දෘශ්‍යමාන බාධාවන්ට වඩා ප්‍රබල හා අභියෝගාත්මක වන්නේ පුද්ගල මනස තුළින් නැත්නම් අභ්‍යන්තරයෙන් එය ජනිත වීමයි. භෞතික වස්තුවක් එහා මෙහා කොට හැඩය, කාලය, රටාව වෙනස් කළ හැකි වුවත්, අපට අවශ්‍ය ආකාරයට ආකල්ප නැමැති මනෝමය සාධකය වෙනස් කිරීම පහසු නොවනු ඇත. ආකල්පයේ බලපෑම පුද්ගලයාගේ සිට පවුල, කණ්ඩායම, ප්‍රජාව, සමාජය තෙක් විවිධ ප්‍රමාණයෙන් සමාජගත වී තිබීම දැක ගත හැක. මෙය සමාජය නැමැති කුලකය තුළ ලඝු කළ විට වෙනත් ආකාරයට කියතොත් සමාජය තුළ පසුගාමී ආකල්ප දරන පිරිස බහුල වන්නේ නම් එය සමාජ සංවර්ධනයට මහත් බාධාවක් වේ. එමෙන්ම ප්‍රතිජනනාත්මක නැත්නම් ධනාත්මක

ආකල්ප දරණ පිරිස සමාජයේ බහුල වන්නේ නම් සමාජ සංවර්ධනයට එය මහත් පිටිවහලක් වනු ඇත.

දිළිඳුකම - පින පව අනුව සිදු වේ. ලබා උපන් හැටි. ඒක වෙනස් කරන්න බැහැ. කරුමෙ තමයි.

ගැහැණිය - පිරිමියාට වඩා පහත්, අණුවන (ගෑණු නුවණ හැඳි මිටේ දිගයි) අශුද්ධ වස්තුවක්. කිළි සහිතයි. ස්වාමියා මිය ගිය කනවැන්දුම් ගැහැණිය කිසිදු සුභ කටයුත්තකට සම්බන්ධ කර නොගත යුතුයි.

ස්වශක්තිය/ ආත්ම විශ්වාසය - ''නක්ෂත්‍ර, ග්‍රහයෝග, නිමිති, නොයෙකුත් ගුප්ත විශ්වාස අනුව ජීවිතයේ සියලු තීන්දු තීරණ ගැනීමට පෙළඹීම". ග්‍රහචාර අනුව තමයි සියල්ල සිද්ධ වෙන්නෙ කාටවත් වෙනස් කරන්න බැහැ"

වර්ගය/ ජාතිය/ ආගම - රටේ බහුතරය වෙසෙන ජාතිය ආගම පදනම් කර ගනිමින් , සිංහල ජාතිය උතුම් ජාතිය, අන් ජාතිකයින් ඔවුන්ට යටත් විය යුතුයි.

ඉහතින් දක්වන්නට යෙදුනු පුද්ගල / සමාජ ආකල්ප කිහිපයක් දෙස බැලූ විට මේවා දිගු කාලයක් සමාජය තුළ මුල් බැස ගෙන ඇත. ඒවායේ ප්‍රායෝගික භාවිතාව අතිශය ඛේදජනක අත්දැකීම් අපට ලබාදී ඇත. වර්තමානය වන විට, විද්‍යාවෙන් තාක්ෂණයෙන්, භෞතික සම්පත්වලින් කොතරම් දියුණුවුවත් මානව හා සමාජ සංවර්ධනයට මෙකී සෘජු ආකල්පයන්ගෙන් ඇති අහිතකර ස්වභාවයන්ගෙන් මිදීමට අපට පහසු නැත. මේ නිසාම සමස්ත ජාතියක් ලෙස අප තවමත් ගෝත්‍රික සීමාවන් අතික්‍රමණය කිරීමට අසමත් වීද යන ගැටලුව මතු වේ. මෙම ස්වභාවය වෙනස් කරමින් මානව සංවර්ධනය ප්‍රමුඛ කර ගත් රටක් ගොඩ නැගීම දෙසට ගමන් කිරීමට නම් රොඩ්ස් ඇතුළු මනෝ විද්‍යාඥයන් පවසන ආකාරයට මනුෂ්‍යයා තුළ සුභවාදී ආකල්ප ගොඩනැගීම සිදු කළ යුතුව ඇත. අසුභවාදීව යමක් දෙස බැලීම හා ඒ අනුව කටයුතු කිරීම තුළ පුද්ගල පෞරුෂය, ස්වශක්තිය හා ආත්ම විශ්වාසය බිඳ වැටීමකට ලක් වේ. ලෝකයේ දරිද්‍රතාවය වර්ධනය වීමට බලපා ඇති කරුණු සම්බන්ධයෙන් සිදු කරන ලද සමාජ පර්යේෂණ මඟින් අනාවරණය කර ගන්නා ලද ප්‍රධාන සාධකයක් වී ඇත්තේ කාන්තාවන්ට සමාන ලෙස නොසලකා ඔවුන් පීඩාවට පත් කිරීමයි. කාන්තාවන් දෙවන ගණයේ පුරවැසියන් ලෙස සලකා කටයුතු කිරීම තුළ සමාජය ඔවුන් කෙරෙහි අනාදරයක් දක්වයි. මේ නිසා දිළිඳු රටවල කාන්තා හිංසනය ඉහළ මට්ටමකින් සිදු වේ. මෙය ආකල්ප වර්ධනයේ දිළිඳුභාවය පෙන්නුම්කරන ස්වභාවයක් ලෙස සැලකේ.

එමෙන්ම ආහාර පුරුදු හා පරිභෝජන රටාව පිළිබඳ සැලකීමේදී මෙම තත්ත්වය තව දුරටත් හඳුනාගත හැකිය. ආකල්පයන්ගේ දිළිඳුභාවය නිසා අප භාණ්ඩ හා සේවා සම්බන්ධ ප්‍රචාරයන්ට සෘජුව හෝ වක්‍රව ගොදුරු වේ. මේ නිසා ගුණාත්මක පෝෂ්‍ය පදාර්ථ බහුල ආහාර හෝ භාණ්ඩ පරිභොජනයට වඩා පංචේන්ද්‍රයන් පිනවන ආහාර හෝ භාණ්ඩ පරිභෝජනයට පෙළඹේ. අපගේ ආකල්පමය තක්සේරුව දුර්වලවීම හේතුවෙන් මේ වන විට දේශීය ගුණාත්මක ආහාර පරිභෝජනයෙන් බැහැර වී විදේශීය ක්ෂණික ආහාර අනුභවය වෙත නැඹුරුවීමේ ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇත. උදාහරණ ලෙස රට දෙළුම්, රට ඇපල්, පිටිකිරි වර්ග, නූඩ්ලස් වර්ග, සුප් කැට, සොසේජස්, මීට් බෝල්, කිරි පැකට්, වැනි දෑ සඳහන් කළ හැක. මේවා ශරීරයට අහිතකර රසායනිකයන් අන්තර්ගත කොට දිගු කාලීනව කල් තබා ගත හැකි පරිදි සකසා අප අතට පත් කරයි. නැවුම් බව හෝ පෝෂ්‍යදායි බව එහි නොමැති අතර මනා ඇසුරුම, ආකර්ෂනීය පෙනුම, ක්ෂණිකව පරිභෝජනයට ගත හැකි වීම, දැවැන්ත ප්‍රචාරය නැමැති මෙවලම ඔස්සේ අපගේ දුර්වල ආකල්ප හඳුනාගෙන පහසුවෙන් අප ඊට නතු කර ගනී. මේ ආකාරයට දේශිය ආහාරවල පවතින නැවුම් බව, පෝෂණීය ගුණය, ආකල්පමය ලෙස බැහැරකිරීමේ ප්‍රථිඵලයක් ලෙස මේ වන විට නිදන්ගත රෝග හා බෝ නොවන රෝග වලට අප සමාජය දරුණු ලෙස ගොදුරු වී තිබේ. මෙවැනි හානිකර සමාජ වටපිටාවක් අප විසින් නිර්මාණය කර ගැනීම තුළින් ගම්‍ය වන්නේ කුමක්ද? පුද්ගලයින් හා සමාජයක් ලෙස අප තුළ පවතින වැරදි හා දුබල ආකල්ප ප්‍රබල වී ඇති ආකාරය නොවන්නේද?

මත් පැන් හා මත් ද්‍රව්‍ය භාවිතාව සම්බන්ධයෙන්ද අප සමාජය තුළ මතු වී ඇති කතිකාව දුර්වල පුද්ගල හා සමාජ ආකල්පයන්ගේ ප්‍රතිඵලයකි. මත්පැන්/ මත් ද්‍රව්‍ය භාවිතයෙන් ජීවිතයට/ ශරීරයට ප්‍රබෝධයක් ජනනය වේ, පෞරුෂය වැඩි දියුණු වේ. මතක ශක්තිය ධාරණ ශක්තිය වැඩි දියුණු වේ. ලිංගික උත්තේජනය ඇති වේ. දුකේදී හා සතුටේදී තිබිය යුතු දෙයකි. කථන හැකියාව, නර්ථන හැකියාව, ගීත ගායන හැකියාව, ශක්තිය ඇති වේ. බිව්වම මාර ත්‍රිල්, බොන්නේ නැතිනම් පිරිමියෙක් නෙවෙයි. ආදී වශයෙන් මෙම භාවිතාව අප සමාජය තුළ පෝෂණය කිරීම සඳහා විශාල ලෙස අවිද්‍යාත්මක ආකල්ප ධාරාවක් මුදා හැර තිබේ. මේ සඳහා ඊට ආවේණික වූ වාග් මාලාවක්, සංඥා සංකේත භාවිතාවක්ද පවතී. මෙම වැරදි ආකල්ප හේතුවෙන් ගොඩනැගී ඇති චර්යාව පුද්ගලයකු ලෙස, සමාජයක් ලෙස සක්‍රිය ප්‍රජාව සෞඛ්‍ය (කායික හා මානසික) ආර්ථික සංස්කෘතික සාමාජීය ගැටලුවලට යොමු කළ කණ්ඩායමක් බවට පත් කොට ඇත. මේ නිසා පුද්ගල පරිහානියේ සිට පවුල, කණ්ඩායම, සමාජය ලෙස සමස්තය පරිහානිය කරා රැගෙන යාමට මෙකී වැරදි ආකල්ප සමාජ ගත වීම ඉවහල් වී ඇති ආකාරය දැක ගත හැකිය. ඉහතින් දැක්වූයේ වැරදි / ඍණ ආකල්ප වල විවිධ බලපෑම් හා භාවිතාවන්ගේ ප්‍රතිඵල වේ. ඒ අනුව ආකල්ප යනු කුමක්ද යන්න න්‍යායාත්මක හා සංකල්පමය ලෙස සරලව සලකා බැලීම වැදගත් වනු ඇත.

### ආකල්ප

''ආකල්ප'' යනු කුමක්ද යන්න පිළිබඳ විවිධ නිර්වචන හා ඒ පිළිබඳ මතවාද රාශියක් අපට හමු වේ. මෙය මනෝමය ස්වභාවයක් සහිත තත්ත්වයක් ලෙස ඇතැම් විට විග්‍රහ වුවද එහි චර්යාමය ස්වභාවයක් දැක ගත හැකිවේ. මේ නිසා මනෝමය හා චර්යාමය ලෙස අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වූ ස්වභාවයකින් මෙය විග්‍රහ වනු දැකිය හැකිය.

" පුද්ගලයකුගේ යම් දෙයක් වස්තුවක් සංසිද්ධියක් යම් අදහසක් ලෙස යම් ජීවියෙකු පිළිබඳ දරණ මානසික ස්වභාවය හෙවත් ස්ථාවරයයි." හිතන පතන ආකාරය නොහොත් ඒ පිළිබඳ තම හෘද සාක්ෂියේ තැන්පත් කරගෙන ඇති මානසික ස්වභාවයයි. බොහෝ විට එය ස්ථාවර හා දිගුකාලීන ස්වභාවයක් දරයි. උදා;- පෞද්ගලික බස් සේවය, දෙමළ ඊලාම් කොටි සංවිධානය, සාම්ප්‍රදායික ගම, ජනාකීර්ණ නාගරික ජීවිතය, වැනි දේ පිළිබඳව ඔබ තුළ පවතින මානසික ස්ථාවරය කුමක්ද? ඒ සිතුවිලි හෝ හැඟීම් ඔබේ ආකල්ප වේ.

ආකල්පය එකවර පහළ නොවේ. එය කාලාන්තරයක් තිස්සේ පුද්ගල ජීවිතය සමඟ වැඩෙන්නකි. "අම්මා" පිළිබඳව අපගේ ආකල්පය කෙබන්ඳක්ද? එය කාලාන්තරයක් තිස්සේ වැඩුනකි. එසේම අම්මා පිළිබඳ ආකල්පය පුද්ගලයාගෙන් පුද්ගලයාට එකිනෙකට වෙනස් වූවකි. එසේ වන්නේ අම්මා සමඟ අපේ ජීවිතය අත්දැකීම් එකිනෙකට වෙනස් වූ නිසා විය හැකිය. මේ නිසා ආකල්පය බොහෝ විට පුද්ගලයකු තුළ පවත්නා එහෙත් දෘශ්‍යමාන නොවන ප්‍රතිචාරයකි. තවදුරටත් මේ පිළිබඳව විද්වතුන් විසින් ඉදිරිපත් කළ විවිධ නිර්වචන ඔස්සේ සලකා බලමු.

''යමක් පිළිබඳ ධන හෝ ඍණ වශයෙන් ක්‍රියාකිරීමේ නැමියාව "

- බෝගාඩ්ස් (Borgadus 1931)

පරිධියෙහි සංසිද්ධිය කෙරෙහි ධන හෝ ඍණ ලෙස ක්‍රියාකාරී වේ. ඒ අනුව පුද්ගල ප්‍රතිචාර ද දක්වනු ලබයි. යහපත් සංසිද්ධියකදී ධන ලෙසත් අයහපත් සංසිද්ධියකදී ඍණ ලෙසත් ක්‍රියාකිරීම සිදු වේ.

"පුද්ගලයකු යම් වස්තුවකට හෝ අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීමේදී මඟ පෙන්වනු ලබන හෝ ගතික බලපෑමක් ඇති කරනු ලබන අත්දැකීම් තුළින් සංවිධානය වන මානසික හා ස්නායුමය සූදානම පිළිබඳ තත්ත්වයකි."

ඔල්පොට් (Allport G'W' 1935)

මෙම නිර්වචනයට අනුව ආකල්පයක

1. අත්දැකීම් තුළින් සංවිධානය
2. ගතික/සත්‍රිය බලපෑමක්
3. මානසික ස්නායුමය සූදානම

යන අංග 03 අඩංගුය.

ෆිෂ්බින් හා අජ්ෂෙන් (Fishbein & Ajzen 1975) අනුව ආකල්පයන්

1. ඉගෙනීමෙන් ඇති වන බව
2. ක්‍රියාකාරීත්වයට පූර්ව නැමියාවක් සැපයීම
3. හිතකර/අහිතකර ලෙස බලපෑම

යන අංශ 03 කින් යුක්ත වේ.

ඉහත නිර්වචනය ඔස්සේ ආකල්පය යන්න පිළිබඳ මූලික වටහා ගැනීමක් ඇති කරගනු ඇතැයි සිතමි. එසේ නම් මෙකී ආකල්පය හට ගන්නේ කෙසේද?

ආකල්පයක් හට ගැනීමට මූලික වන්නේ අදාළ මාතෘකාවට හෝ ප්‍රස්තුතය පිළිබඳ පුද්ගලයාට ඇති ප්‍රජානනය හෙවත් දැනුමයි. එය අදහස් මත රුචිකම්, විශ්වාස, වටිනාකම්, ආදී වශයෙන් පහළ විය හැකි මානසික ස්වභාවයකි. අනතුරුව ඊට ආවේදනික ක්ෂේත්‍රය එක් වී චිත්තවේගික ස්වභාවයක් ආරෝපණය වේ. එසේම දැනුම හා චිත්තවේගික ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් යම් චර්යාත්මක නැඹුරුවක් පහළ වේ. එය පහත සටහනක් පරිදි පැහැදිලි කරමු..


අදාළ මාතෘකාව හෝ ප්‍රස්තුතය පිළිබඳව

| පුද්ගල අදහස් මත, රුචිකම්, වටිනාකම්, විශ්වාස ආදී ප්‍රජානන දැනුම | + | පහල වූ චිත්තාවේගික හැඟීම් හෙවත් ආවේදනික බව | + | කිසිවක් කිරීමේ හෝ නොකිරීමේ චර්යා නැඹුරුව | = ආකල්ප |
|---|---|---|---|---|---|

උපතේ සිට ක්‍රමක්‍රමයෙන් වැඩෙත්ම පුද්ගලයාට අත්දැකීම් එකතු වේ. ඒ සමගම එකී අත්දැකීම් ඔස්සේ පුද්ගල ආකල්ප ගොඩ නැගෙයි. විවෘත මනසකින් ලොව දෙස බැලූ පුද්ගලයා ආකල්ප ඔස්සේ සිය කාර්යය කටයුතුවලට තීන්දු තීරණ ලබා දෙයි. ඒ අනුව ක්‍රියාකාරී වේ.

**ආකල්පය සංවර්ධනය වන්නේ කෙසේද?**

සමාජ බලපෑම, ප්‍රජානන බලපෑම, චර්යාත්මක බලපෑම යන මූලික සාධක තුන ආකල්ප සංවර්ධනය සඳහා ඉවහල් වේ.



ඉහත සටහන පැහැදිලි කර ගැනීම සඳහා උදාහරණය ගෙන බලමු. මුස්ලිම් ජාතිකයින් ඌරු මස් අනුභවය ප්‍රතික්ෂේප කරයි. ඔවුනට එයින් වැළකී සිටීමට ආගමික ඉගැන්වීම් සංස්කෘතික කරුණු පොළඹවනු ලබන අතර ඒ අනුව ඔවුන් ඌරා නමැති සත්ත්වයා දැඩි ලෙස ප්‍රතික්ෂේප කරමින් ඌරු මස් අනුභවයෙන් වැළකී සිටීමේ ප්‍රතිචාරය දක්වනු ලබයි. මෙය සිදු කරනු ලබන්නේ ඉහත සටහන පරිදි සමාජ බලපෑම, ප්‍රජානන බලපෑම හා චර්යාමය බලපෑම ඔස්සේ සංවර්ධනය වූ නැත්නම් ගොඩනැගුණු ආකල්පය පදනම් කර ගනිමිනි.

මීළඟට ආකල්ප වැදගත් වන්නේ ඇයි යන්න අවධානයට යොමු කිරීම වැදගත් වනු ඇත.


පුද්ගල චර්යා හැඩ ගැස්වීමෙහිලා දැනුම, ආකල්ප හා කුසලතා යන සාධක තුන ඉවහල් වේ. එසේම පුද්ගල සංවර්ධනයේදී චර්යාවලට අදාළව දැනුම කුසලතා ආකල්ප හැඩ ගැස්වේ. මෙලෙස ආකල්ප හට ගන්නේ ඉහත කී සාධක සංයෝජනයන්හි ප්‍රතිඵලයක් වශයෙනි. ඒවා අතුරින්ද වඩාත් වැදගත් සේ පෙනෙන්නේ ආවේදන ක්ෂේත්‍රයට සම්බන්ධ ආකල්ප සාධකය වේ. මන්ද යත් එය සෘජුවම පුද්ගල චර්යාව හෝ ක්‍රියාව කෙරේ බලපාන බැවිනි.

යම් පුද්ගලයෙකු තුළ මනා ලෙස ආකල්ප පිහිටා තිබේ නම් ඊට අනුකූලව දැනුම හා කුසලතා සොයා යාමට හෙතෙම පෙළඹෙනු ඇත. එහෙත් පවතින ආකල්ප සෘණ අගයක් දරන්නේ නම් පුද්ගලයාගේ ඉදිරි ගමනක් ඇතිවිය නොහැක. ධන අගයක් දරණ ආකල්ප ඇත්තා ඉන් උත්තේජනය වී දැනුම කුසලතා සොයමින් ඉදිරියට යයි.

ආකල්පයක් සර්පිලාකාර කොයිල් එකකට උපමා කරයි. එය තදකර සිරකර ඇති බැමි මුදාහැරි විට වහා ඉදිරියට නෙරා එයි. පුද්ගල අභ්‍යන්තරයේ ආකල්පගත හැඟීම් ද අවශ්‍ය වූ විටෙක එසේ බලවත් ලෙස ප්‍රකාශ වේ. එසේ හැම ආකල්පයකම ක්‍රියාකාරී සම්භවයක් ඇත. නිසි උත්තේජනය ලද විගස විභව්‍යතා සාධකය පිණිස වහා ක්‍රියාත්මක වේ. ඒ සඳහා කිසියම් පෙළඹවීමක් හෝ දිරි ගැන්වීමක් අවශ්‍ය වේ.

සාමාන්‍ය පුද්ගලයෙකු අතිශයින්ම සාර්ථක හා දක්ෂයෙකු බවට පත්කිරීමේ හැකියාව ආකල්ප සතු වේ. මේ අනුව සාමාන්‍ය සුළු කුසලතාවක් ඇත්තෙකුට ආකල්ප මගින් එය වර්ධනය කර ගත හැකිය. එමෙන්ම අතිශයින්ම සහජ කුසලතා සහිත දක්ෂයෙකුට අවශ්‍ය ආකල්ප නොමැති නම් හෙතෙම සාමාන්‍ය පුද්ගලයෙකු බවට පත් වේ. එනම් සහජ කුසලතා උද්දීපනය කොට ක්‍රියාත්මක කරන්නේ ආකල්ප මගිනි. මේ අනුව පුද්ගල සංවර්ධන ප්‍රවේශය කෙරේ ආකල්පවල සෘජු බලපෑමක් ඇති වන බව කිව හැකිය.

එමෙන්ම ආකල්ප හා චර්යාව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් පවතී. ආකල්ප චර්යාව කෙරෙහිත් චර්යාව ආකල්ප හැඩ ගැසීම කෙරෙහිත් බලපානු ලබයි. තවත් විදිහකින් චර්යාවේ හේතුන් ආකල්ප වන අතර ආකල්පයන්ගේ හේතුන් චර්යාව වේ. මේ අනුව පුද්ගල චර්යාව සමාජයට යහපත් ආකාරයෙන් ගොඩ නැගීමට නම් යහපත් ආකල්ප සමුදායක් ඔහු තුළ ගොඩ නැගිය යුතු වේ. නැතිනම් පුද්ගලයාගේ භාවිතය හා ක්‍රියාකාරකම් සිදු වන්නේ සමාජ සංවර්ධනයට ඉඳුරාම ප්‍රතික්ෂේප වන ආකාරයටය. පහත රූප සටහන ඇසුරින් චර්යාව ගොඩ නැගෙන ආකාරය හඳුනාගත හැකිය.




මේ නිසා චර්යාව වෙනස් කිරීම යනු භෞතික කාරණාවක් නොව එය මුළුමනින්ම පුද්ගල මනෝභාවය හා බැඳී පවතින්නක් බව මෙමගින් පැහැදිලි වේ. ඒ අනුව පුද්ගල චර්යාවක් වෙනස් කිරීමෙහිලා පුද්ගල මනෝභාවයේ ස්වභාවය හඳුනාගැනීමත් එය ක්‍රම ක්‍රමයෙන් සිදුකළ යුතු ආකල්පමය වෙනසක් තුළින් සිදුකල හැක්කක් බව පැහැදිලි වේ. ආකල්පමය ගැටලු හේතුවෙන් ඇතිවන චර්යාත්මක ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීම මෙහිදී වැදගත් වේ. අධීක්ෂණයෙන් තොර වූ විට උදාසීන බවට පත්වීම යන්න පුද්ගලයන්

තුළින් විශේෂයෙන්ම ආයතනයක කටයුතු කිරීමේ දී බහුලව දැකිය හැකි තත්ත්වයකි. ඉහළ සිට පහළට සිදුවන අධීක්ෂණ ව්‍යුහය තුළ මෙම තත්ත්වය කැපී පෙනේ. යම්කිසි කාර්යයක් හරියට කිරීමට නම් පුද්ගලයෙකු තුළ එකී කාර්යය සම්බන්ධයෙන් දැනුම හා කුසලතාවය ප්‍රමාණවත් පරිදි තිබිය යුතුය. හරිදෙය තෝරාගෙන කිරීම සඳහා ඔහුගේ ආකල්ප හොඳවිය යුතුය. ඒ අනුව ආයතනයක නැතහොත් රටක සමස්ත ඵලදායීතාවය නගාසිටුවීමේ කාර්යයේ දී ආකල්ප සංවර්ධනය තුළින් ආකල්ප ඵලදායීතාවය නගාසිටුවීම අත්‍යාවශ්‍ය වේ. ලොව ධනවත්ම රටවල් යනු හොඳම මානව සම්පත ඇති රටවල්ය. හොඳම මානව සම්පත යනු දැනුම කුසලතා මෙන්ම ආකල්පවලින් ද සංවර්ධනය වූ මානව සම්පතයි. උදාහරණ ලෙස කර්මාන්තශාලාවක සේවකයින්ට උදෑසන 7.30 ට සේවයට පැමිණෙන ලෙස උපදෙස් ලබාදුන්විට කිසිවෙකු ප්‍රමාදවී පැමිණෙන්නේ නැත. ඔවුන් නියමිත වෙලාවට හෝ ඊට පෙර පැමිණීමට කටයුතු කරති. අත්සන් කිරීමට ලේඛණ නැත. නියමිත පරිදි පැමිණේදැයි අධීක්ෂණයට කිසිවෙකු කටයුතු නොකරයි. එහෙත් කිසිවෙකුත් වරදක් නොකරයි. ආකල්ප ඵලදායීතාවය අතින් ඔවුන් උසස් තැනක සිටින්නේ එහෙයිනි. අඩු ආකල්ප ඵලදායීතාවය සහිත මිනිසුන් සිටින ආයතනික පරිසරයක ප්‍රමාද වී වැඩට පැමිණීම, අධික ලෙස නිවාඩු ගැනීම, දුක් ගැනිවිලි වැඩිවීම, අන්තර් පුද්ගල ගැටුම් අධිකවීම, කේලම්කීමේ හා ඇඩීමේ සංස්කෘතියක් බිහිවීම, දක්ෂයින් කොන්වීම හා කොන් කිරීම, අපතේයාම් හා නාස්තිය අධිකවීම, කණ්ඩායම් හැඟීම නොමැතිවීම, අපිරිසිදු අවිධිමත් වැඩ පරිසරයක් බිහිවීම, විනය කඩවීම බහුලවීම, කඩාකප්පල් ක්‍රියා ඇතිවීම, සේවා තත්ත්වය බාලවීම වැනි ලක්ෂණ ප්‍රකට වේ.

ජීවිතයේ එදිනෙදා හමුවන ගැටලුවලට විසඳුම් සෙවීමේ කාර්යය තුළදීද ආකල්ප වැදගත්ය. දුර්වල ආත්ම ශක්තිය/ පිරිහුණු පෞරුෂය සහිත පුද්ගලයෙකුගේ සෘණාත්මක වූ අයහපත් ආකල්ප නිසා ජයග්‍රහණයන් තොරවීම, දියුණුවෙන් අඩුවීම, පරාජය මෙන්ම අන් අයට යටත්, අවනත වෙනත් අයකු විසින් හසුරුවනු ලබන්නෙකු බවට පහසුවෙන් පත්විය හැකිය. ප්‍රබල ආකල්ප ඇත්තෙකුට මෙවැනි හීන ආකල්පධාරියෙකු පහසුවෙන් වසඟයට ගෙන තම ඉත්තෙකු බවට පත්කළ හැකිය. එමගින් ව්‍යාපාර බිඳ වැටීම, රාජකාරිමය කාර්යයන් තුළ අවුල් වියවුල් තත්ත්වයන් නිර්මාණය කිරීම, ද්වේශ සහගත කටයුතු ආදී විවිධ අනර්ථයන් සිදු කිරීම කළ හැකිය. මේ නිසා ආකල්ප හටගන්නා ආකාරය හා ආකල්ප සමග සමාජ සම්බන්ධතා චර්යා බැඳෙන ආකාරයත් අවබෝධ කරගත යුතුවේ. මෙයින් යහපත් ධනාත්මක ආකල්ප ගොඩනගා ගනිමින් ඒවාට සමාජමය බැඳීම්, වගකීම්, යුතුකම්, ඇගයුම් ඇතිකර ගැනීමෙන් සමාජය තුළ සමතුලිත ජීවිතයක් ගත කිරීමට පුද්ගලයෙකුට හැකිවනු ඇත.

ආකල්ප හා චර්යාව අතර බැඳීම ප්‍රකට කරන තවත් අවස්ථාවක් ලෙස දැනුම හා භාවිතය අතර පවතින ගැටලු මෙන්ම දැනුම හා භාවිතය පහළ මට්ටමක පැවතීම සැලකිය හැකිය. ඇතැම් විට විභාග සමත්වීම ඉහළ අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබුනද ආයතනික ගැටලු, ආයතනය සංවර්ධනය සම්බන්ධව කටයුතු කිරීමේ දී ආයතනයට හා එහි සේවකයන්ට ගැළපෙන පරිදි තීන්දු තීරණ නොගැනීමට කලමනාකාරිත්වය කටයුතු කරයි. ඔවුන් බොහෝ විට තම අධ්‍යාපන සහතික හා තම තිලය උසස් ලෙස සලකා ප්‍රායෝගික නොවන දැඩි තීන්දු, නීති මත කටයුතු කිරීමට පෙළඹේ. මේ නිසා නිරන්තර ගැටුම් ආයතනය තුළ ගොඩ නැගෙන ආකාරය දැකගත හැකිය. සේවා ඵලදායීතාවයේදී බොහෝවිට අකාර්‍යක්ෂමතා ඇතිවන්නේ සෘණ හෝ අතෘප්තිකර ආකල්ප දැරීම හේතුවෙනි. ආයතනය පැත්තෙන් බලන විට එම ආයතනය තම සේවකයා කෙරෙහි සංවර්ධනාත්මක ආකල්ප ගොඩනගා ගැනීමට අපොහොසත් වන්නේ නම් සේවකයාගේ අසාර්ථකත්වයට අදාළ දෙපාර්තමේන්තුවද වගකිව යුතු වේ. පුද්ගලික සේවා අංශවල බොහෝවිට මෙවැනි බිඳ වැටීම් දක්නට නොලැබෙන්නේ සේව්‍ය - සේවක දෙපක්ෂයම සංවර්ධනාත්මක ආකල්ප මත පිහිටා කටයුතු කිරීමයි.

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල සුළු සේවකයින් බොහෝ විට සෘණාත්මක ආකල්ප දරණු දක්නට ලැබේ. පිරිසිදු කරන්නන්, කාර්යාල කාර්යය සහායකයින්, මුරකරුවන්, වතු කම්කරුවන් වැනි සුළු සේවකයින් තමන් අදාළ ආයතනයේ සමස්ත ක්‍රියාවලියට දායක වන්නන් හෝ කොටස් කරුවන් නොවේය යන පහත් ආකල්පය දරති. ඒ නිසා ඔවුන් නිතර වැඩ නොකර සිටීමෙන්. වැඩ මගහැරීමෙන්, නොසැලකිල්ලෙන් කටයුතු කිරීමෙන් ආයතනයට

එරෙහිව ක්‍රියා කිරීමේ මානසිකත්වය ඇති කර ගනිති. නාසා ආයතනය ඇසුරින් මේ සම්බන්ධව ජනප්‍රිය උදාහරණයක් ඇත. විටෙක ඇමරිකානු ජනාධිපතිවරයා නාසා ආයතනයට ගිය විට එහි පවිත්‍රතා කටයුතු කරන සේවකයෙකුගෙන් ඔබ මෙහි තුමක් කරන්නේදැයි විමසුවේය. එවිට ඔහු ප්‍රකාශ කළේ මම අභ්‍යවකාශය තරණය කිරීම සඳහා සහාය ලබා දෙනවා යන්නයි. එසේ නැතිව ආයතනයේ පවිත්‍රතා කටයුතු සිදු කරන බවක් පැවසුවේ නැත. ඒ අනුව ඔහුගේ ආයතනික අරමුණු වෙනුවෙන් ඇති කැපවීම හා අපේක්ෂාව මොනතරම් උසස්ද යන්න ඔහු ප්‍රකට කළ යහපත් නැතිනම් ධනාත්මක ආකල්පයේ ප්‍රකාශනය තුළින් පැහැදිලි වේ. ගොවියා රසායනික පොහොර හා පලිබෝධ නාශක යොදා වගා කළ බෝග/ආහාර අලෙවි කරනු ලබයි. ඔහු දැනදැනම මෙම අහිතකර ක්‍රියාව සිදු කිරීම තුළින් පැහැදිලි වන්නේ ඔහු තුළ තිබෙන සෘණාත්මක අමානුෂීය වූ ආකල්පයන්ගේ ස්වභාවය නොවන්නේද?

මේ අනුව යහපත් ආකල්ප සහිත පුද්ගලයින් ගොඩනැගීම සඳහා සෑම ක්ෂේත්‍රයක් වෙතම අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා පවුල නමැති ක්ෂුද්‍ර සමාජ ඒකකය තුළින් ආරම්භ කළ යුතුවන අතර සෑම සමාජ සංස්ථාවක් (අධ්‍යාපන, ආර්ථික, සමාජීය, අධ්‍යාත්මික, දේශපාලන, සංස්කෘතික ආදී) තුළමත් ලාංකීය සමාජය තුළ ස්ථාපිතව පවතින රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන සංවිධාන සිවිල් සංවිධාන ආදී සියලු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මෙම කාර්යය කටයුත්ත වහ වහා ඇරඹිය යුතු වේ. මෙම ආකල්පමය වෙනස තුළින් සෞභාග්‍යයේ දැක්ම යථාර්ථයක් බවට පත් කිරීමට හැකියාව ලැබෙනවා පමණක් නොව ඒ තුළින් සාර ධර්ම සහිත මානුෂ ආකල්පවලින් පෝෂිත ලාංකීය සමාජයක් ද ගොඩ නැගීමට හැකි වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අබේපාල, රෝලන්ඩ් (2005) ආකල්ප සංවර්ධනය, කොට්ටාවඃ සාර ප්‍රකාශන

බාලසූරිය, ඒ. එස්. (2003) සාර ධර්ම අධ්‍යාපනය, අංගොඩඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

කාරියප්පෙරුම, ලසන්ත ඵලදායීතාව හා ඵලදායීතා වර්ධනය සඳහා වන ශිල්ප ක්‍රම, මරදානඃ එස් ගොඩගේ සහ සහෝදරයෝ

සමරසිංහ, විමලදාස (2005) ශ්‍රී ලංකාවේ මිනිස් බල ගැටලු, කොළඹ 10, පහන් ප්‍රකාශන

වීරරත්න, ජේ. දන්ගල්ල එස්. කේ. දරිද්‍රතාවය පිටු දැකීම හා සමාජ සජීවිකරණය, මරදානඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ



**අනූෂ ඇපා සෙනෙවිරත්න**
පුහුණු හා පර්යේෂණ සහකාර
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.


-

# කාන්තා ව්‍යවසායකත්වය




ලෝක ආර්ථිකය හමුවේ සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ ශ්‍රම දායකත්වය සඳහා කාන්තා නියෝජනය සැලකිය යුතු මට්ටමක පවතී. අතීතයේ සිටම ශ්‍රී ලාංකේය කාන්තාව ගෘහස්ථ පරිපාලනය හා ආදායම් ඉපැයීමේ කාර්යය සඳහා සෘජු දායකත්වයක් ලබාදී ඇත. අතීත ගොවිතැන් කටයුතු වලදී ගෙවිලිය විසින් ලබාදුන් දායකත්වය ශ්‍රම දායකත්වයෙහිලා සැලකීමක් නොකෙරුනද එය පවුල් ඒකකයේ ආර්ථිකයට කාන්තාව සවියක්වූ බව පෙන්වාදෙයි. වර්තමානය වනවිට පුරුෂ පාර්ශවය මෙන්ම කාන්තා පාර්ශවය ද සේවා නියුක්තිකයන් ලෙස පවුලේ ආර්ථිකය ස්ථාවර කර ගැනීමේ කාර්යය සඳහා සක්‍රීයව දායකවේ. ආර්ථික සංවර්ධනය මැනීමේදී ගෘහණියක් බහුවිධ කාර්යයන් ඉටුකිරීමේ දායකත්වය සැලකිල්ලට නොගැනුන ද ශ්‍රී ලාංකේය මුළු ජනගහනයෙන් මිලියන 8.18 ක්වූ සේවා නියුක්තිකයන් සැලකූ විට ඉන් ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 34.5% ක් පමණ වේ.



ශ්‍රී ලංකා ආර්ථිකයේ තේ, ඇඟලුම්, සංක්‍රමණික සේවය, සංචාරක කර්මාන්තය හා වෙනත් විවිධ රැකියා ක්ෂේත්‍රවල ස්ත්‍රී ශ්‍රම බලකායේ දායකත්වය ඉහළයමින් පවතී. විදේශ රැකියා නියුක්තිය ගත්විට ස්ත්‍රී ශ්‍රම දායකත්වය ඉහළ ප්‍රතිශතයක පවතී. ගෘහ කර්මාන්තයේ සිට සෞඛ්‍ය සේවය දක්වා ඉතා පුළුල් පරාසයක කාන්තා ශ්‍රම දායකත්වය ලබාදීම සිදුවේ. මේ අනුව පෙනී යන්නේ කාන්තාව පවුල තුළ ආර්ථික හා සමාජීය සහජීවනය පවත්වා ගැනීමට ප්‍රබල දායකත්වයක් සපයන බවයි.

මෙලෙස සමාජය තුළ කාන්තාවගේ භූමිකාව වෙනස්වීම සඳහා අධ්‍යාපනය ප්‍රබලව බලපා ඇති අතර ගෘහ කටයුතු හා කෘෂිකර්මාන්තය කෙරෙහි වැඩි නැඹුරුතාවක් දැක්වූ ඇයගේ අධ්‍යාපන හා කුසලතා මට්ටම වර්ධනයවීම, සමාජයේ විවිධ වෙනත් ක්ෂත්‍රයන්හි නියැලීමට හේතුවක් විය. එහෙත් දැනුමෙන් පරිපූර්ණවත්ම පුරුෂ පාර්ශවය මෙන්ම කාන්තාවන් ද රාජ්‍ය සේවය හා පුද්ගලික ආයතනයන්හි සේවා නියුක්තිය තෝරාගෙන ඇති අතර ඒ අනුව සේවා වියුක්ති ජනගහනයෙන් පුරුෂ සේවා වියුක්ති අනුපාතය 3.3% ක් පමණ වන විට 7.4% ක්ම ස්ත්‍රී සේවා වියුක්තිය බවට පත්වී තිබේ.

ශ්‍රම වෙළඳපොළ - 2019 (අ)




ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතය නියෝජනය කරන මධ්‍යම පාන්තික ප්‍රජාවගේ, පවුලේ ආර්ථිකයට සවිය ලබාදෙන්නේ පුරුෂ පාර්ශවයයි. පවතින ආර්ථික රටාව තුළ පවුලේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ඇති අපහසුතා මත කාන්තාවද ආර්ථිකයට උරදෙන තත්ත්වයක් යටතේ බහුතර ග්‍රාමීය හා පහළ මධ්‍යම පාන්තික පවුල්වල කාන්තා පාර්ශවයේ මූල්‍ය උත්පාදන මාර්ගය ගෘහ සේවයට විදේශ ගතවීමයි. මේ හේතුව තුළ පවුලේ ආර්ථික වර්ධනයට අත්වැලක් සැපයිය හැකිවුවද පවුල් පරිසරයේ ඇතිවන අතුරු විපාක මත කුටුම්බය දෙදරා යන තත්ත්වයක් ඇතිවීම සුලභ කරුණකි.

මෙවැනි පරිසරයක් තුළ කාන්තා පාර්ශවය, ගෘහ ව්‍යවසායකත්වය සඳහා වන නැඹුරුතාවය වැඩිකිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වේ.

දැනටමත් කාන්තා පාර්ශවය ගෘහස්ථ ව්‍යවසායකත්ව කාර්යන්හි නියැලෙමින් පවුල් ආර්ථිකයට සවියක්වී ඇති ක්ෂේත්‍ර සඳහා නිදසුන් පහත පරිදි පෙන්වා දිය හැක.

1. බිම්මල් නිෂ්පාදනය.
2. නිමි ඇඳුම් අලෙවිය හා ඇඳුම් මැසීම.
3. සිල්ලර වෙළඳාම.
4. ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය.
5. හඳුන්කූරු නිෂ්පාදනය.
6. ගෙවතු වගා හා කොම්පෝස්ට් නිෂ්පාදනය.
7. මල් ගාව හා විසිතුරු පැල වගාව.
8. ධාන්‍ය හා කුළුබඩු නිෂ්පාදනය.
9. අත්කම් නිෂ්පාදනය.
10. රූපලාවන්‍ය කටයුතු.
11. මංගල උත්සව සංවිධානය හා ඡායාරූපකරණය.
12. සැහැල්ලු සෙල්ලම් බඩු නිෂ්පාදනය.
13. ගමන් මලු හා පාවහන් නිෂ්පාදනය.
14. රසකැවිලි කර්මාන්ත ඇතුළු ආහාර නිෂ්පාදනය හා අලෙවිය.





මෙලෙස ගෘහස්ථ කාර්යභාරයන්ට අමතරව පවුලේ ආර්ථිකය පදනම් කරගනිමින් ඉදිරියට එන කාන්තා පාර්ශවය, රටේ සංවර්ධනය සඳහා ධනාත්මකව යොදා ගනිමින් කාන්තාව පවුල් සංස්ථාවට පමණක් සීමා නොකොට, ඔවුන්ගේ ව්‍යවසායක කුසලතා දේශීය ආර්ථිකය සංවර්ධනය කිරීමට යොදා ගැනීම රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේද වගකීමකි.

කාන්තාව, ව්‍යවසායිකාවක මට්ටමට පත් කිරීමට පුහුණුවීම් තුළින් ආරම්භ කළ හැකි අතර ඉන්පසු ව්‍යවසායකත්වය පසු විමර්ශනය කිරීම, දිරිගැන්වීම් හා සහන සේවා ලබාදීම ඉතා වැදගත්වේ. මේ සඳහා පර්යේෂණ හා සංවර්ධන ඒකක ස්ථාපිත කිරීම තුළින් තවදුරටත් කාන්තා ව්‍යාවසායකත්වය පුළුල් වපසරියක විහිදීමට අත්වැල් සැපයිය හැකිය.

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට ව්‍යාපාරයක් ඇරඹීමට නීතිමය බාධාවක් නොමැති වුවද ව්‍යවසායකයින් ලෙස ඉදිරියට යෑමේදී කාන්තාවන් විවිධ අභියෝග හා ගැටළුවලට මුහුණ දේ.

1. **ලබාදෙන පුහුණුවීම් නව්‍යතාවයෙන් යුක්ත නොවීම**
   අලෙවිකරණ, තාක්ෂණික හා මූල්‍ය කළමනාකරණ දැනුම් විෂයෙහි හිඟතාවයක් පැවතීම කාන්තාව ව්‍යවසායකත්වය කෙරෙහි නැඹුරුවීම අඩපණ කිරීමට හේතුවක් වේ. සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම හා ඒකාකාරී පුහුණු ක්‍රම උපයෝගී කරගැනීම, නව මාන හඳුනාගැනීමට බාධාවක් වේ. වර්තමාන සමාජයේ පවතින ඉල්ලුම හඳුනාගනිමින් නව ව්‍යවසායකත්ව ක්ෂේත්‍ර කරා නවකයින් යොමුවීමට තාක්ෂණය මිශ්‍ර දැනුම, පුහුණු වැඩසටහන් කරා එක්කර ගැනීම සිදුකළ යුතුය.

2. **තීරණ ගැනීමේ පවතින නිදහස අවම වීම**

ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික පරිසරය පවතින්නේ පීතෘ මූලික පවුල් පසුබිමකය. ඒ හේතුවෙන් කුටුම්භය තුළ තීන්දු තීරණ ගැනීමේ අධිකාරිය පුරුෂයා සතුවේ. මේ හේතුවෙන් ව්‍යාපාර පරිසරයක වුවද තීන්දු තීරණ ගැනීමට කාන්තා පාර්ශවය පසුබට වේ. මෙය ආදායම් උත්පාදන කාර්යයන් බිඳවැටීමට බලපානු ලබයි.

3. **අවදානම් දැරීමේ නොහැකියාව**

ව්‍යවසායකයින් වශයෙන් ආරම්භයක් ගැනීමට ද සමාජය තුළ පැවැතීමට ද අවදානම් දැරීමේ ශක්තියක් තිබිය යුතුයි. මූල්‍ය සුරක්ෂිතතාවය හමුවේ කාන්තාව අවදානම් භාර ගැනීමේ / දැරීමේ පසුබෑමක් පෙන්වයි. මේ තත්ත්වය තුළ කාන්තාවගේ ව්‍යාවසායකත්ව හැකියාව ඉස්මතු නොවේ.

4. **කුටුම්භ පරිසරයේ බහුකාර්යයන් ඉටුකිරීමට ඇති වගකීම**

විවාහය යන්න කාන්තාවන් ශ්‍රම වෙළෙඳපොල වෙත සහභාගීත්වය අවම කිරීම සඳහා හේතුවක් වන බව ලෝක බැංකු වාර්තා පෙන්වා දෙයි. (Getting to world : unlucky women's potential in Sri Lanka's labour force) ගෘහයේ කාර්යයන්ට අමතර කාර්යයන් සඳහා වැඩි කාලයක් වෙන්කිරීමට නොහැකි වීම මීට හේතුවයි. ගෘහණියක් ඉටුකරනු ලබන කාර්යයන් රටේ ආර්ථික සංවර්ධනයට හෝ ශ්‍රම බලකාය ගණනය කරනු නොලැබුවද සැමියාගේ, දරුවන්ගේ, දෙමාපියන්ගේ, ඥාති හිතවතුන්ගේ යුතුකම් හා වගකීම් කාර්යභාර්ය පැටවෙන්නේ කාන්තාවටය. දවසක උදාවටත් පෙර සිට කුටුම්භ කටයුතු ආරම්භ කරමින් හිරු අවරට ගොස් පැය ගණනාවක් යන තෙක්ම දිනයකදී ඉටුකිරීමට ඇති කාර්යයන් හා ඒ සෑම පාර්ශවයක් වෙනුවෙන්ම දැරීමට සිදුවන වගකීම් හමුවේ අමතර ආදායම් උත්පාදන කාර්යයක නියැලීම අතිශය දුෂ්කර කාර්යයක් වන නිසාම ව්‍යවසායකත්වය කෙරෙහි කාන්තා ප්‍රවේශය අවම මට්ටමක පැවැතීමත්, යම් යම් අවස්ථා වල ආරම්භ කරනු ලබන ස්වයං රැකියා කටයුතු අතරමග නතර කිරීමත්, ඒවා පිරිහීයාමත් දක්නට ලැබේ.

5. **ණය පහසුකම් ලබා ගැනීමේ ගැටළු**

ප්‍රාථමික මට්ටමින් ව්‍යවසායකයෙකු ලෙස ඉදිරිපත් වීමේදී පුහුණුවීම් මෙන්ම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය, ගැටළුවක් ලෙස කාන්තාව මුහුණපාන තවත් අභියෝග යකි. ග්‍රාමීය මට්ටමින් විවිධ පාර්ශවයන් ණය දෙන වැඩසටහන් ක්‍රියාත්මක කළද ග්‍රාමීය ජනතාව සූරාකන අත්‍යවශ්‍ය නොවන සුඛෝපභෝගී භාණ්ඩ ලබාගැනීම සඳහා වන ණය දෙන ව්‍යාපාරයන් වීම හේතුවෙන් ආර්ථික උත්පාදන ක්‍රියාවලියට ගැළපෙන මූල්‍ය පහසුකම් කාන්තාවට නොලැබේ. එමෙන්ම ණය අරමුදල් සපයන බොහෝ ණය යෝජනා ක්‍රම පැවතිය ද ඒවා පිළිබඳ නිසි දැනුවත් වීමක් නොලැබීම ද ඇප තැබීම් ආදී විවිධ කොන්දේසි හේතුවෙන් ණය ලබා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවීමද දක්නට ලැබේ. රාජ්‍ය බැංකු හරහා ණය පහසුකම් සපයා ගැනීමේ හැකියාව වර්ධනය කරගෙන ඇත්තේ සීමිත පිරිසක් පමණක් වන අතර කුඩා මට්ටමේ ව්‍යවසායිකයින් හේතුවෙන් රාජ්‍ය බැංකුවලින් ණය ලබා ගැනීමේ නොහැකියාව මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමේදී කාන්තාව ප්‍රබලව මුහුණදෙන අභියෝගයකි.

6. **අලෙවිය හා සම්බන්ධ ගැටළු**

ගෘහස්ථ මට්ටමේ නිෂ්පාදන කාර්යයන්හි නියැලෙන කාන්තාවන් මුහුණ දෙන ප්‍රාග්ධන ගැටළුවක් නම් තම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා පොදු ස්ථානයක් හෝ නිශ්චිත වෙළෙඳපොලක් නොමැතිවීමයි. මේ නිසා අතරමැදියන් විශාල වශයෙන් ලාභ ලබන අවස්ථා ද දැකිය හැකි අතර කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට නව වෙළෙඳපොල අවස්ථා ලබා ගැනීමට ද සමාජය තුළ හැකියාවක් නොමැතිවීම ගැටළුවකි. තරගකාරී වෙළෙඳපොලට ප්‍රවේශවීමේදී දැනුම නොමැතිවීම, මඟ පෙන්වීමක් නොමැතිවීම හා මූල්‍ය පහසුකම් නොමැතිවීමද ගැටළුවක් වී ඇත.



7. **අමුද්‍රව්‍ය/සම්පත් සපයා ගැනීමේ දුෂ්කරතාවය**
   තම ප්‍රදේශයට ගැළපෙන රැකියා අවස්ථා හඳුනා ගැනීම තුළ අමුද්‍රව්‍ය ලබා ගැනීම විශාල ගැටළුවක් නොවූ නමුදු ව්‍යවසායකත්වය වර්ධනය කර ගැනීමේදී අමුද්‍රව්‍ය ලබා ගැනීමේ තරගකාරීත්වයට ද අමුද්‍රව්‍ය ප්‍රවාහනයේ දී දැරීමට සිදුවන පිරිවැය හේතුවෙන් ද ව්‍යවසායකත්වය අභියෝගයන්ට ලක්වේ. අමුද්‍රව්‍ය පිරිවැය හා නඩත්තු පිරිවැය ඉහළ යාම මේ තුළ තවදුරටත් දැකිය හැක.

8. සංවර්ධනය හා අධ්‍යාපනය හමුවේ කාන්තාවන්ගේ භූමිකාවන් වෙනස් වුව ද අධ්‍යාපන ප්‍රගතිය හා යහපත් සෞඛ්‍ය ප්‍රතිලාභයන්ගේ ප්‍රගතිය ශ්‍රී ලාංකීය කාන්තාවන්ට සමාජීය ඉහළ රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා පරිවර්තනය වී නොමැති වීම ද ගැටළුවක්වේ. ඉන් කාන්තා පාර්ශවයේ කුසලතා නිසි පරිදි ප්‍රයෝජනයට නොගැනීම පූර්ණ ව්‍යවසායකයින් බිහි කිරීමේ නොහැකියාවට හේතුවක්වී ඇත.

මේ සියලු ගැටළු බාධක හමුවේ ඉතිහාසය වෙනස් කරමින් සාම්ප්‍රදායික ව්‍යාපාරික අදහස් වලින් බැහැරව ගොස් තාක්ෂණික මුසුවීම් සමඟ ශ්‍රී ලංකාවෙන් එපිට ජාත්‍යන්තර වෙළෙඳපොල තරණය කරන ලද කාන්තාවන් වර්තමාන සමාජයේ හමුවීම, නව ව්‍යවසාය සංස්කෘතියක් බිහිවීමේ අඩිතාලමකි. ගෘහයේ පවතින සියලු රාජකාරී ඉහළ මට්ටමින් ඉටුකරමින් ග්‍රාමීයව මුළුගැන්වී සිටින කාන්තා පාර්ශවයන්ට ආදර්ශයක් ලබාදෙමින් ව්‍යවසායකත්වය තුළ කාන්තා දායකත්වය වර්තමාන සමාජයේ ඉස්මතු වෙමින් පවතී. මේ සඳහා කාන්තාව හා පවුල් පරිසර බැඳුනු විවිධ සාධක ඊට අනුබල දී ඇති බව දක්නට ලැබේ.

මෙහිදී ආදායම් උත්පාදන කාර්යන්හි වඩාත් සාර්ථකව නියැලීම මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාන්තා දායකත්වය තවදුරටත් වර්ධනය කිරීම සඳහා සමාජීය වශයෙන් ඇය බලගැන්වීමට නම් සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකත්වය කෙරෙහි කාන්තාව නැඹුරුකිරීමේ ප්‍රවර්ධන වැඩසටහන් ආරම්භ කළ යුතු අතර ඒ සඳහා ඔවුන්ගේ තාක්ෂණික හා කළමණාකරන කුසලතා වර්ධනය කිරීම තුළින් නව ජීවනෝපාය අවස්ථා වෙත ප්‍රවේශ කරලීමටද අවස්ථාව ලබාදිය හැක.

ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා හා තරුණ ශ්‍රමය හඳුනා ගැනීමත් ප්‍රදේශයට සුදුසු ව්‍යවසායකත්ව අවස්ථා නිර්ණය කිරීමත් අවශ්‍ය වන අතර ඒ සඳහා තවදුරටත් පුහුණු වැඩසටහන් මෙන්ම ණය වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීම වැදගත්වේ. ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා ග්‍රාමීයව පවත්නා සමිති සමාගම් දායක කරගන්නා මෙන් කාන්තා ව්‍යවසායකත්වය ගොඩනැගීමේදී කාන්තා සමිති සහභාගීත්වය ලබාගැනීමට කටයුතු කිරීමද අත්‍යාවශ්‍ය වේ.

කුටුම්භ ඒකකය තුළ කාන්තා භූමිකාව උසස් මට්ටමින් පවත්වා ගනිමින් ගෘහස්ථ පරිසරයේ ආදායම් උත්පාදන ක්‍රියාවලියට හවුල්වෙමින් සමාජ තලයේ ද කාන්තා පෞරුෂය ඉහළ නැංවීම සඳහා සිදුකල හැකි කාර්යයන් කිහිපයක් පෙන්වා දිය හැක.

(i) කාන්තා සමිති සවිබලගන්වමින් දැනුවත් කිරීමේ වැඩමුළු හරහා විවිධ ප්‍රදේශයන්ට ගැළපෙන නව ව්‍යවසායකත්ව අවස්ථා හඳුනා ගැනීම.



(ii) ගෘහස්ථ ක්‍රියාකාරකම්වලදී මෙන්ම ව්‍යවසායකයෙක් ලෙස තිබිය යුතු කළමණාකරණ හා සංවිධානාත්මකව හැකියාව දියුණු කිරීමට පුහුණුවීම් ලබාදීම.



සංවර්ධනය කළ හැකි ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයක් ලෙස ගෘහස්ථ හා කාර්යාලීය පරිසරයන් සඳහා බඳුන්ගත විසිතුරු පැල වගාව හඳුන්වා දිය හැක

(iii) තමා නියැලෙන ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ මාර්ග හඳුන්වා දීම, වෙළෙඳපොලට ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදනයේ/සේවාවේ ගුණත්වය, නිමාව ඇතුළු විවිධ අවස්ථාවන්හිදී අගය වැඩි කිරීමේ ක්‍රමවේද හඳුන්වාදීම.

(iv) වෙළෙඳපොල හා සමාජීය පරිසරයේ අවශ්‍යතා හා ඉල්ලුම හඳුනාගනිමින් නව ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීමට කාන්තා පාර්ශවය දැනුවත් කිරීම හා ඒ සඳහා ඔවුන්ගේ හැකියාව වර්ධනය කිරීම.



හෙළබොජුන් සංකල්පය මගින් නව අලෙවි ප්‍රවේශයන් හඳුන්වා දී ඇත.

(v) එක් එක් ව්‍යවසායකත්ව පාර්ශවයන් සඳහා අවශ්‍ය දැනුම හා නිපුණත්වය ලබාදීම.

(vi) නව තාක්ෂණ මානයන් හඳුන්වා දීම හා තම ව්‍යාපාරික ක්ෂෙත්‍රය සඳහා එම දැනුම ගලපා ගැනීමට මඟ පෙන්වීම.

(vii) කාන්තා සංවිධාන/සමිති ග්‍රාමීය මට්ටමින් සක්‍රීයව පවත්වා ගැනීමට ප්‍රතිසංවිධානය කිරීම.

(viii) සම්පත් කළමණාකරණය පිළිබඳ හැකියාව වර්ධනය කිරීම.

(ix) වෙළෙඳපොල හා අලෙවිය පිළිබඳ විවිධ ප්‍රවේශයන් හඳුන්වාදීම හා ඒවා ප්‍රගුණ කිරීමට අවස්ථාව සැලසීම.

(x) කාන්තාවන්ට ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය පරිසර පහසුකම් ලබාදීම වැදගත්වේ. ළමා සුරැකුම් මධ්‍යස්ථාන, ආරක්ෂිත ප්‍රවාහන පහසුකම්, සදාචාරාත්මක වෙළෙඳපොල අවස්ථා ලබාදීම, රක්ෂණ ක්‍රම හඳුන්වාදීම, කම්කරු නීති හමුවේ සමානව සැලකීම ආදී සුභසාධන හා ආරක්ෂක පහසුකම් ලබාදීම අවශ්‍ය වේ.

(xi) සමාජ සංස්කෘතික ආකල්ප වෙනස් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

කාන්තාව සම්බන්ධයෙන් මුල් බැසගත් සමාජීය ආකල්ප වෙනස් කරමින් පුරුෂ පාර්ශවය සමඟ තරගකාරීව ආර්ථිකයට උරදීමට මඟපෙන්වීම අවශ්‍යවේ. කාන්තාව තවදුරටත් මුළුගැන්වී නොසිට සාම්ප්‍රදායික ගෘහනියගේ රාමුවෙන් පිටතට පැමිණ ව්‍යවසායිකාවක් ලෙසට ඇගේ දායකත්වය සැපයිය යුතුය. ශ්‍රී ලංකා ආර්ථික පද්ධතියට කාන්තා ව්‍යවසායකයින්ගේ අවශ්‍යතාවය දැඩිව දැනෙන අතර නිෂ්පාදන හෝ සේවා අංශයන්ගෙන් කාන්තාව ලබාදෙන දායකත්වය තුළ රටේ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් ඉන් සමස්ථ ආර්ථික සංවර්ධනය ඇතිවීමත් දැක්විය හැක. රටේ සේවා වියුක්තියට කාලීන විසඳුමක් වන කාන්තා ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම ආර්ථික සංවර්ධනය කරා යැමට ඇති ඵලදායි උපාය මාර්ගයකි.

පවුලේ සාමාජිකයින්ගේ කාර්යයන්ට හා ආරක්ෂාවට හානියක් නොවීම, පවුලේ මුළු ආදායමට දායකත්වයක් සැපයීමට හැකිවීම, ගෘහ කාර්යයන්ට සහයක් ලැබීම, සාම්ප්‍රදායික සමාජය තුළ ගෘහණියගේ කාර්යභාරයට බාධාවක් නොවීම, සමාජය තුළ විශේෂ හඳුනාගැනීමක්, පිළිගැනීමක් ලැබීම ව්‍යවසායකත්වය සඳහා කාන්තා ප්‍රවේශයට අනුබලයක් ලෙස පෙන්විය හැක. පවුල් ශ්‍රමය මේ සඳහා සහයෝගයක් ලෙස යොදාගැනීමද උපාය මාර්ගයකි.

ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික රටාව ශක්තිමත් කිරීම සඳහා අප සතු මහා පරිමාණ කාන්තා ශ්‍රමය මනා ලෙස කළමනාකරණය කිරීම වැදගත්වේ. ජාතික ප්‍රතිපත්තීන් කාන්තාවන්ගේ අභිවෘද්ධිය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් සකස් කිරීම තුළ කාන්තාවන්ගේ හැකියාවන් සහ කුසලතාවන් වර්ධනය කළහැකි අතර සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්තියට අනුව යමින් ඉදිරි වර්ෂයන් තුළ කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමෙන් ඒකාකාරී ජීවන රටාවකට හුරුවී දරිද්‍රතාවයෙන් පීඩා විඳින මෙරට බොහෝ ගෘහණියන් රටේ ආර්ථිකයේ ප්‍රධාන ශක්ති ප්‍රභවය බවට පත්කළ හැක.

**මූලාශ්‍රයන් -**


- මහ බැංකු වාර්තාව 2019,
- 2019 ජූලි තායිවාන්හි පැවති Innovations in Agribusiness for Young Entrepreneurs වැඩමුළුව,
- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සිංහල පර්යේෂණ වාර්තා,
- ලෝක බැංකුවේ කාන්තා ව්‍යවසායකත්වය සහ නීතිය පිළිබඳ 2018 වාර්තාව,
- Getting to Work : Unlocking Women's Potential in Sri Lanka's Labour Force නමැති ලෝක බැංකුව නිකුත් කළ නවතම වාර්තාව,

- ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තා,
- ඡායාරූප Innovations in Agribusiness for Young Entrepreneurs වැඩමුළුව හා අන්තර්ජාලය ඇසුරෙනි.

**අයි. එස්. රත්නායක,**
සහකාර අධ්‍යක්ෂ,
කන්ද උඩරට උරුමය පිළිබඳ අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය.

## සිතනු මැන ..........................

නිසරු බිම වැටුණ බිජු..........
වෙර දරා පැළ වෙනුයේ..........
අතු පතර විහිද ගොස්
එල දරා හිනහෙනුයේ..........
කුමට දැයි සිතනු මැන..........
අගු පිලේ වැටි වැතිර..........
ඉඳුල් කා ගත රුහිර
දැඩි කරනුයේ පැටව්
තිරිසනා වුව මිතුර..........
කුමට දැයි සිතනු මැන..........
ගත රුහිරු වැල් පුරා..........
කිරි සුවඳ උතුරලා
දුක් ගැහට විඳ දරා..........
ජනිත කොට ලොවට උන්..........
නොසිතන්නේ කිමද?
අගය මිනිසත් බවේ..........
''බලවත්ව ජය ගන්න - වැඩී ලොව වැජඹෙන්න
බොහෝවී පතුරන්න - නොවෙද නොමැරී ඉන්න''
සොබා දම එලෙස වෙයි..........
නොවී අවනත එයට
නිගා කොට උමතු ලෙස
දමන්නේ වැදූ දරුවන්..........
ගඟට, මහමඟට කුණුවලට
නැතිද ළෙහි දරු දුකක්
සිතනු මැන..........
සිතන්නට කෝ..........
සිතක්, තෙතක් ඇති හදවතක්
නොමළ මළ මිනිසුනේ..........

**සමන් කුමාර මාරසිංහ**
මානව සම්පත් සංවර්ධන නිලධාරි
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
වාරියපොල.

# හරිත විප්ලවයේ අහිසි බලපෑම අවම කර දේශීය කෘෂි කර්මාන්තය නංවාලමු

කෘෂි නිෂ්පාදන වැඩිදියුණු කිරීම උදෙසා කෘෂිකාර්මික ශිල්පීය ක්‍රමවල තාක්ෂණික වශයෙන් ඇතිවූ ක්‍රියාවලිය හරිත විප්ලවය ලෙස සැලකේ. මෙය ප්‍රධාන වශයෙන් ලොව සාගිනි නිවීම සඳහා ඉමහත් බලාපොරොත්තු සහිතව දියත් කළ වැඩසටහනක් විය. එහි නිල නාමය වූයේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ප්‍රකාශිත ලෝක සැලැස්ම යන්නයි. එය පාරම්පරිකව හා දේශීය වශයෙන් සැලකුණු යැපුම් කෘෂිකර්මය අභිබවා යමින් රසායනික වූ කෘෂිකර්මයක් ලෙස විකරණය කිරීමට සමත් විය. ප්‍රතිඵලයක් ලෙස මිනිසාට ස්වභාව ධර්මයෙන් හිමි ව තිබූ පාරිසරික සම්පත් රැසක් මිහිතලයෙන් ඉවත් කිරීමට එයට සම්පූර්ණ ශක්‍යතාවය ලැබුණි. එමගින් වැඩි ඵලදාවක් ලබාදෙන, පරිසරයට ඔරොත්තු දෙන බෝග වර්ග හඳුන්වාදීම, විවිධ කෘෂි රසායනික ද්‍රව්‍ය, පොහොර , පළිබෝධ නාශක ආදිය භාවිතය සිදුවිය. එමෙන්ම වාරි මාර්ග ජලය ලබාදීම, යන්ත්‍රානුසාරයෙන් වැඩි අස්වැන්නක් සහිත බෝග වර්ග හඳුන්වාදීම හරිත විප්ලවය මගින් සිදුවිය.

මෙක්සිකෝව සිය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් 1948 දී ඇරඹූ කෘෂි පර්යේෂණ ව්‍යාපෘතිය හරිත විප්ලවයේ මුල්ම පියවරයි. ආචාර්ය නෝමන් බ්ලොග් ඇමරිකා එක්සත් ජනපදයේ රොකෆෙලර් සමාගමේ මූල්‍ය ආධාර මත ආරම්භක පියවර සනිටුහන් කළේය. මුලදී හරිත විප්ලවය නව ශාක මාදිලි හා ප්‍රභේදවල අභිජනය මෙන්ම නව කෘෂි ශිල්ප යොදා ගැනීම යන ප්‍රධාන අරමුණු දෙක යටතේ ක්‍රියාත්මක වුවද මෙය 1960 පමණ වන විට ලොව පුරා ශීඝ්‍රයෙන් භාවිත කෙරිණි. මෙක්සිකෝව 1965 වන විට සිය ආහාර නිෂ්පාදනයෙන් 50% ක් අපනයනය සඳහා වෙන් විය.

නව ශාක ප්‍රභේද බිහි කිරීමේ ක්‍රමවේදය යටතේ එකම පවුලේ ශාක දෙකක් මුහුන් කිරීම සිදුවිය. නිදසුන් ලෙස 1R8 වී වර්ගත්, රෙඩ්ලේඩි ගස්ලබු, තිස්ස රටකජු ප්‍රභේදය, නෝරින් තිරිඟු ආදිය දැක්විය හැකිය. දෙමුහුන් බීජ වර්ග නිපදවීම මගින් එකිනෙකට පරාගනයෙන් ලැබෙන බීජ රෝපණය කර එමගින් බීජ ලබා ගැනීම සිදුවිය. මෙම ක්‍රමවේදය මගින් පරිසර තත්ත්වයන්ට හා ලෙඩ රෝගවලට ඔරොත්තු දීම, කෘමි උවදුරුවලට ඔරොත්තු දීම, කෙටි කාලසීමාවකදී ඵලදාව ලැබීමට හැකිවීම, සාම්ප්‍රදායික බෝග වර්ගවලට වඩා කීප ගුණයකින් වැඩි අස්වැන්නක් ලැබෙන ශාක ඇතිවීම සිදුවිය.

පටක රෝපණය වැඩි අස්වනු ලබා ගැනීමට සිදු කරන ලද තවත් පර්යේෂණයකි. එහිදී ද වඩාත් සුදුසු බෝග වර්ග දෙකක් හඳුනාගෙන එකවර පැළ විශාල ප්‍රමාණයක් ලබාගැනීමට සහ නිරෝගී ගුණාත්මක බවින් ඉහළ පැළ ලබා ගැනීමට හැකිවිය. මෙමගින් ඉතා කුඩා බිම් කොටසකින් විශාල අස්වැන්නක් ලබා ගැනීමට ගොවියාට හැකියාව ලැබුණි. මෙම නව තාක්ෂණ ක්‍රම භාවිතය මගින් මිනිසාගේ මෙන්ම සතුන්ගේ ද ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට සමත් විය. මෙයත් සමග ජාන ඉංජිනේරු තාක්ෂණය පදනම් කර ගනිමින් ජානමය වශයෙන් විකරණය කරන ලද ආහාර වෙළෙඳපළට නිකුත් වීම සිදුවිය. එසේ ජානමය විකරණයට ලක් කරන ලද ජීවීන් (GMO) ආහාර ලොව පුරා විවිධ ආයතන මගින් මිනිසාගේ පරිභෝජනයට එකතු කර ඇත.

ස්වයංපෝෂිත කෘෂි නිෂ්පාදනයට හිමිකම් කිවූ ආසියාතික රටවල් අතර ශ්‍රී ලංකාවට සුවිශේෂී ස්ථානයක් හිමිවිය. ස්වයංපෝෂිත හා ස්වයං ආර්ථික ක්‍රමයකට උරුමකම් කියූ ලාංකික ගොවියා ගොඩ මඩ ගොවිතැනින් රටට අස්වැන්න නිෂ්පාදනය කළේය. මෝසම් වැස්සත් සමග වගා කළ තල, මෙනේරි, කුරක්කන්, මිරිස්, ලූණු, අබ වගාව ලංකාවට හරිත තාක්ෂණයේ බලපෑම ඉහළ යාමත් සමග වෙනත් අතකට යොමු විය. බඩඉරිඟු වගාවත් සමග හේන් ගොවිතැනට ලැබුණු ස්ථානය අහෝසි විය. දෙමුහුන් බෝග, යන්ත්‍ර සූත්‍ර හා කෘෂිරසායනික පොහොර මෙරටට ද උරුම විය. එමගින් වැඩි අස්වැන්නක් ලබාගත හැකි වුවද මෙම සරු පොළොවේ සාරය විනාශ විය. ගොවියන් වගා ණය සඳහා උනන්දු කිරීමේ

ක්‍රම ඇති විය. ඇතැම් සත්ව විශේෂ වඳ වීමට ද කෘෂි රසායනික පොහොර භාවිතය හේතු විය.

හරිත විප්ලවයේ මෙරට ආගමනයත් සමග පාරම්පරික ගොවිතැනින් නොව තාක්ෂණයෙන් අනූන පරිපූර්ණ අස්වැන්නක් ලැබීම සඳහා රසායනික පොහොර, කෘෂිරසායනික, දෙබිඩි බීජ හා යන්ත්‍ර සූත්‍ර හරහා විදේශිකයන්ගෙන් ගොවිතැන ගෙන ආ උගතුන් අනුගමනය කරන්නට පෙරමං සැකසිණි. ආරම්භයේ දී මහ පොළවට වස මුහු කිරීමට ගොවියන් අකමැති විය. පරම්පරාගතව උරුම වූ දේශීය කෘෂි ඥානයෙන් ඔවුන් සන්නද්ධ වී සිටි නිසා ද, පරපණ නැසීම පාපයක් ලෙස සැලකූ නිසා ද ආරම්භයේ දී ආගන්තුක වූ මෙම මෙවලම් ප්‍රතික්ෂේප විය. එහි දී පිළියම් ලෙස කෘෂි පොහොර වගාවට යෙදූ බවට තහවුරු වීමෙන් පසුව පමණක් වගා ණය ලබාදීමේ වැඩපිළිවෙල සකස් කෙරිණි. එබැවින් වගා බිම්වලට හරිහැටි රසායනික පොහොර, කෘමි නාශක, වල් නාශක භාවිත කරන්නන්ට යහමින් වගා ණය ලැබිණි.

මෙම ක්‍රම මගින් අතීතයේ ගොවි රජවරු ලෙස වැජඹුණු ගොවියන් අන්ත අසරණ තත්ත්වයට පත්විය. කෘෂි රසායනිකවල රසායනික සංඝටක ජල මූලාශ්‍රවලට මුසුවීම මත ජලය බීමට නොහැකි තත්ත්වයට පත්විය. සතුනට පවා බීමට ඇති ජලයට වස මිශ්‍රවීමෙන් ජෛව ලෝකයට දැඩි අවදානමක් විය. දැඩි පරිසර දූෂණයකට හා දැඩි ජල දූෂණයකට ලක්වීම මත පොළවෙන් නොමිලේ ලැබෙන ජලය පවා බීමට නොහැකිකම මත මුදලට ජලය ලබා ගැනීමට දුප්පත් ජනතාවට සිදු විය. පරිසර සමතුලිතතාවය බිඳවැටුණු අතර මිනිසුන් හඳුනා නොගත් වකුගඩු රෝගයන්ගෙන් පෙළෙන්නට විය. ඇතැම් රසායනික ද්‍රව්‍ය පිළිකා ඇති කිරීමේ අවදානමක් ඇති බවටත් ලොව පුරා ශීඝ්‍රයෙන් පැතිරෙන බෝ නොවන රෝග ඇතිවීමේ හැකියාව ද ඇති බවට අද වනවිට තහවුරු වී ඇත. පාරම්පරිකව පැවති කෘෂිකාර්මික ක්‍රමවේද අභාවයට යාම මත ඖෂධීය වටිනාකමක් සහිත බෝග සංස්කෘතිය ක්‍රමයෙන් පරිහානියට පත්විය. දේශීය සහල් විශේෂ ගණනාවකට උරුමකම් කියූ දේශීය වී ගොවිතැන අද වනවිට ඉතා සීමිත වී වර්ග කිහිපයකට පමණක් යොමු වී හමාරය.

ජානමය වෙනස්කම්වලට භාජනය වන ජීවී ප්‍රභේද මගින් ස්වාභාවිකව ඇති ජාන ව්‍යුහය දූෂණයට ලක්වීමෙන් ශාක හා සත්ව ප්‍රජාව දැඩි තර්ජනයකට ලක්විය. තාක්ෂණය මත නිපදවන ලද ආහාර පරිභෝජනය මගින් මිනිසාගේ හා සතුන්ගේ සෞඛ්‍යට දැඩි තර්ජනයක් එල්ල වී ඇත. ඇතැම් යුරෝපීය රටවල් ජාන විකරණය කරන ලද ආහාර සත්ත්ව පරිභෝජනය සඳහා ද තහනම් කර ඇත. මෙහි තවත් අනිසි ප්‍රතිඵලයක් ලෙස වගා කළහැකි ඉඩම් ලවණීකරණය වීම සිදුවිය. එහිදී පස සරු කිරීමේ දායකත්වයක් දරන හිතකර ක්ෂුද්‍ර ජීවී විශේෂ හා හිතකර කෘමි විශේෂ විනාශවීම සිදුවිය. දීර්ඝකාලීනව කෘෂි රසායනික පොහොර භවිතය මත පසේ ලවණතාවය ඉහළ යාමට තුඩු දී ඇත. අති සංවේදී ඇතැම් කෘෂි ශාක ප්‍රභේදවල අස්වැන්න අඩුවීමට ද මෙම ලවණතාවය බලපා ඇත. ක්ෂුද්‍ර ජීවී හායනය සහ කෘමි සතුන්ගේ හායනය නිසා ජෛව විවිධත්වයට විශාල බලපෑමක් ඇති වී ඇත. කෘමි නාශක, වල් නාශක හා අස්වනු වැඩි කිරීම සඳහා යොදන පොහොර භාවිතය මත වැඩි අස්වැන්නක් ලැබුව ද භූගත ජලය අධි පරිභෝජනය නිසා අවාසිසහගත තත්ත්වයක් ඇති විය. මෙමගින් භූගත ජල ප්‍රමාණය අඩුවීම කෙරෙහි බලපෑමක් ඇතිකර ඇත.

පළිබෝධ නාශක මිනිස් සිරුර තුළට විවිධ විෂ රසායනික හේතුවෙන් මිනිසුන්ට විවිධ සංකූලතා ඇතිවේ. කාබඔයිල් හා ෆීනොක්ෂි අම්ල අඩංගු වල් නාශක නිසා නොමේරූ ළදරු උපත් ඇතිවීම සිදුවන අතර ඇතැම් සංඝටක මගින් මිනිස් ශුක්‍රාණු සාන්ද්‍ර වීම හේතුවෙන් උපදින දරුවන් තුළ විවිධ අසාමාන්‍යතා ඇති වන බවට තහවුරු වී ඇත.

මේ අනුව ඉතා හරසරින් නූතන තාක්ෂණික ක්‍රමවේද වැළඳගැනීම තුළ දේශීය කෘෂිකර්මය සම්පූර්ණයෙන් උඩුයටිකුරු තත්ත්වයකට පත් වීමෙන් කෘෂි කර්මාන්තය අවාසනාවන්ත ඉරණමකට ලක්ව ඇති බව පැහැදිලිය.

**දේශීය කෘෂි කර්මාන්තය යහපත් දිශානතියකට යොමු කිරීම සඳහා යෝජනා**

- ශ්‍රී ලංකාව දෙස බැලීමේදී ආහාර සුරක්ෂිතතාවය ප්‍රබල අභියෝගයක් වී ඇත. මිනිසාට පරිභෝජනයට ඇති ආහාරවල ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය ඉහළ නැංවීම මගින් ශරීරයට අහිතකර විෂ එකතුවීම අවම කරගත හැකිය. ඒ සඳහා රජය හා කෘෂිකර්ම අමාත්‍යාංශය එක්ව නීති රෙගුලාසි ඇති කිරීම.

- කෘෂි රසායනික බෙහෙත් වර්ග භාවිතය අවම කිරීමට දේශීය ගොවියා දිරි ගැන්වීම හා පාරම්පරික දේශීය ගොවි ක්‍රම නැවත භාවිතයට උනන්දු කිරීම සිදුකළ යුතුය. රජයේ දිරි ගැන්වීම මත ස්වාභාවික පරිසරයට හිතකර කෘමි නාශක දියර වර්ග, සත්ව පොහොර, කාබනික පොහොර භාවිතයට ගොවියා යොමු කිරීම. රසායනික කෘෂි රසායනිකවලින් තොරව වගා කිරීමට නොහැකිය යන සංකල්පය බිඳ නැවත දේශීයව වගා කරන ගොවි සංකල්ප දියුණු කිරීම මගින් රට බහු ජාතික සමාගම්වල ගොදුරක් බවට පත්වීම වැළැක්විය හැකිය. හරිහැටි දේශීය ප්‍රතිපත්ති හා පරිපාලනය සිදුවන රටවලට බාහිරින් එන ආධාර ආයතන හෝ විදෙස් සමාගම්වලට කළහැකි බලපෑම අවම වේ. නමුත් ලංකාව වැනි රටකට මෙය කොතෙක් දුරට වලංගුදැයි අවබෝධ කරගත යුතුය.

- කාබනිකව හා දේශීය ක්‍රම අනුගමනය කරමින් නිපදවන ආහාර පාරිභෝගිකයා වෙතට ඉහළ තක්සේරුවකින් යුතුව හඳුන්වා දීමට නිසි ක්‍රියා පිළිවෙළක් හඳුන්වා දීම මෙන්ම ආනයනික පලතුරු, විවිධ කීම වර්ග හා එළවළු වෙනුවට දේශීයව සෞඛ්‍යාරක්ෂිතව නිපදවූ ආහාර පරිභෝජනයට දිරිගැන්වීම් ඇති කිරීම, පාසල් හා කාර්යාල මුල් කරගනිමින් සෞඛ්‍ය පුරුද්දක් ලෙස සෞඛ්‍යාරක්ෂිත ආහාර පුරුදු ඇති කිරීම අඛණ්ඩව සිදු කිරීම.

- ගොවියා විසින් පස නිසරු කරන කෘෂි නිෂ්පාදන වෙනුවට අමතර බෝග, සුළු බෝග ලෙස විවිධාංගීකරණය වූ බෝග රටාවට නැවත පණ දීම, ගෙවතු ආශ්‍රිතව තමාගේ පරිභෝජනයට අවශ්‍ය එළවළු, පලතුරු ඉඩකඩ ඇති පරිදි වගා කිරීමට රටවැසියන් හුරු කිරීමට ක්‍රමවේද හඳුන්වාදීම, කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි මෙහෙයවීම යටතේ අභාවයට ගිය මුල් භෝග වර්ගවලට නැවත ජීවය දීම ආරම්භ කළ හැකිය.

- ජල මූලාශ්‍රවල එකතු වී ඇති බැර ලෝහ ප්‍රතිශතය අවම කිරීම මගින් ජල දූෂණය අවම කිරීමට ක්‍රියා මාර්ග හඳුන්වාදීම වැදගත්වනු ඇත.

- ජල මූලාශ්‍රවලට මෙන්ම සත්ව ප්‍රජාව අනුභව කරන තණකොළවලට කෘමි නාශක හා රසායනික පොහොර එකතු වීම අවම කිරීම හා දූෂිත වූ ජල මූලාශ්‍ර පිරිසිදු කර නැවත පරිභෝජනයට සුදුසු තත්ත්වයට පත්කිරීමට රජය මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

- හරිත තාක්ෂණයෙන් ලද අපට වැදගත් දේ පමණක් ඉදිරියට ගෙන යාමට රටක් වශයෙන් සියලුදෙනා කටයුතු කිරීම.

වර්තමානයේ සමස්ත ලෝකයටම බලපා ඇති කොවිඩ් 19 වසංගතය, සෙසු බොහෝ රටවලට මෙන් ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ද දැඩි බලපෑමක් ඇතිකර ඇත. එවන් පසුබිමක ශ්‍රී ලංකා රජය, රට හදන සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන ක්‍රියාවට නංවමින් සිටී. ඒ යටතේ ජනතා කේන්ද්‍රිය ආර්ථිකය මගින් පුද්ගලයා සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීය ලෙස බද්ධ කරගැනීමේ ක්‍රමෝපායන් අනුගමනය කරමින් සිටී. කෘෂි ආර්ථිකය නගා සිටුවීම යටතේ ගෙවතු වගා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත.

ඒ අනුව රටේ ජනතාව කෘෂි නිෂ්පාදන වෙත නැඹුරුව සිටින මෙවන් අවධියක හරිත විප්ලවය නිසා සිදුව ඇති ව්‍යසනකාරී තත්ත්වයන් අවම කර වඩාත් සුරක්ෂිත නිරෝගිමත් හා සෞඛ්‍යසම්පන්න ජීවන රටාවක් පවත්වා ගැනීමට හැකිවන අයුරින් කෘෂි කර්මාන්තය නගාසිටුවීම කෙරෙහි රටේ සියලු ජනතාව එක්ව ක්‍රියා කළ යුතුව ඇත.

**එන්. ආර්. ගුණවර්ධන**
ජෛව තාක්ෂණ උපාධිධාරී

# සංවර්ධනයේදී පරිසරයේ ඇති වැදගත්කම

සංවර්ධනය යන්න නිර්වචනය කිරීම සඳහා අර්ථ ශාස්ත්‍රඥයින්, දේශපාලන විද්වතුන් හා සමාජ සංවිධාන විවිධ අර්ථකථන ඉදිරිපත් කර ඇත. ඒ අතරින් 1995 කෝපන්හේගන් නුවර ලෝක රාජ්‍ය නායක සමුළුවේදී සංවර්ධනය යන්න විග්‍රහ කර ඇත. ඒ අනුව ආර්ථික, සමාජ හා පරිසර යන අංශ වල මනා සම්බන්ධතාවයක් ඇති මහජනතාවට කල් පවත්නා ජීවන තත්ත්වයක් පවත්වාගෙන යාමට හැකිවීම සංවර්ධනය වශයෙන් ඔවුන් නිර්වචනය කර ඇත.

පරිසරය සමග ඒකාබද්ධව යන පරිසරයට හානිකර නොවන මිනිසාගේ ශිෂ්ඨත්වය ඔප්නංවන සදාචාර ගුණ දහම් හා මානව ගුණ දහම් ගරු කරන මානසිකව ඉහළ තලයකට පිවිසෙන ජනතාවක් වඩාත් සංවර්ධිත වූ ජනතාවක් යන අර්ථකථනයට ලෝකය එමින් පවතී.

තිරසර සංවර්ධනයේදී මූලික ලක්ෂණය වනුයේ පරිසරය හා බැඳුන සංවර්ධන ක්‍රියාවලියයි. වර්තමාන ලෝකයේ රටවල්, තම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දැඩි තරගකාරිත්වයක යෙදී සිටී. මේ නිසා අන්තර්ජාතික සම්මේලනවලදී පරිසරාත්මක හා සමාජීය වගකීමකින් යුතු ආර්ථික සංවර්ධනයක් මගින් දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා කැපවීමේ අවශ්‍යතාවය නිරතුරුවම ප්‍රකාශ කර ඇත. මනා නිරෝගී වූ පරිසරයක වටපිටාවක් නිර්මාණය කිරීම අන්තර්ජාතික සංවර්ධනයේ ප්‍රමුඛතාවයක් ලෙස පිළිගෙන ඇත. පරිසරයට වන හානි වළක්වා ගනිමින් සම්පත් විනාශ නොකර සංවර්ධන සැලසුම් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුය. සමස්ත ජනතාවටම ඵලදායීවූද ගුණාත්මක වූද ඉහළ ජීවන රටාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම ද තිරසර සංවර්ධනයේ මූලික පරමාර්ථයයි. සංවර්ධනයේදී මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ඉටු කිරීම ද ප්‍රධාන පරමාර්ථයයි. තිරසර සංවර්ධන සංකල්පය ක්‍රියාත්මක කිරීමේදී සපුරා ගත යුතු අවශ්‍යතාවයන් කීපයක් ඇත. 1987 ''පොදු අනාගතය" නම් ප්‍රකාශනයේ තිරසර සංවර්ධනය අර්ථ දක්වා ඇත. එනම් ''වර්තමානයේ තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සිදුකරනු ලබන සංවර්ධන කාර්යය තුළ සිදුකරනු ලබන සෑම ක්‍රියාවක්ම මනා සැලසුමකින් යුතුව අනාගත පරපුරෙහි අවශ්‍යතාවයන්ට බාධා නොවන පරිදි සිදු කිරීම" යන්නයි. තිරසර සංවර්ධනය ළඟාකර ගැනීමට අවශ්‍යතා 3 ක් සම්පූර්ණ කළ යුතුය. එනම් පාරිසරික අවශ්‍යතා, සමාජීය අවශ්‍යතා හා ආර්ථික අවශ්‍යතා වශයෙනි. හැකිතාක් දුරට සංවර්ධන ක්‍රියාදාමයේදී මිනිසා හා සාමාජික පරිසරය අතර ඇතිවන ගැටීම අවම කර ගත යුතුය. ස්වභාවික පරිසරය ආරක්ෂා කරගනිමින් පරිසර හිතකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය.

මානවයාගේ ආරම්භයේ සිට පරිසරය වනාහි මිනිසා හා සමීප සම්බන්ධතාවයක් ඇති නොවෙනස් වූ ජීවමාන වූ සහ සම්බන්ධතාවයක් තිබූ දෙයකි. ඒ වනාහි මිනිසා හා අනෙකුත් සත්වයා ජීවත් වන වටපිටාව ය. පරිසරය යන්න ශබ්ද කෝෂයේ පහත පරිදි නිර්වචනය කර ඇත.

"පරිසරය යනු ජීවියෙකු වටා පවතින භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක තත්ත්වයන් යම් ජීවියෙකු ජීවත් වන එම ජීවියාගෙන් බැහැරව පවතින ප්‍රදේශය, වටපිටාව හෝ තත්ත්වයන් පරිසරයයි."

බුදුරජාණන් වහන්සේ පරිසරයට දැක්වූයේ ඉමහත් කෘතගුණයකි. ''ආරාම රෝපා වන රෝපා" යනුවෙන් වන වගාවේ වටිනාකම උන්වහන්සේ දේශනාකර ඇත.

ඇමෙරිකානු කෞතුකාගාරයක සුරක්ෂිතව තැන්පත් කර ඇති රතු ඉන්දියානු නායක සියැටල් ප්‍රකාශනයේ පරිසරය පිළිබඳ වැදගත් තොරතුරු අනාවරණය කර ඇත. පරිසරය අප පෘථිවියේ කොටසක් වන අතර, එය අපේම කොටසකි. සුවඳැති මල් වර්ග සත්තු වර්ග අපේම සහෝදරයෝ වෙති. පෘථිවියේ පරිසරය සකස් වී

ඇති ආකාරය විමසීමේදී ප්‍රධාන සංරචක දෙකක් හදුනා ගෙන ඇත.

01. **අජීවී හෙවත් භෞතික සංරචක**

මෙයට ජලය, වාතය, හිරු රශ්මිය, පස (ගංගා, ඇළ-දොළ, කඳු හෙල් ආදී සියල්ල)

02. **සජීවී හෙවත් (ප්‍රාණය ඇති) ජෛව සංරචක**

මෙම ගණයට මනුස්සයා ඇතුලු අනෙකුත් මාංශ භක්ෂක, ශාක භක්ෂක වියෝජක යන සත්වයන් ද, තුරුලතා ආදිය අන්තර්ගත වේ.

පරිසරය නිර්මාණය වී ඇති විවිධ සංරචක අතර සංකීර්ණ අන්තර් සබඳතා ඇත. පරිසරයේ මෙම අන්තර් සබඳතා නිසා මිනිසා හා සතුන් ජීවත් වේ. මිනිසාට හෝ සතුන්ට වාතය හා ජලය නොමැතිව මොහොතක්වත් ජීවත් විය නොහැකිය. අප ශරිරයේ 2/3 ට වැඩි ප්‍රමාණයක් ඇත්තේ ජලයයි. මිනිසා හා සත්වයාට ජීවත් වීමට අවශ්‍ය ආහාර හා බලශක්තිය සියලු දෑ ලබා ගනුයේ පරිසර පද්ධතියෙන්ය. එම නිසා පරිසරයෙන් තොර ජීවිතයක් ගැන කතා කළ නොහැක.

පෘථිවිය මත පහළ වූ ජීවීන් විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් පරිණාමය වී ඇති බව පෙනේ. පරිණාමයේදී විවිධ වර්ගයේ ශාක හා සත්ව විශේෂ ලොවට බිහිවී ඇත. පෘථිවිය, මිනිසා හා සතුන්ටත් තුරුලතාවලටත් ජීවත් වීමට සුදුසු ස්ථානයක් බවට පරිවර්තනය වී තිබෙන්නේ ශාක හා සත්වයින්ගේ ඇති මෙම විවිධත්වය නිසාය. මෙම ජීවී වස්තුන්ගේ විවිධත්වය ජෛව විවිධත්වය ලෙස හඳුන්වයි. අප උපන්දා සිට මියයන තෙක් ජෛව විවිධත්වයේ ප්‍රතිඵල බුක්ති විඳිනු ඇත.



**පරිසරය හා මිනිසා අතර බැඳීම වෙනස්වීම**

අතීතයේ මිනිසා හා පරිසරය අතර ඉතා සමීප සම්බන්ධතාවයක් පැවති අතර, පරිසරයෙන් ලබාගනු ලැබුයේ තමාගේ පැවැත්මට අවශ්‍ය ද්‍රව්‍ය පමණි. එහෙත් කාර්මීකකරණය වීම සමග බිහිකරන ලද යන්ත්‍ර සූත්‍ර නොයෙකුත් රසායනික ද්‍රව්‍ය හා වාහනවලින් විශාල අයුරින් පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු විය. මෙම තාක්ෂණික දියුණුව නිසා පරිසරයට විවිධ බලපෑම් ඇතිවිය. මෙම විවිධ වූ අහිතකර බලපෑම් පාරිසරික ගැටලු නමින් හඳුන්වයි. මෙම ගැටලු මිනිසුන්ගේ සතුන්ගේ හා තුරුලතාවල පැවැත්මට මෙන්ම පරිසරයේ පැවැත්මට ද විශාල තර්ජනයක් ද වී ඇත.

ස්වභාවික සිද්ධීන් පදනම් කරගෙන ඇතිවන ගැටලු හා මිනිසා විසින් සිදු කරන බලපෑම් නිසා ඇතිවන ගැටලු වශයෙන් මෙම පාරිසරික ගැටලු දැක්විය හැකිය.

ස්වභාවික පාරිසරික ගැටලු ඇතිවන්නේ නායයෑම්, ගං වතුර, භූමිකම්පා, නියඟය හා සුනාමි වැනි තත්ත්වයන් නිසාය. දිනෙන් දින ගෝලීය උණුසුම වැඩිවීම නිසා පොළොවේ උණුසුම ද ඉහළ නගිමින් පවතී. 2004 වසරේ ඇති වූ සුනාමි තත්ත්වයද ස්වභාවික පාරිසරික ගැටලුවකි. කෙසේ වුවත් මෙම සියලු පාරිසරික ගැටලු අතර අන්තර් සම්බන්ධතාවයක් පවතී.

මිනිසා විසින් පරිසරයට සිදු කරනු ලබන බලපෑම් නිසා ඇතිවන පාරිසරික ගැටලු රටේ සංවර්ධනයට ද බලපෑම් ඇතිකරයි. සංවර්ධනය කරා යන මාවතේදී නොයෙකුත් අනතුරුදායක තත්ත්වයන්ට මිනිසාට මුහුණ දීමට සිදුවේ. විශේෂයෙන්ම මිනිස් ප්‍රජාවට අවශ්‍ය ආහාර නිෂ්පාදනය හා බෙදා හැරීම, අධ්‍යාපනය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු පවත්වාගෙන යාම, නිවාස ගොඩනැගිලි හා මහාමාර්ග වැනි යටිතල පහසුකම් වර්ධනය කිරීම, ජලය, විදුලිය, දූරකතන හා බැංකු සේවා පුළුල් කිරීම යන සෑම ක්‍රියාවක්ම සංවර්ධන ක්‍රියාවලියට ඇතුලත්ය. ඒ සඳහා පරිසර සම්පත් වැඩි වැඩියෙන් යෙදවීමට සිදුවීම සංවර්ධනයේදී මුහුණ පාන අභියෝගයකි. එයට හේතුව වැඩිවන ජනගහන

අවශ්‍යතා සපුරාලීමට සම්පත් වැඩි වැඩියෙන් යොදවා ගැනීමට සිදුවීමයි. නිෂ්පාදනය හා යෙදවීම් ඉහළ යාම නිසා පරිසරයට අතිවිශාල පිරිවැයක් දැරීමට සිදුවේ. එවැනි විටෙක ආර්ථිකය මුහුණ දිය හැකි විවිධ තත්ත්වයන් පහත පරිදි සාරාංශ කළ හැකිය.

- ස්වභාවික සම්පත් සඳහා මෙතෙක් පැවති ඉල්ලුම ඉහළයාම සහ සම්පත් සඳහා වන තරඟය ඉහළ යාම.
- ස්වභාවික සම්පත් හිඟයට මුහුණ දීම සඳහා විකල්ප සම්පත් භාවිතයට යොමුවීමෙන් පරිසරයට වන තර්ජන ඉහළ යාම.
- ජෛව විවිධත්වය හා පරිසර පද්ධති විවිධත්වය බිඳ වැටීම.
- පරිසරයට මුදා හැරෙන අපද්‍රව්‍ය ප්‍රමාණය වැඩිවීම හා පරිසර දූෂණය ඉහල යාම.
- එහි ප්‍රතිඵලයක් ලෙස අහිතකර පරිසර වෙනස්වීම් හා සොබා දහමේ චලනයන් විසින් මිහිතල ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් ඇති කිරීම.

ඉහත කරුණු 1 ක් හෝ කීපයක් හේතුවෙන් දුප්පත්කම, විරැකියාව, මන්දපෝෂණය සහ ස්වභාවික විපත් ආදී සංවර්ධනයට බාධා පමුණුවන සාධක ඉහළ යාම සිදුවේ.

### 01. ජලාශ්‍රිතව සිදුවන දූෂණය

ජලයට නොයෙකුත් අපද්‍රව්‍ය එකතු වීම නිසා ජලයේ ගුණාත්මක භාවය වෙනස් වේ. ජල දූෂණය නිසා ජලයේ ඇති භෞතික හා ජෛව විද්‍යාත්මක ගති ලක්ෂණ වෙනස් වේ. කෘෂිකාර්මික කටයුතුවලට පලිබෝධනාශක භාවිතය නිසා ඒවා ජලයට මිශ්‍ර වීමෙන් පරිසරයට හිතකාමී කෘමීන් ද විනාශ වී ජෛව විවිධත්වයට බලපෑම් ඇති කරයි. එමෙන්ම කර්මාන්ත ශාලා, ව්‍යාපාරික ස්ථාන, හා නිවාසවලින් පිටකරන අපද්‍රව්‍ය ජලය හා මිශ්‍රවීමෙන් ජලය දූෂණය වේ. එමෙන්ම ක්‍රමවත් මළාපවාහන ක්‍රමයක් නොමැති වීමෙන් ඒවා ජල පද්ධතියට මුදා හැරීම බොහෝවිට සිදු වී ඇත. මළ ද්‍රව්‍ය හා වායුමය හෝ ඝණ අපද්‍රව්‍ය ද ජලයට මුදාහැරීම නිසා මහජන සෞඛ්‍යට විශාල හානියක් වී ඇත. එමෙන්ම සාගරයේ ගමන් කරන නැව් මගින් මුදා හරින දැව් තෙල්, නැව් කැඩී විනාශ වීම නිසා මුහුදු ජලයට එක්වීමෙන් ජලය දූෂණය වීම, වෙරළාශ්‍රිත කර්මාන්තශාලා වලින් නිකුත් කරන ප්ලාස්ටික් නොදිරන බෑග් හා ඝන අපද්‍රව්‍ය මුහුදු ජලයට එකතු වීම, ධීවර කර්මාන්තයේ යෙදෙන අය ඉවතලන අපද්‍රව්‍ය හා නයිලෝන් දැල්, ප්ලාස්ටික් මළු ආදිය මුහුදට දැමීම නිසා මුහුදු ජලය දූෂණය වීම.

මෙසේ ජලය දූෂණය වීම නිසා ඇතිවන අහිතකර බලපෑම් පහත පරිදි වේ.

- මත්ස්‍යයන් හා වෙනත් ජීවීන් විනාශ වී යයි.
- දූෂිත ජලය පානය කිරීමෙන් විවිධ වසංගත ලෙඩ රෝග පැතිරේ.
- තුරුලතා විනාශවීම හා ස්වභාවික පරිසරය විනාශ වේ.
- අපිරිසිදු ජලයේ ජිවත්වන මත්ස්‍යයන් ආහාරයට ගැනීමෙන් සෞඛ්‍යයට හානිකර වීම.

### 02. වායුගෝලය දූෂණය වීම

මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා වායුගෝලයට නිකුත් කරන විවිධ වායු වර්ග නිසා පරිසරය දූෂණය වේ. වායු දූෂණය විවිධ පාරිසරික සමාජ ආර්ථික ගැටලු ඇතිවීමට ඍජු හා වක්‍ර අයුරින් බලපානු ලබයි. විශේෂයෙන්ම කාබන්ඩයොක්සයිඩ් වැනි වායු නිසා පරිසරය දැඩි ලෙස දූෂණය වේ. සත්වයාගේ ජීවත් වීමට අම්ලකර වායුව හෙවත් ඔක්සිජන් වායුව අවශ්‍ය වේ. අප අවට ඇති තුරුලතාවලින් ද මෙම වායුව ලබා දෙයි. අවට වාතයට විෂ සහිත වායු හෝ ද්‍රව්‍ය මිශ්‍ර වීමෙන් වායු දූෂණය වේ. මේ නිසා ජීවීන් පමණක් නොව තුරුලතාවලට ද අහිතකර ව්‍යසනයක් ඇති කරනු ලබයි. මෙවැනි විනාශකාරී ක්‍රියාවන් සිදුවනුයේ මිනිස් ක්‍රියාකාරකම් නිසාය. වායු දූෂණය ආකාර දෙකකින් සිදුවන බව පෙන්වා දී ඇත. එනම්

- කෘතිම වායු දූෂණය
- ස්වභාවික වායු දූෂණය

මිනිස් ප්‍රජාවගේ කෘත්‍රිම ක්‍රියාවන් නිසා කෘතිම වායු දූෂණය ඇතිවේ. කර්මාන්තශාලා, රථවාහන, ගුවන්යානා, යුද්ධ කෝලාහල වැනි මිනිස් ක්‍රියාකාරකම් නිසා නාගරික ,ජනාකීර්ණ ප්‍රදේශවල වායු දූෂණය කෘත්‍රිම වශයෙන්ම පැතිර පවතී.



ස්වභාවික සිද්ධීන් නිසා ද වායු ගෝලයට වායු දූෂණය පැතිරී ඇත. ගං වතුර, දූවිලි, කුනාටු, හෙණ පිපිරීම් හා සුනාමි වැනි තත්ත්වයන් නිසා පරිසරයේ වායුව දූෂණය විය හැකිය. ජල ගැලීම් වැනි තත්ත්වයන් තුළ සත්ව ආදීන්ගේ මළ සිරුරු කුණු වීමෙන් මළපහ ජලයට එක් වීමෙන් දුගඳ වායුව ඇති වී පරිසරය දූෂණය විය හැකිය.

වායු දූෂණය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල පහත පරිදි දැක්විය හැකිය.

- ❖ ඕසෝන් ස්ථරය සිදුරු වීම නිසා පාරජම්බුල කිරණ පෘථිවිතලයට සෘජුවම පතිත වීම නිසා ජීවීන්ගේ පැවැත්මට හානිකර තත්ත්වයක් උදා වීම.
- ❖ වායු ගෝලය උණුසුම් වීම.
- ❖ පෙනහලු ආශ්‍රිත ස්වසන රෝග ඇති වීම හා සමේ පිළිකා ආදිය ඇති වීම.
- ❖ දේශගුණික වශයෙන් විපර්යාස ඇති වී කාලගුණය වෙනස් වීම.

03. **වනාන්තර විනාශ වීම**

04. **ස්වභාවික සම්පත් ක්ෂය වීම**

05 **පාංශුඛාදනය**

06. **ජෛව විවිධත්වය විනාශ වීම**

ඉහත සඳහන් කළ පාරිසරික ගැටලු සියල්ල සිදුවනුයේ සංවර්ධනය කරා යන මාවත තුළදීය. මෙම ගැටලු අවම කර ගැනීම සඳහා පාරිසරික අසමතුලිතතාවයන් ඇති නොවන ආකාරයෙන් ස්වභාවික සම්පත් පරිහරණය කළ යුතුය. මේ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමෝපායයන් හා වගකීම් කිහිපයක් ඇත.

- වනාන්තර විනාශය තහනම් කර නැවත වන වගා කටයුතු ආරම්භ කළ යුතුය. වනාන්තර නිසා කාබන් උරා ගනී.
- වායු ගෝලයට මුදා හරින කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය හැකිතාක් දුරට අඩු කර ගත යුතුය. (ස්වභාවික හිරු එළිය, ස්වභාවික සුළං ආදිය භාවිතා කිරීම)
- අළුත් වගා ක්‍රමයක් ඇති කිරීම හා කාබනික පොහොර හා ස්වභාවික කෙම් ක්‍රම භාවිතා කිරීම. (නව වී වගා භාවිතා කිරීම)
- දැනට ඇතිකරගෙන, සම්මත කරගෙන ඇති පාරිසරික ජාත්‍යන්තර සම්මුතිවලට අනුකූලව කටයුතු කිරීම හා එම කරුණු පිළිගැනීම.
- ඉහළ ඕසෝන් ස්ථරය විනාශ වන ක්ලෝරෝප්ලුරෝ කාබන්ඩයොක්-සයිඩ් වායු හා වෙනත් විෂ වායූන් නිපදවීමට හේතු වන ක්‍රියාකාරකම් නවතා දැමීම.
- හිරුගෙන් සෘජුවම පතිත වන පාරජම්බුල කිරණ ගැන ප්‍රචාරණය කිරීම හා දැනුවත් කිරීම.
- පාරිසරික වශයෙන් වටිනා ප්‍රාදේශීය රක්ෂිත දැඩි වන ජීවී කලාප ලෙස ප්‍රකාශ කිරීම. (සිංහරාජ, විල්පත්තු හා යාල) නකල්ස් උඩවලවේ රක්ෂිත කලාප ලෙස නම් කිරීම.
- කඳු මුදුන් එළි පෙහෙළි කිරීම හා අනවසර පදිංචි වීම් තහනම් කිරීම.
- රසායනික පළිබෝධ නාශකවලින් බැහැර වීම.

- දඩයම් කිරීම හා වන සත්ව වෙළඳාම තහනම් කිරීම.
- ජලාශ්‍රිත ප්‍රදේශ හා වෙනත් වැව් පොකුණු ඇළ දොළ ගංගා දූෂණයට ලක්වීම වැළැක්වීම.
- කර්මාන්ත ආදිය සඳහා විකල්ප බලශක්ති ක්‍රම යොදා ගැනීම.



- කර්මාන්තශාලා හා වෙනත් වාහන ආදිය මගින් පිටකරන අපද්‍රව්‍ය විධිමත් අයුරින් මුදා හැරීම.
- කැළි කසල, මළාපවාහන අපද්‍රව්‍ය නිසි අයුරින් ප්‍රතිචක්‍රීයකරණය කරවීම.

අප අවට පරිසරය ආරක්ෂා කර ගැනීම පවතින ආණ්ඩුවේ හා රට තුළ ජීවත් වන මිනිසුන්ගේ පූර්ණ වගකීමක් වේ. ඒ අනුව වර්තමාන රජය විසින් ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිරසර පරිසර ප්‍රතිපත්තියක් වශයෙන් මෙය විග්‍රහ කොට ඇත. ඒ අනුව ජෛව ගෝලය කෘත්‍රිම වෙනස් කිරීමකට හෝ බලපෑමකට ලක් කිරීමෙන් පරිසරයේ සමබරතාවය බිඳ වැටීම සැලකෙන්නේ පරිසර දූෂණයක් ලෙසය. වර්තමානයේ සිදුවන බොහෝ මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසර පද්ධතියට සිදුවන විනාශය අති විශාලය. එම නිසා අනාගත පරපුරට සුරක්ෂිත පරිසර පද්ධතියක් තුළ ජීවත් වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීමේ වගකීම අපහට පැවරී තිබේ. තිරසර පරිසර ප්‍රතිපත්තියක් යනු ''පරිසර සංරක්ෂණය පමණක් නොව සමබර වූ සමාජ, ආර්ථික පුරුදු ක්‍රියාවට නැංවීමය" වශයෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වේ. එක් එක් ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති හා උපාය මාර්ග ඒ හා අනුරූප වන ආකාරයට වෙනස්විය යුතු බව එහි සඳහන් වේ.

භූමිය, කර්මාන්ත, කසල කළමනාකරණය, වායුගෝලය, ජෛවවිවිධත්වය, සමුද්‍රසම්පත්, ජනාවාස හා නගර, පාරිසරික අධ්‍යාපනය යන ක්ෂේත්‍ර ඔස්සේ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම වැදගත් බව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වේ.

**ඩබ්. ඒ. ඩී. මංගලා චිත්‍රානී,**
පුහුණු හා පර්යේෂණ නිලධාරි,
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

# සංවර්ධනය සහ නූතන කෘෂි කර්මාන්තයේ ගමන් මග

පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලිය ලත් අපේ රට බත බුලතින් ස්වයංපෝෂිත වූවා පමණක් නොව මේ රටේ ජීවත් වූ ජනතාවට බත බුලත සපයා නිෂ්පාදනය වූ සහලින් අතිරික්තයක් විදෙස් ගත කරන්නට පවා සමත් වූ බව කියමින් අපේ ඉතිහාසය අදටත් රැව් පිළිරැව් දෙයි.

''මඩ සෝදගත් කල ගොවියා රජකමට වුවද සුදුසුය'' යන්න එද පැවතුණු මතවාදයත් සමග කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවියා රජෙක් සේ සලකා ගෞරව නාමයක් දෙන්නට තරම් එද ජනතාව නිහතමානී වූ බවට කරුණු කාරණා ඇති පදමට ඉදිරිපත් කළ හැකි ය. එය අදටත් එලෙසින්ම වලංගුය. අපේ රටේ ජනගහයෙන් විශාල ප්‍රමාණයක් තවමත් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශ ඇසුරුකරගෙන බව සඳහන් කිරීම නිවැරදියි. ඒ නිසා එද ජනතාව කැත්තේ උදලු්ලේ වාරුවට තම ශක්තිය එකතු කරමින් කෘෂිකර්මාන්තයට දුන් දයකත්වය ඉතා ඉහළ අගයක් ගනී. නමුත් අවාසනාවට හේතුව නම් එද ලාංකේය ජන සමාජයත් අද සමාජයත් දෙස සංවාදශීලී නෙතින් බලා තර්කාන්විත ගැලපුමකට ලඝු කළහොත් අද ජනතාව ක්‍රමයෙන් කෘෂිකර්මාන්තයෙන් ඈත් වී ගෙන යන බව කණගාටුවෙන් වුවද පැවසිය යුතු වේ. මෙයට හේතු පාදක වන කරුණු ගණනාවක් පෙන්වා දිය හැකිය.

වැවයි දාගැබයි, ගමයි පන්සලයි අතීතයේ අපේ මුතුන් මිත්තන්ගේ හදවතේ නින්නාද වූ වදනක් බවට අදත් අප කන වැකෙන්නේ හදවත් තුළ හැඟුම්බර අදහස් ඉස්මතු කරවමිනි. එද සමාජයේ ජීවත් වූ ජනතාවට කෘෂිකර්මාන්තයේ දී වැව මුදුන් මල්කඩ සේ වගේම ගොවියාගේ හදවත සේ සලකන්නට ඔවුන් පුරුදු පුහුණු වූවාට කිසිදු සැකයක් නැත. ඒ තුළ ගොවියා වී ගොවිතැන ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කර ගත්තා පමණක් නොව ඒ නිසාම ඔවුනොවුන් අන්‍යෝන්‍ය වශයෙන් මහා සාමකාමීත්වයකින්, සහජීවනයෙන් යුක්තව ජීවත් වූ බව නොරහසකි. මෙම තත්වය එද සමාජයේ යහ පැවැත්ම උදෙසා උපස්ථම්භක වූවාට තර්ක විතර්ක අවශ්‍ය නැත. එනිසා එද සමස්ත ජනතාවම වී ගොවිතැනින් පමණක් නොව එලවැලින් බර වූ තම කෙත් වතු අංග සම්පූර්ණව වගා කරගනිමින් ඒවායින් ලබා ගන්නා දෙයින් දවසේ තුන් වේල වස විසෙන් තොර වූ සමබල ආහාර වේලකින් යුක්තව පරිභෝජනයට ගැනීමට හුරු වූයේ අභිමානවත් ජාතියක් හැටියට එද ජනතාව අදත් අපට යමක් සිතීමට ඉතිරි කරමිනි.

මේ නිසා එද සමාජය තුළ මෙන් නොව නූතන සමස්ත සමාජය පුරාවට වෙලී පවතින පිළිකාව, දියවැඩියාව, අධික රුධිර පීඩනය, වකුගඩු රෝග වැනි බෝ නොවන භයානක රෝග බහුල විය.

නාගරීකකරණය, බටහිරකරණය, නවීකරණය සමගම ලොවපුරා කෘෂිකර්මාන්තය තුළ ගමන් මග වෙනස් වූයේ ඉතා ශීඝ්‍ර ලෙසිනි. නව රසායනික පොහොර වර්ග, නව බීජ වර්ග ඒ තුළ ගොවිතැනට එකතු වූයේ කාගේත් සිත් තුළ මුල, මැද, අග නොදනුණු තාවකාලික සතුටක් උපදවමිනි.

අද සිදුවිය යුතු සියලු දේ සිදුවෙමින් පවතී. ලෝකය පුරාම ශීඝ්‍ර ලෙසින් මේ තත්ත්වය ප්‍රචලිත වෙමින් පවතින වග වටහා ගත යුතුය. අද සමාජය තුළද මේ තත්වය කෘෂිකර්මාන්තය කෙරෙහි දැඩි ලෙස බලපාමින් තිබෙන වග කිව යුතුය. කාබනික පොහොර වෙනුවට රසායනික පොහොර යොද ගැනීමට අපේ ගොවියෝ මැලිනොවන අතර ඒ තුළ තම තමන්ගේ පහසුවත්, ආර්ථික වාසි හැටියට වී අස්වැන්න ඉහළ යාමත්, තම අතමිට සරුවීමත් සමග ගොවියා තව තවත් වගාවට රසායනික පොහොර එකතු කිරීමට කටයුතු කරන්නේ ඉතා කැමැත්තෙනි.

වර්තමානය වන විට මේ තත්ත්වය වඩාත් දැඩි ලෙස වර්ධනය වී ඇත. ගොවියා කෘෂිකර්මාන්තය තුළ තම තමන්ගේ වාසි හා මුදල් ඉපයීම අරමුණු කරගෙන නව ප්‍රවණතාවයන් සිදු කිරීමට යනවාත්

සමග සමජය තුළට විවිධ මාදිලියේ ලෙඩ රෝග ඇතුළුවෙමින් පවතින අතර මුළු රටටම බත බුලත සැපයූ රජරට ගොවියාගේ ජන ජීවිතය ද අදවන විට ක්‍රමයෙන් දුක්ඛිත තත්වයට ඇද වැටෙමින් පවතී බව පෙනේ.

එද මහ මුහුද පරයන තරමට වැව් අමුණු ඉදිවුණු රජරට වැව් අද ක්‍රමයෙන් ජලය නොමැති කාන්තාර බවට පත්වෙමින් එන බව කණගාටුවෙන් වුවද මතක් කරදීම වටී. සොබාදහම පරිසරය පිරිසකගේ විනාශකාරි ක්‍රියාකාරකම් හමුවේ අහිංසකව ඇත. විවිධ පාර්ශව මේ චෝදනා හමුවේ මුනිවත රකිමින් සිටින්නේ තමන්ගේ පැවැත්ම වෙනුවෙන් ''කලදුටුකල වල ඉහගන්නා මෙන්'' යමක් සිදුකරන්නට අවශ්‍යම නිසා විය යුතුය. තවත් සමහරක් ජාතික උරුමයක් ලෙස පවතින මේ දේවල් අනාගතය වෙනුවෙන් සුරක්‍ෂා කිරීමට තිබියදීත් අමු අමුවේම විනාශ කරමින් සිට අදළ අංශවලට කොටු වුන තැන නිවැරදිවීමට උත්සාහ ගන්නේ රට ජාතිය ආරක්ෂා කිරීමට පෙරමුණ ගැනීමට එඩිතර වූ මිනිසුන් ලෙසය. ඒ වෙනුවෙන් ඔවුන් නීතිය හමුවට වුවත් යාමට ඉදිරිපත් වන්නේ මේ දේවල්වල වටිනාකම් ගැන මොකුත් නොදන්නා අයවලුන් හැටියට ය. මෙසේ කලදවස ගෙවී යයි නම් කවුරු කුමන විදිහට ගණන් හද සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කළත් මෙහි ඇත්ත තත්ත්වය නම් අප රටේ වන ගහනය අක්කර දශම ගණන්වලට ළගාවන දවස නම් එතරම්ම ඇතක නොවේ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජලය, ධනය මෙන් රකින කාලයක් නුදුරු අනාගතයේදීම අප වෙත ළගා වෙනු ඇත. මේ සඳහා දේශන, සම්මන්ත්‍රණ, පර්යේෂණ කොතරම් සිදු වුවත් එහි ඇතුල් පැත්ත පිළිබඳ ගැටලු හා ප්‍රශ්න ඕන තරම් අප ඉදිරියේ හා නීතිය හමුවේ පැන නගින්නේ ඇතැම් පිරිසකගේ ඇති ආත්මාර්ථකාමී ක්‍රියාකලාපයන් හා දුර නොබලා කරන කටයුතුවල අනිසි ප්‍රතිඵල හැටියටයි.

අතීත ශ්‍රී විභූතිය පිළිබඳ කොතෙක් උදම් ඇනුවත් අද එයින් කිසිදු ඵලක් නැත. විය යුත්තේ එද ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගෙන අදට ගැලපෙන විවිධ ක්‍රම සක්‍රීය ලෙස ක්‍රියාවේ යෙදීමට කටයුතු කිරීම පමණි. එද සමාජයේ තරුණ පරපුර කැත්තේ උදැල්ලේ වාරුවට හුරු වූවාට සියලු දේ යාන්ත්‍රීකරණය වෙමින් පවතින අද සමාජයේ තරුණ පරපුරට කැත්තේ උදැල්ලේ වාරුව හුරුකරලීම එතරම් පහසු කාර්යයක් නොවන වග හොඳින් වටහා ගත යුතුය. විවෘත ආර්ථිකයේ ගුණ අගුණ සමාජයට පැමිණීමත් සමග තරුණ පරපුරට ඉස්පාසුවක් නැතිව එදිනෙද ජීවිතය ගැට ගසා ගැනීමට හැකි ආර්ථික වාසි සොයමින් දුවන්නට හැකි වී ඇතිකම ප්‍රධාන කරුණක් ලෙස පෙන්වා දිය හැකිය. ඒ නිසාම මිනිස් ශ්‍රමයේ හිඟතාවය කෘෂිකර්මාන්තය කෙරෙහි දැඩි ලෙස බලපාන බව ඉතාම පැහැදිලිය. එනිසාම අද සමාජයේ අය කැත්තේ උදැල්ලේ වාරුවට වඩා ඉහළ අගයකින් යන්ත්‍රයේ ශක්තිය උපයෝගී කරගෙන එයින් විපුල ප්‍රයෝජනය ගැනීමට හුරුකළ යුතුමය. විශේෂයෙන් අද තරුණ පරපුර කෘෂිකර්මාන්තයේ නියැලෙන විට ඔවුනොවුන් අතර මහත් අභිමානයක් ගොඩනැගීමට කටයුතු කළ යුතු බවත්, රටේ කෘෂිකර්මාන්තයට හා ජාතික ආදයමට ඉහළ අගයක් එකතු කරමින් කටයුතු කරන මේ පිරිස රටේ ඉහළම සම්පත බවත් රටටම හඬගා කියමින් ඔවුන් ජාතික තලය දක්වාම ඔසවා තබා ඇගයීමට අවශ්‍ය මංපෙත් විවර කර දීමට වගකිව යුත්තන් පෙරමුණ ගතයුතු බවත් පෙන්වා දීම කාලෝචිතය. ඒ අනුව කෘෂිකර්මාන්තයේ යෙදෙන සමස්ත ජනතාවම නිරතුරු ඇගයීමට ලක් කිරීමටත් ඒ වෙනුවෙන් නොයෙක් ආකාරයෙන් සේවා පහසුකම් සපයමින් මග පෙන්වන රාජ්‍ය යාන්ත්‍රණයේ හා පෞද්ගලික අංශයේ සියලුම මෙවලම් කෘෂිකාර්මික බිමට ගෙන එමින් කෘෂිකාර්මික සංවර්ධනයේ නියැලෙන සියලුම ක්ෂේත්‍රවල නිලධාරි පිරිස් ද නිරතුරු ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය කටයුතු යෙදිය යුතුය. මෙම කාරණාවේ දී ඉහළ නිලධාරියා සිට පහළ කෘෂිකාර්මික බිමේ සිටින නිලධාරියා දක්වාම ඇගයීමට කටයුතු කිරීමත් සැලකිල්ලෙන්ම කිරීමට අදළ බලධාරීන් වගබලා ගත යුතුය. ඒ අනුව ද මෙහි ප්‍රධාන වගකීම රාජ්‍ය අංශය මැදිහත්වීම තුළ සිදුවිය යුත්තකි.

එසේම මෙහි ආර්ථික පැත්ත දෙස බලාම ක්‍රියාත්මක නොවී ගොවියාගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍යය තත්ත්වයට හිතකර පරිද්දෙන් කිරා මැන බලා සමබරව කටයුතු කිරීමටත් වගබලා ගත යුතු වීම අවශ්‍යම කරුණකි. එයට අවශ්‍ය සාධනීය සැලසුම් ජන සමාජයට හිතකර පරිද්දෙන් ස්ථානගත කිරීමටත් ඒ තුළ ජනතාව සක්‍රිය ලෙස ඇද බැඳ තබා කෘෂිකාර්මික සංවර්ධනයට එකතු වී ඇති සියලුම නිෂ්පාදන ආහාර ද්‍රව්‍ය වස විසෙන් පිරි ඒවා බවත් එම ආහාර පරිභෝජනය කිරීමෙන් වැලඳෙන රෝග පිළිබඳව මනා අවබෝධයක් සමස්ත ජනතාවට අත්කර දීමට අදළ ආයතනික අංශ ඉදිරිපත් වන්නේ තමන් සතු වගකීම

සියයට සියයක්ම ඉටුකර සමාජගත කිරීමට අවශ්‍යම බැවිනි. එය අදට ගැලපෙන එලදයීම කරුණ වන්නේ ය. ඒ පිළිබඳව අපේ ප්‍රණාමය ද පිරිනැමීම සියයට සියයක්ම ඒ එසේමය. ඒ නිසාම අද ජනතාව ගමේ ගෙවත්තේ කාබනික පොහොර ඇසුරෙන් නිෂ්පාදනය වෙන ආහාර ද්‍රව්‍ය මිල ගණන් නොබලාම පරිභෝජනයට ගැනීමට මහත් රුචිකත්වයක් දක්වන බව ඉතාම පැහැදිලිව පෙනේ. ඒ නිසා වී ගොවිතැන වගේම ගෙවතු වගාව, ගෙවතු සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය, සේවා පහසුකම් සැපයීම හා රාජ්‍ය යාන්ත්‍රණයේ සක්‍රීය දයකත්වය, මැදිහත්වීම හා එයට නිසි සාධනීය සැලසුම් යෙදීම ඊළඟ කරුණ හැටියට පෙන්වා දිය හැකිය.

නමුත් කණගාටුවට කරුණ වන්නේ වන සතුන්ගේ ග්‍රහණයෙන් මෙසේ නිෂ්පාදනය වෙන ආහාර ද්‍රව්‍ය හරි හරියට විනාශ මුඛයට යාමයි. ඒ නිසාද වර්තමාන ගොවියා කෘෂිකර්මාන්තයෙන් ඈත්වීමට තවත් හේතුවක් හැටියට එය බලපාන බව පෙන්වා දීමට හැකිය. වල් ඌරු, රිලා, දඬුලේනා, අලි මිනිස් ගැටුම්, වැනි විවිධ දේ තුළින් කෘෂිකර්මාන්තයට වෙන හානිය සුළුපටු නොවන අතරම අදවන විට ගොවීන්ගේ ජීවිතවලට ද තර්ජනයක් වෙමින් එන වග සඳහන් කිරීම වටී. ඒ නිසා මෙම ගැටුම් තුළින් අසරණ ගොවීන්ට වන හානිය දෙස බලා එවැනි දේ සිදුවීම වැලැක්වීමට වැට බැඳීමේ නිසි සැලසුම් හැදීමට හා ක්‍රියාත්මක කිරීමට අදවෙන තුරුත් අදළ අංශ අපොහොසත් වීම කණගාටුවට හේතුවන තවත් කරුණකි. කුමන ආකාරයේ ප්‍රශ්න බාධක විත් ඇඟමත පැටවුනත් ගොවිකමට හුරු වුණු ගොවියෝ ගොවිතැන අත්නොහරින්නේ තමන්ගේ යුතුකම, වගකීම, ගොවිතැන වෙනුවෙන් ඉටුකළ යුතු බවත් හා ගොවිතැන ජීවනෝපාය කරගත්තද ඔවුන් රටේ ආර්ථිකයට විශාල ආදයමක් එකතු කරන හා රටේ සමස්ත ජනතාවට බත බුලත සපයන උදර මිනිසුන් හැටියටමය. ඒ නිසා ජාතියේ ගෞරවය අදත් මේ ගොවීන් හට හිමිකර දිය යුතු බව නැවතත් අදල අංශවල ප්‍රධානීන්ට මතක් කර දීම අපගේ වගකීමකි.

මානව සංහතියම ආහාරය කරණ කොට ජීවත් වෙති. සියලු සත්ත්වයෝ ආහාරයෙන්ම ජීවත් වෙති. හැබැයි මානවයා සඳහා ආහාර නිෂ්පාදනය කිරිමේදී අදළ අය ඒ මානවයාගේ සෞඛ්‍ය තත්වයට හිතකර පරිද්දෙන් නිෂ්පාදනය කර දීම ජාතික වගකීමක් බව වටහා ගත යුතුය. වෙළෙඳපොල දෙස හැරී බැලුවොත් පාරිභෝගිකයාට තම සෞඛ්‍යයට හිතකර පරිද්දෙන් ආහාර වැනි පාරිභෝගික ද්‍රව්‍ය තෝරා මිලදී ගැනීම පිළිබඳ මහත් ගැටලුවක් ඇති බව පෙනේ. මුද්‍රිත මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය, මගින් ආහාර ද්‍රව්‍ය සඳහා ප්‍රචාරණය කරන වෙළඳ දැන්වීම්වල කිසිම ක්‍රමවත් බවක් නොමැති වීම, අදළ සෞඛ්‍ය අංශවල නිර්දේශයන් නිසි ගැලපීමකින් තොරවීම හා ජනතාව අතරට එන මෙම පාරිභෝගික භාණ්ඩ වෙනුවෙන් අදළ වෛද්‍ය උපදෙස්වල පරස්පර භාවයෙන් යුක්තව වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමත් හේතු කොට ගෙනය. මෙම ඛේදනීය තත්වය සමස්ත ජනතාවගේ ජීවිතවලට එල්ලවන මරු පහරක් ලෙස සැලකීමට උවමනාය.

ඉහත සඳහන් කරුණු නිසි ලෙස, කළමනාකරණය කර නිවැරදි කිරීමට නම් රාජ්‍ය අංශයේ මැදිහත්වීම අනිවාර්ය බව නැවත නැවතත් අවධාරණය කරමු. ලාභ ලැබීමේ මූලික පදනම හඳුගෙන භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන සඳහා හා ඒ වෙනුවෙන් මුල් අසුන්වල අසුන් ගෙන ඉන්න අය වෙනුවෙන් මේ කරුණු කියා පෑම බීරි අලීන්ට වීණා වයනවා වැනිය. කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා වර්තමානයේ රාජ්‍ය යාන්ත්‍රණයේ මැදිහත්වීම තරමක් සතුටු දයක වුවත් එයද සැලසුම්සහගත නොවීම පිළිබඳව ඇතිවන අපහසුතාවයන් සෘජුවම ගොවියාට බලපාන අතර ඒ ලැබෙන සේවා පහසුකම වුවද නිසි කළමනාකාරිත්වයෙන් යුක්තව සිදුවුවහොත් එයද ගොවියාට යම් අස්වැසිල්ලක් වන බව මතක් කරමු. ඒ නිසා රටේ කෘෂිකර්මික ආර්ථිකයට මනා දයකත්වයක් දෙනු ලබන ගොවියාගේ ජන ජීවිතය නංවාලීම වෙනුවෙන් ඒ ඒ අවස්ථාවන්ට අනුකූල වෙන ලෙස නොයෙක් කතා නිර්මාණය කර ඔවුන්ගේ හදවත් සනහාලීමට උත්සාහ ගන්නවා වෙනුවට ඒ කතා සක්‍රිය ලෙස ක්‍රියාවට නැංවී ම තුළින් ඔවුන්ගේ මුළු ජීවිතයම සනහාලීමට නම් රාජ්‍ය යාන්ත්‍රණයේ මැදිහත්වීම අනිවාර්ය බව නැවතත් මතක් කරමු.

මෙකී කරුණුවලින් විපුල ප්‍රයෝජන ගැනීමට නම් ඒ ඒ ප්‍රදේශවල ජීවත් වන කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවියාගේ අදහස්වලට සවන් දෙමින් අදළ ප්‍රදේශවලට අනුගත වී ඒ ප්‍රදේශයට ගැලපෙන කෘෂිකාර්මික භෝග ද ගොවියා සෘජුවම කෘෂිකර්මාන්තයට දයක කර ගැනීමට හැකිවන පරිදි ඔවුන්ගේ අදහස් පහළ සිට ඉහළට

ගමන් කරන සාධනීය ක්‍රමවේදයකට යායුතු බවද මතක් කර දෙමු.

ඉදින් මෙකී කරුණුවලට සැලසුම් ගෙන ඒමට අදාළ ක්ෂේත්‍රවල වගකිව යුතු පිරිස් ඉක්මන් විසඳුම් නොගතහොත් මනා සැලසුම් රහිත වැඩවලට අතපොවා පුළුස්සා ගන්නවා හැර තවත් යමක් කිරීමට ඉතුරුවේවී ද? ඒ නිසා ක්‍රමානුකූල සැලසුම්වලට නොගියහොත් වන්නේ එක් පසෙකින් ජන ජීවිතය පියවරෙන් පියවරට කඩා හැලීමත්, තව පසෙකින් දේශීය කෘෂිකර්මාන්තයට කනකොකා හැඬලීම වළක්වා ලීමට නොහැකිවීමත් ය.

මේ පිළිබඳව යමක් සිතීමට අදාළ අංශ හා අදාළ බලධාරීන් අදත් ප්‍රමාද වී නොමැති බව පසක් කරදීම අපගේ ජාතික වගකීමක් කොට සලකමු.

**එම්. හේමචන්ද්‍ර විජේසූරිය,**
විශ්‍රාමලත් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර.

# ගෝලීයකරණ අභියෝග; සංස්කෘතික වෙනස්වීම් හමුවේ සමාජ වැඩ පරිචයේ ඇති වැදගත්කම

1. හැඳින්වීම

වර්තමානය වන විට ස්වාධීන සහ ස්ථාවර සංස්කෘතීන් පිළිබඳ සංකල්පය අභාවයට යමින් පවතී. ගෝලීයකරණ ප්‍රවණතා ඒ සඳහා බලපා ඇති ප්‍රධාන සාධක ලෙස ගිණිය හැක. ඒ අතර සංචාරක කර්මාන්තයේ වර්ධනය, අන්තර්ජාල ප්‍රජාවක් බිහිවීම, බහුජාතික සමාගම්වල ව්‍යාප්තිය, ගෝලීය ආයතන පද්ධතියක් නිර්මාණය වීම, නිදහස් ආර්ථිකය හා වෙළෙඳපොල වැනි ගෝලීය ප්‍රවණතාවන්හි කාර්යභාරය වෙසෙස්ය. මෙකී අභියෝග හමුවේ සංස්කෘතිය යන්න අස්ථායී හා තිරශ්චීන දෙයක් සේ පෙනුන ද සංවර්ධන දෘෂ්ටිකෝණයෙන් බැලීමේදී එය රටක ප්‍රගමනයේ සංකේතයක් සේ හඳුනාගනී.

සංස්කෘතික වෙනස්වීම් කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම හා සමාජ වැඩ පරිචය ප්‍රධාන වශයෙන්ම ආචාරධර්ම හා සම්බන්ධ වේ. සමාජ වැඩ වෘත්තිය මගින් වෙනස්කම් කිරීමකින් තොරව මූලික මානව හිමිකම් සහ සමාජ සාධාරණත්වයේ මූලධර්ම ක්‍රියාත්මක කිරීම, ජාතිය, ජනවාර්ගිකත්වය, ජාතිකත්වය, ස්ත්‍රී පුරුෂභාවය, වයස හෝ සමාජ පන්තිය, ප්‍රාදේශිකත්වය වැනි ස්තරගත සාධක මත පදනම් නොවූ වෘත්තීයමය මැදිහත්වීමේ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරනු ලබයි. සමාජ වැඩ මගින් ජනතාවගේ සුභසාධනය වැඩිදියුණු කිරීමට, අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට, අවදනමට ලක්විය හැකි හා ආන්තිකකරණයට ලක්විය හැකි කාන්තාවන්, වැඩිහිටියන්, ආබාධිතයන්, දරුවන් කෙරෙහි මැදිහත්වීමට තවදුරටත් කටයුතු කරනු ලබන අතර මෙවැන්නන් කෙරෙහි රාජ්‍ය අවධානය යොමු කිරීම, එනම් ප්‍රතිපත්ති සම්පාදනයේදී සක්‍රිය මැදිහත්කරණයක් සිදු කිරීම හා සම්පත් හා සේවා සම්බන්ධීකරණය සිදු කිරීමද සිදු කරනු ලබයි. විශේෂයෙන්ම වෙනස් වන සංස්කෘතික තත්ත්වයන් ආමන්ත්‍රණය කරමින් නව ප්‍රවේශ අනුගමනය කරමින් විධිමත් හා ප්‍රජා හිතකාමී ප්‍රවේශ හා මූලධර්ම භාවිතා කරමින් එකී ගැටලු විසඳාලීම සඳහා මැදිහත්වීම සමාජ වැඩ වෘත්තිකයන්ගෙන් සිදුවන්නකි. එහිදී සමාජ වැඩ පරිචය තුළ ඇතුලත් සමාජ වැඩ පර්යේෂණ අත්‍යවශය අංගයකි. පවත්නා සමාජ ප්‍රශ්නවාද විෂයයන් පිළිබඳ පුළුල් විග්‍රහයක් සැපයීම පමණක් නොව ඒවා අවම කරගත හැකි ආකාරයේ මැදිහත්කරණයන් හා ක්‍රියාකාරකම් පෙන්වාදීමට සමාජ වැඩ පර්යේෂණ මගින් හැකියාවක් ඇත. එය සෙසු සමාජීය විද්‍යා පර්යේෂණයන්ට වඩා වෙනස් මාවතක් ලෙස පෙන්වා දිය හැකිය.

2. **ගෝලීයකරණය සහ සංස්කෘතික වෙනස්වීම් සමග සමාජ වැඩ පරිචය සම්බන්ධ වන ආකාරය**

ගෝලීයකරණය යනු නිරන්තරයෙන්ම සාකච්ඡා කරනු ලබන එහෙත් කලාතුරකින් නිශ්චය කොට දක්වා ඇති සංසිද්ධියක් වශයෙන් ඉයන් ගෝල්ඩින් සහ කෙනත් රෙයිනර්ට් යන කතුවරුන් විසින් හඳුන්වා ඇත. (Goldin and Reinert, 2006, p.2). ගෝලීයකරණය යන්න ලොව පුරා නිරන්තරයෙන් භාවිත කරන පොදු යෙදුමක් බවට පත් වී තිබුණ ද නිශ්චිත අර්ථයක් ලබාදීම අසීරු වී ඇති බව උක්ත අදහස තුළින් ගම්‍ය වේ. එසේ වුවත් ගෝලීයකරණ ක්‍රියාවලිය යන්න නෙඩර්වීන් (Jan Nederveen Pieterse, 1993) හඳුන්වා දෙන්නේ දෙමුහුන්කරණ ක්‍රියාවලියක් ලෙසයි. එයින් අර්ථවත් කරන්නේ පවත්නා භාවිතයන්ගෙන් ආකෘති වෙන් වී නව භාවිතයන් සමග නව ආකෘති නැවත සම්බන්ධ වන ආකාරයක් ලෙසයි. දෙමුහුන්කරණ සංකල්පය තුළ මූලික වශයෙන් සංස්කෘතීන් අභ්‍යන්තරව සමජාතීය හා බාහිර වශයෙන් වෙනස් ලෙස සලකයි. දේශීය පක්ෂපාතීත්ව තහවුරු කිරීමට මිනිසුන්ට අවශ්‍ය නමුත් ගෝලීය වටිනාකම් හා ජීවන රටාවන් බෙදාහැරීමට අවශ්‍ය බැවින් අනන්‍යතා රටාවන් වඩාත් සංකීර්ණ වන බව ඔහු සලකයි. මේ සියල්ල අවසානයේ පෙන්වා දෙන්නේ සංස්කෘතික අත්දැකීම් සංස්කෘතික ඒකාකාරීත්වයේ හා ප්‍රමිතිකරණයේ දිශාවකට ගමන් නොකරණ බවයි. දේශීය සංස්කෘතීන් ගොඩනැගෙන්නේ බටහිරින් ආනයනය කරන සංස්කෘතිකාංගයන්ගෙන් බව මෙයින් ගම්‍ය වුවද ගෝලීය වශයෙන් මැදිහත් වූ සාමාන්‍යකරණය කරන ලද සංස්කෘතික දෙමුහුන් වෙනත් නව බලවේගයන් ඉස්මතු වන තෙක් රැඳී සිටිමින් ඒවා ඉවත් කර නැවත සමජාතීයකරණය හෝ අන්ත ප්‍රතිවිරුද්ධ විෂමජාතීයතාව කරා ගමන්කළ හැකිය. සමාජ වැඩ වෘත්තිකයන්ගේ අවශ්‍යතාව

මතුවන්නේ මෙවැනි සංසිද්ධීන් මත පුද්ගලයන් තුළ නිර්මාණය වන පුද්ගලාර්ථවාදය, පසුගාමී බව හා හුදෙකලා බව වැනි මානසික තත්ත්වයන්ට ධනාත්මක දිශානතියක් පෙන්නුම් කිරීමටය.

### 3. ගෝලීයකරණ අභියෝග හා සංස්කෘතික වෙනස්වීම් හමුවේ සමාජ වැඩ පරිචයේ වැදගත්කම

මිනිස් සමාජය පෙරට ගෙන යනු ලබන ප්‍රමුඛ කාරණය නිෂ්පාදනයයි. සමාජ ක්‍රමයේ විපරිණාමය තුළ නිෂ්පාදන ක්‍රමයද වෙනස්කම් රැසකට බඳුන් විය. ඒ හේතුවෙන් සමාජය තුළ ව්‍යුහාත්මක වශයෙන් සිදු වූ වෙනස්කම් ජන ජීවිතය හා ඒ හා සබැඳි ජන සංස්කෘතිය අභියෝගයට ලක් කර ඇත. ගෝලීයකරණය යනු පුද්ගලයන් අතර අන්තර් රඳාපැවැත්ම, ඒකාබද්ධතාවය සහ අන්තර් ක්‍රියාකාරීත්වය වැඩි කිරීමේ සංකීර්ණ ක්‍රියාවලියකි. පසුගිය ශතවර්ෂ කිහිපය තුළ ගෝලීයකරණයේ බලපෑම ලොව පුරා ව්‍යාප්ත වීමත් සමග සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික යන ප්‍රධාන ක්ෂේත්‍රයන් පමණක් නොව දැනුම, තාක්ෂණය යනාදී බුද්ධිමය ක්ෂේත්‍රවල විපර්යාසයන් රැසක් සිදුවිය. වෙනස් වන සමාජ, දේශපාලන හා සංස්කෘතික සන්දර්භයන්ට අනුවර්තනය වන නවීන වෘත්තියක් ලෙස ද, අනන්‍යතා පමණක් නොව පුද්ගලයන්ගෙන් සුසැදි සමාජ හා සංස්කෘතික පුද්ගල අනන්‍යතාවයන්ට ගරු කරමින් නිශේධනාත්මක වෙනස්වීම් තුළ සාධනීය පරිවර්තනයක් අපේක්ෂා කරන වෘත්තිකයක් ලෙස ද සමාජ වැඩ වෘත්තිය ගෝලීය වශයෙන් පිළිගැනීමකට ලක් වේ. සමාජ වැඩ දැනුම, වටිනාකම් සහ ආචාරධර්ම, වෘත්තීය කුසලතා සහ සමාජ වැඩ ක්‍රියාවලිය යනු පුද්ගලයන්, පවුල් හෝ කණ්ඩායම් මුහුණ දෙන කාලීන ගැටලු සඳහා සාධනීය හා වෘත්තිය මැදිහත්වීමක් සිදුකිරීමේදී උපයෝගී කරගන්නා ප්‍රධාන සංරචකයන් ය. සමාජීය විද්‍යා ශික්ෂණයන් අතර සමාජ වැඩ විෂය ප්‍රායෝගික විෂයයක් වන්නේ ද පුද්ගල, පවුල්, කණ්ඩායම් සහ ප්‍රජාවට ඔවුන්ගේ පුද්ගලික හා සාමුහික යහපැවැත්ම වැඩිදියුණු කිරීමට උපකාර කිරීම සම්බන්ධ වෘත්තියක් වන නිසාවෙනි. ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සහ ඔවුන්ගේම සම්පත් සහ ප්‍රජාවේ හැකියාවන් වර්ධනය කරගැනීමට පුද්ගලයන්ට උපකාර කිරීම එහි අරමුණයි. විශේෂයෙන්ම සමාජ වැඩ යනු පුද්ගල හා පෞද්ගලික ගැටලු කෙරෙහි පමණක් නොව වෙනස් වන සමාජ තත්ත්වයන් මත ගොඩනැගෙන සංස්කෘතික විපරිවර්තනයක් හෝ සමාජවාද විෂයන් සම්බන්ධ පුළුල් හා ප්‍රායෝගික මැදිහත්වීමක් සිදුකරන වෘත්තීයමය ශික්ෂණයක් ලෙස හඳුන්වා දිය හැකිය. ගෝලීයකරණය ආර්ථික හා වාණිජ ලෝකයට පමණක් සම්බන්ධ දුරස්ථ ක්‍රියාවලියක් ලෙස පෙනේ. කෙසේ වෙතත් එය ලොව පුරා සමාජයන්හි ජනතාවගේ ජීවන තත්ත්වයන් හා ජන සංස්කෘතියට සිදු කරන බලපෑම් තක්සේරුකරණයකට ලක් කර නොමැත. එහෙයින් හුදෙක් ආර්ථික වර්ධනය පමණක් නොව ජීවන තත්ත්වයන් පිළිබඳව ද නැවත සිතා බැලිය යුතු බව කාලීන වෙනස්වීම් මගින් පැහැදිලි කරගත හැකිය. එමෙන්ම ධනවත් හා දරිද්‍රතාවයෙන් පෙළෙන රාජ්‍යයන්හි පවත්නා වෙනස්කම් අධ්‍යයනය කිරීමෙන් ඔබ්බට ගොස් ඒ සඳහා මැදිහත්කරණය සිදු කිරීම සඳහා සමාජ වැඩ වෘත්තිකයන්ගේ අවශ්‍යතාව දැඩිව මතුව ඇත. විශේයෙන්ම නව සමාජ ප්‍රවණතා හා ගැටලු අධ්‍යයනය කිරීමෙන් ඔබ්බට ගොස් ඒ සඳහා මැදිහත්කරණය සිදු කිරීම සඳහා සමාජ වැඩ වෘත්තිකයන්ගේ අවශ්‍යතාවය දැඩිව මතුව ඇත. විශේෂයෙන්ම නව සමාජ ප්‍රවණතා හා ගැටලු අධ්‍යයනය කරමින් ක්ෂුද්‍ර, මධ්‍ය හා සාර්ව මට්ටමේ ක්‍රියාකාරකම් රාශියක් සමාජ වැඩ වෘත්තිකයන් විසින් සමාජ සන්දර්භය තුළ සිදු කිරීම කාලීන අවශ්‍යතාවයකි. ගෝලීයකරණයේ ප්‍රවණතා සෑම රටකම ග්‍රාමීය හා නාගරික දෙඅංශයටම සාධනීය හෝ නිශේධනීය ලෙස බලපෑම් කළ ද එමගින් ප්‍රතිලාභ ලබන හෝ නොලබන ප්‍රජාව ඉලක්ක කරගනිමින් සේවා සැපයීම, විවිධ පුද්ගල, පවුල් හා කණ්ඩායම් තුළ මතුවන ගැටලු අවම කිරීම, ජනතා හිතවාදී ක්‍රමවේද හරහා ඔවුන්ගේ සුභසාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සමාජ වැඩකරුවන් විසින් සිදු කළ යුතු හා ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යභාරයක් වී ඇත. එහෙයින් නව ගෝලීයකරණ ප්‍රවණතා පිළිබඳ සහ දේශීය සංස්කෘතින් හි වෙනස්වීම් පිළිබඳ සවිස්තර අවධානයක් හා අවබෝධයක් පැවතීම ද අත්‍යවශ්‍ය කරුණකි. සමාජ වැඩ යනු දේශීය සංස්කෘතිකමය භාවිතාවේ මට්ටම්වල තිරසර මාවතක් සමග සම්බන්ධතාවය ඇති, ප්‍රවර්ධනය හා නිරත වියහැකි වෘත්තීන්ගෙන් එකකි (Social work is one of the few professions in a position to promote and engage in a Sustained way with relationships at the level of local cultural practice) (Webb 2003, p. 17). ගෝලීයකරණය මගින් සමස්ත සමාජ ක්‍රමයම සාධනීය දිශානතියකට ගෙන ගිය ද පාරම්පරික හා දේශීය වශයෙන් පවත්නා සංස්කෘතිය වෙනස්වීමේදී ආචාරධාර්මික හා මානුෂීය ගුණාංගවලින් ඒ දෙස බැලීමටත්, පවත්නා සමාජ ක්‍රමයේ සාරධර්ම හා අනෙකුත් සංස්කෘතිකාංග කෙරෙහි සාවධාන වීමටත් සමාජ වැඩකරුවාට කුසලතාවයක් හා මනා බුද්ධියක් පැවතිය යුතුය. ගෝලීයකරණයේ බලපෑමෙන්

ග්‍රාමීය සමාජ පරිසරයන්හි දේශීය සංස්කෘතීන් බිඳ වැටීමට හෝ යටත්කරගැනීමට හෝ බලපෑම් කිරීමකට ලක්ව තිබේ නම් වෘත්තිකයෙක් ලෙස මිනිසුන් සමග වැඩකිරීමේ කුසලතා මත පදනම් ව ඒ සඳහා සාධනීය මැදිහත්වීමක් සිදු කිරීමට සමාජ වැඩකරුවන්ට හැකි විය යුතු ය. ඒ සඳහා සමාජ වැඩ ප්‍රවේශයන් භාවිතයට ගත හැකිය.

## 4. සමාලෝචනය

ලොව පුරා ගෝලීයකරණය ක්‍රියාවලිය පැනවීම සඳහා බටහිර රාජ්‍ය මැදිහත්වීම, නිදහස් වෙළඳපොල ආර්ථිකය හරහා ගෝලීයකරණය යුගය ඇරඹීම මෙරට සමාජ, සංස්කෘතික සන්දර්භයන්හි වෙනස්කම් ජනිත කිරීමට තුඩු දුන් කරුණු වන අතර ශ්‍රී ලංකා සමාජයේ පරිණාමීය තත්ත්වය විමර්ශනය කිරීම තුළ ගෝලීයකරණය සහ ශ්‍රී ලංකා සංස්කෘතික වෙනස්වීම් පිළිබඳ හැදෑරීමෙන් පෙනී යන්නේ ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ සංස්කෘතික විපර්යාස ක්‍රියාවලියක් මෙරට සමාජයෙහි පවතින බවයි. සමාජ පරිණාමයේ ස්වභාවය හේතුවෙන් ඇතැම් වෙනස්කම් ක්‍රමයෙන් සිදුවනු ක්‍රියාවලියක් ලෙස හඳුනාගත හැකි අතර සමහර වෙනස්කම් බටහිර ලෝකයේ සිදුවෙමින් පවතින ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස පැහැදිලි කළ හැකිය. (Pannilage, 2016, p. 458). එම ප්‍රතිසංස්කරණ ගෝලීයකරණ ක්‍රියාවලිය හරහා මෙරටට පැමිණීමත් සමග සිදු වූ වෙනස්කම් බොහොමයකි. එයින් පෙනී යන්නේ ගෝලීයකරණය හරහා සෑම රටකම ආර්ථික, සමාජ, දේශපාලන හා සංස්කෘතික වශයෙන් විප්ලවීය වෙනස්කම් ජනිත කරනු ලබන බවයි. විශේෂයෙන්ම සුභසාධන රාජ්‍ය තුළ ප්‍රබල වෙනස්කම් සිදු කරනු ලැබීමයි. මෙවැනි රාජ්‍ය තුළ ජනතාවගේ වැඩිවන අවශ්‍යතා, ගැටලු හා ඒ වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම තුළ සමාජ පිරිවැය වැඩිවීම වැනි ක්ෂුද්‍ර හා සාර්ව මට්ටමේ තත්ත්වයන් තේරුම්ගැනීමට හා සමාජ වගකීම් පිළිබඳ අවධානය යොමුකරමින් ජනතා සුභසාධනය ඇති කිරීමටත්, රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීම සඳහා සහාය වීමටත් සමාජ වැඩ වෘත්තිකයන්ගේ වැදගත්කම් ප්‍රමාණය කළ හැකිය. එහිදී සමානාත්මතාවය, සමතාවය, සාධාරණත්වය වැනි මූලධර්මයන් කෙරෙහි නැඹුරු වෙමින් මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිමින් සංස්කෘතික වෙනස්වීම් හමුවේ පීඩාවට හෝ ව්‍යාකූලත්වයට පත් වන පුද්ගලයා, පවුල, කණ්ඩායම් හෝ ප්‍රජාව ධනාත්මක මාවතකට ගෙන ඒමට හැකිවනු ඇත.

සංස්කෘතිය යනු මිනිස් ජීවිතයේ පදනමයි. සංස්කෘතියේ ක්‍රියාකාරීත්වය තුළින් කණ්ඩායමක සාමාජිකයන්ට සමාජ සබඳතා පවත්වාගැනීමටත්, ඔවුන්ගේ පැවැත්මේ අවශ්‍යතා සපුරාලීමටත් එකිනෙකා සමග හොඳින් සම්බන්ධවීමටත් හැකිවන හෙයින් ඒ කෙරෙහි සංවේදී වෙමින් සාමූහිකත්වය, සදාචාරය හා එකමුතුකම වැනි අගනාකම් මත පදනම්ව මානව සම්බන්ධතාවන්හි වැදගත්කම අවධාරණය කරමින් පවත්නා ව්‍යාකූලත්වයන් වෙනස් කිරීමට පුද්ගල, පවුල් හෝ ප්‍රජාවට උපකාර කිරීම සමජ වැඩ පරිචය හරහා සිදු වේ. එසේම සංස්කෘතික අධිරාජ්‍යවාදය වැනි තත්ත්වයන් සමාජ වැඩ දෘෂ්ටිවාදයේ ලා ගිණිය හැකි නම් ගෝලීයකරණය ද ජනතා හිතවාදී තත්ත්වයකට පරිවර්තනය කළ හැකි බව අපගේ අදහසයි.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


Goldin, I., Reinert, K. (2006). Globalization for Development.New York : The World Bank Washington and Palgrave Macmillan.

Pieterse, J. N. (1994)., Globalisation as Hybridisation. International Sociology, 9(2), 161-184. Retrieved 25.09.2020 from https : //doi.org/10.1177/026858094009002003

UKEssays. (2018). Impact of Globalization on Culture//Essay. Retrieved 25.09.2020 from https://www.ukessays.com/essays/cultural-studies/globalization-and-its-impact-on-culture-cultural-studies-essay.php?vref=1

Upali, Pannilage. (2016). Globalisation and Construction of Local Culture in Rural Sri Lanka. Sociology Study. 6(7), 448-461. Retrieved 25.09.2020 from https ://doi..org/10.17265/2159-5526/2016.07.003.

Webb, S. A. (2003). Local orders and global chaos in social work. European Journal of Social Work, 6(2), 191-204. Retrieved 25.09.2020 from https ://citeserrx.ist.psu.edu/viewdoc/download? doi=10.1.1.584.5379 & rep = 1 & type = pdf



**ඒ. එච්. ඉන්දික සංජීව**[1]
පර්යේෂණ සහකාර, සමාජ සංවර්ධන ප්‍රතිපත්ති,
පර්යේෂණ හා ප්‍රකාශන අංශය,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
indikasanjeewa@nisd.ac.lk

**ආචාර්ය චමිලා සිරිවර්ධන**[2]
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනය පිළිබඳ
අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
chamilas@kln.ac.lk

# හඳුනා ගනිමුද කවුද මේ නිශා

අද වන විට කහ (Turmeric - *Curcuma longa*) නිවර්තන කලාපයේ බහුලව වගා කරන අතර විවිධ සංස්කෘතීන් හා රටවල විවිධ නම්වලින් හඳුන්වයි.  උතුරු ඉන්දියාවේ කහ පොදුවේ "හල්ඩි" ලෙස හඳුන්වනු ලබන අතර එය හරිද්‍රා යන සංස්කෘත භාෂාවෙන් උපුටා ගත් වචනයක් වෙයි. දකුණු ඉන්දියාවේදී එය "මංජල්" ලෙස හැඳින්වේ. බොහෝ සංස්කෘතීන්වල කහවල නමට පදනම් වී ඇත්තේ කර්කුමා යන ලතින් වචනය යි. සංස්කෘත බසින් නිශා යන සොඳුරු නාමයෙන් හඳුන්වන මෙම සුවිශේෂි කුළුබඩුව හොඳින් හඳුනා ගැනීම වර්තමානයේදී ඉතා වැදගත් වේ.

(රන්වන් පැහැය), සර්වනාවර (රන්වන් පැහැය විදහා දක්වයි), තමසිනි (රාත්‍රිය තරම් ලස්සනයි), උමාවරා (පාර්වතී, ශිව දෙවියන්ගේ බිරිඳ), වර්නා දත්‍රි (ශරීර පැහැය වැඩි කරන), වර්නිනි (වර්ණය ලබා දෙන) සහ යුවතී (තරුණිය) යන නම් ඒවා අතරින් කිහිපයකි.

බොහෝ කුළුබඩු මෙන් කහ ද හෙළ වෙදකමේ, යුනානි හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ දීර්ඝ ඉතිහාසයක් ඇති කුළුබඩුවකි. කහ මූලික වශයෙන් වගා කරනු ලබන්නේ ඉන්දියාවේ සහ ගිනිකොනදිග හා දකුණු ආසියානු කලාපයේ වන අතර එම ප්‍රදේශ නිජබිම කරගත් සපුෂ්ප ශාකයකි.



අම්පාර ගෝනගල ප්‍රදේශයේ කහ වගාවක් සහ අස්වැන්න

සංස්කෘත භාෂාවෙන් කහවලට අවම වශයෙන් වෙනස් නම් 53 ක් පමණ ඇත. භද්‍රා (සුබ හෝ වාසනාවන්ත), ගෞරි (පැහැපත් කරන්නී), ජයන්ති (රෝගවලින් ජය ගන්නා), ලක්ෂ්මි (සමෘද්ධිය), මංගල්‍යා (සුබ),නිශා (රාත්‍රිය), නිශාක්‍ය (රාත්‍රිය ලෙස හැඳින්වේ), නිෂාවා (අන්ධකාරය ඉවත් කර වර්ණය ලබා දෙයි), පවිත්‍රා (ශුද්ධ), රංජානි (වර්ණය ලබා දෙන), රත්‍රමානිකා (සඳ එළිය තරම් ලස්සන), ෂෝබ්නා (දීප්තිමත් වර්ණය), ශිව (කරුණාවන්ත), ශ්‍යාමා (වර්ණ), සුභගයා (වාසනාවන්ත), සර්වනා

රයිසෝම්වලින් නිපදවා ගන්නා මෙම කුළුබඩුව ව්‍යංජනවලට දීප්තිමත් කහ පැහැය ලබා දීම සිදුකරන මුළුතැන්ගෙයි පවතින ස්වභාවික වර්ණ කාරකයයි. කහ බෝගය ශ්‍රී ලංකාවේ බොහෝ කෘෂි දේශගුණික කලාපවල පවතින පාරිසරික තත්ත්වයන් යටතේදී හොඳින් වගා කිරීමට පුළුවන. එසේ වී නමුත් ශ්‍රී ලංකාව පසුගිය වර්ෂවලදී වාර්ෂික පරිභෝජන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවූ බැවින් ඉන්දියාව වැනි ප්‍රධාන කහ නිෂ්පාදනය කරන රටවලින් ආනයනය සිදුකරන ලදී. නමුත්

මෙලෙස ආනයනය කරන ලද කහවල ගුණාත්මක බව පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදක්වන ලදී. එවිට ප්‍රමාණාත්මකව වැඩි කරගැනීමට එකතු කරන ආදේශක වර්ග සහ වර්ණය ඉහළ නංවා ගැනීමේ අහිතකර රසායනික සංයෝග එකතු කරන ලද කහ වෙළඳපොළ තුළට පැමිණියේය.

කහවල ගුණත්වය මනින ප්‍රධාන සාධකය එහි පවතින කර්කියුමින් ප්‍රතිශතයයි. ඊට අමතරව පලිබෝධ නාශක අවශේෂ ප්‍රමාණය, නිෂ්පාදනයේ පවතින බැරලෝහ ප්‍රමාණයන් පිළිබඳව මූලික වශයෙන් සැලකිලිමත් වෙයි. ලෝකයේ වෙනත් රටවලට වඩා ශ්‍රී ලංකාවේ වගා කරන කහවල ගුණත්වය ඉහළ තත්ත්වයේ පවතී. මෙයට හේතුව වන්නේ අනෙක් රටවල කහවලට සාපේක්ෂව ශ්‍රී ලංකා කහවල පවතින ඉහළ කර්කියුමින් ප්‍රතිශතයයි. එපමණක් නොව අනෙකුත් බොහෝ කහ වගාකරන රටවල් කහ වගාවට හානිකරන රෝග පලිබෝධ පාලනයට රසායනික පලිබෝධ නාශක විශාල වශයෙන් භාවිත කරයි. ලංකාවේදී කහවලට පවතින රෝග පලිබෝධ හානි අඩු බැවින් ගොවීන් රසායනික මර්දන ක්‍රම භාවිතය අඩුය. එමනිසා අවසන් නිෂ්පාදනයේ පලිබෝධ නාශක අවශේෂ ප්‍රමාණය ඉතා අඩුය. එමෙන්ම වෙනත් රටවල් විශාල වශයෙන් රසායනික පොහොර භාවිතා කළද අප රටේ ගොවීන් ඒකාබද්ධ පාංශු පෝෂක සැපයීමේ ක්‍රමයට අනුගතව සිටින නිසා අස්වැන්නේ පවතින ලෙඩ්, ආසනික්, කැඩ්මියම් වැනි බැරලෝහ ප්‍රමාණය ද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්දේශයන්ට අනුකූල වෙයි. මෙම කාරණා සලකන විට දේශීයව කහ වගා කොට නිෂ්පාදනය කොට ආහාරයට ගැනීම සෞඛ්‍යයට වඩාත් හිතකර වේ. සමාජිකයින් පස් දෙනෙකු සිටින පවුලකට වාර්ෂික කහ කුඩු අවශ්‍යතාවය කිලෝ ග්‍රෑම් 1.5 සිට 2 පමණ වේ. එනම් අමු කහ කිලෝ ග්‍රෑම් 12ක් පමණ වේ.මෙම අවශ්‍යතාවය බොහෝ පිරිසකට පහසුවෙන්ම තම ගෙවත්තෙන්ම සපයා ගත හැකිය.


වියලීමට තම්බා පෙති කැපූ කහ


හරිතාගාර ආකාර වියලනයක වියලන කහ


වියලි කහ

ලංකාවේ කහ අල වියලූ පසු ලැබෙන නිෂ්පාදනය ආනයනික වියලි කහවලට වඩා ප්‍රමාණයෙන් තරමක් කුඩා වේ. එනමුත් සෑමවිටම දේශිය කහ ගුණාත්මයෙන් ඉහළ වන අතර ඉහළ කර්කියූමින් ප්‍රතිශතයක් පවතී. මා විසින් මෑත කාලයේ සිදු කරන ලද පර්යේෂණවලට අනුව කහවල වර්ණය කහ පාටට වඩා තැඹිලි පාටට හැරෙන විට කර්කියුමින් ප්‍රතිශතය වැඩිවන බව තහවුරු විය. දේශීය කහ බොහෝ විට තැඹිලි පැහැයක් ගන්නා අතර ඒවායේ කර්කියුමින් ඉහළ ප්‍රතිශතයක් පවතී.

කහවල මූලික ක්‍රියාකාරී සංඝටකය සහ එහි ලාක්ෂණික කහ පැහැය ලබා දෙන්නේ කර්කියූමින් මගිනි. ඇත්ත වශයෙන්ම, කහවල විභව සෞඛ්‍ය ප්‍රතිලාභ බොහෝමයකට වගකිව යුතු සංයෝගයක් ලෙස කර්කියුමින් හඳුන්වා දිය හැකිය. ''කර්කියුමින් යනු ස්වාභාවික ප්‍රතිඔක්සිකාරකයක් වන අතර එය anti-inflammatory ප්‍රතිලාභ මෙන්ම වයස්ගත වීමේ ක්‍රියාවලිය මන්දගාමී කිරීම සහ ඇල්සයිමර් රෝගය හා මානසික අවපීඩනය වැළැක්වීම සම්බන්ධ ප්‍රතිලාභ ඇතිකරන සංයෝගයකි.

මෙහිදී, නිශා හෙවත් කහ සහ කර්කියුමින් වලින් ලැබෙන ප්‍රතිලාභ මොනවාදැයි මූලිකව හඳුනා ගැනීම වටී. කහවල ප්‍රබල ඖෂධීය ගුණ සහිත ජෛව ක්‍රියාකාරී සංයෝග අඩංගු වේ. කහ යනු ව්‍යංජනවල කහ පැහැය ලබා දෙන කුළුබඩු වර්ගයකි. එය වසර දහස් ගණනක් තිස්සේ ඉන්දියාවේ හා ලංකාවේ කුළුබඩු හා ඖෂධීය පැළෑටියක් ලෙස භාවිතා කර ඇත.

කහවල ඇති මෙම සංයෝග කර්කියුමිනොයිඩ් ලෙස හැඳින්වෙන අතර, එයින් වඩාත් වැදගත් වන්නේ කර්කියුමින් ය. ඒ අනුව කහවල ප්‍රධාන ක්‍රියාකාරී සංඝටකය කර්කියුමින් ය. එය ප්‍රබල anti-inflammatory බලපෑම් ඇති අතර ඉතා ප්‍රබල ප්‍රතිඔක්සිකාරකයකි.

අවාසනාවකට මෙන්, කහ සහ කර්කියුමින්) රුධිරයට හොඳින් අවශෝෂණය නොවන බව පර්යේෂණවලින් පෙන්වාදී ඇත. විවිධ අධ්‍යයනයන්වලට අනුව ශරීරයට අවශ්‍ය කහ සහ කර්කියුමින් ප්‍රමාණයන් අවශෝෂණය කරගැනීමට, වෙනත් අතිරේක සමග ලබාගත යුතුය. ඒ සඳහා සුදුසු අතිරේක ද්‍රව්‍ය ලෙස කළු ගම්මිරිස් යොදා ගත හැකි බව පර්යේෂණවලින් පෙන්වා දී ඇත. කහ භාවිත කරන ඕනෑම වේලාවක කළු ගම්මිරිස් එකතු කිරීමෙන් සහ / හෝ කළු ගම්මිරිස් අඩංගු කහ අතිරේකයක් ගැනීමෙන් ප්‍රතිලාභ ලබා ගත හැකිය. "කළු ගම්මිරිස්වල පයිපෙරීන් නම් සංයෝගයක් ඇති අතර, එය කහ වඩාත් ජෛව විද්‍යාත්මක අවශෝෂණය කර ගැනීමට උපකාරී වේ. ජෛව උපයෝගීතාව යනු ශරීරයට අවශෝෂණය කර ගත හැකි හෝ භාවිත කළ හැකි ද්‍රව්‍යයක ප්‍රමාණයයි. නිදසුනක් වශයෙන්, අතීත අධ්‍යයනයකින් හෙළි වූයේ පයිපෙරීන් මිලිග්‍රෑම් 20 ක් සහ කර්කියුමින් ග්‍රෑම් 2 ක් පරිභෝජනය කිරීමෙන් ජෛව උපයෝගීතාව සියයට 2,000 කින් වැඩි වන බවයි.

හොඳම කර්කියුමින් අතිරේකවල පයිපෙරීන් අඩංගු වන අතර ඒවායේ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩි කරයි. කර්කියුමින් මේදයේ ද්‍රාව්‍ය වේ. එබැවින් මේද ආහාර වේලක් සමඟ කහ ආහාරයට ගැනීම සුදුසුය.

කහ ශරීරයේ ප්‍රතිඔක්සිකාරක ධාරිතාව වැඩි කරයි. ශරීරයේ ඔක්සිකාරක ක්‍රියාත්මක වීම, වයස්ගත වීම සහ බොහෝ රෝග පිටුපස ඇති එක් යාන්ත්‍රණයක් යැයි විශ්වාස කෙරේ. එම අහිතකර සංයෝග අතර නිදහස් මුක්ත බණ්ඩක, නොගැලපෙන ඉලෙක්ට්‍රෝන සහිත ඉහළ ප්‍රතික්‍රියාශීලී අණු ඇතුළත් වේ. නිදහස් මුක්ත බණ්ඩක මේද අම්ල, ප්‍රෝටීන හෝ ඩී.එන්.ඒ වැනි වැදගත් කාබනික ද්‍රව්‍ය සමඟ ප්‍රතික්‍රියා කරයි. කහවල ඇති ප්‍රතිඔක්සිකාරක මෙතරම් ප්‍රයෝජනවත් වීමට ප්‍රධාන හේතුව වන්නේ ඒවා මගින් ශරීරය නිදහස් මුක්ත බණ්ඩකයන්ගෙන් ආරක්ෂා කිරීමයි. කර්කියුමින් යනු එහි රසායනික ව්‍යුහය හේතුවෙන් නිදහස් මුක්ත බණ්ඩක උදාසීන කළ හැකි ප්‍රබල ප්‍රතිඔක්සිකාරකයකි. ඊට අමතරව, කර්කියුමින් ශරීරයේම ප්‍රති ඔක්සිකාරක එන්සයිමවල ක්‍රියාකාරිත්වය වැඩි කරයි. ඒ ආකාරයෙන්, කර්කියුමින් නිදහස් මුක්ත බණ්ඩකවලට එරෙහිව දෙයාකාරයකින් ක්‍රියා කරයි.

කර්කියුමින් මොළයේ රෝග අවදානම අඩු කරයි. කර්කියුමින් හෘද රෝග අවදානම අඩු කරයි. කහ මගින් පිළිකා වැළැක්වීමට (සහ සමහර විට ප්‍රතිකාර කිරීමට පවා) උපකාරී වේ. ආතරයිටිස් රෝගීන් කර්කියුමින් ආහාර අතිරේකය සඳහා ඉතා හොඳින් ප්‍රතිචාර දක්වයි. හෙළ වෙදකමේදී ද කහ යොදා ගනිමින් ආතරයිටිස් සඳහා ආලේප සකසා ඇත.





කර්කියුමින් වයසට යාම ප්‍රමාද කිරීමට සහ වයසට සම්බන්ධ නිදන්ගත රෝග සමඟ සටන් කිරීමට උපකාරී වේ. මේ හේතුව නිසා, කර්කියුමින් වයස්ගත වීම වැළැක්වීමේ ආහාර අතිරේකයක් ලෙස ඉතා ජනප්‍රිය වී තිබේ. එමෙන්ම රූපලාවන්‍ය ක්ෂේත්‍රයේ විවිධ නිෂ්පාදන සඳහා ද කහ යොදා ගනී. කහවලට ඉහළ විෂබීජ නාශක හැකියාවක් පවතින බැවින් අතීතයේ සිට විෂබීජනාශකයට යොදා ගැනිනි. එබැවින් විවිධ වසංගත පැතිරෙන මේ සමයේ විෂබීජනාශක නිෂ්පාදනයට කහ යොදා ගත හැකිය.

මෙවැනි විශාල ගුණ ප්‍රමාණයක් සහිත කහ ආහාරයට ගැනීමේදී කර්කියුමින් වැඩිපුර ඇති දේශීය කහ ආහාරයට ගන්නේ නම් ඉතා අගනේය. මෙලෙස හඳුනා ගත් කහ අතීතයේදී මෙන් ගෙවත්තේම වගා කොට ආහාරයට ගැනීම සුදුසු වේ. එමෙන්ම දේශීය කහ යොදා ගනිමින් කර්කියුමින් සහිත අගය එකතු කළ නිෂ්පාදන සිදුකොට අපනයනය කිරීමෙන් සොඳුරු නිශා තුළින් දේශීය අප රටේ ආර්ථිකය නංවා ගත හැකි වනු ඇත.



අමු අල අස්වැන්න කිලෝ ග්‍රෑම් 20-25 ක් ඇතිවිට මෙම ක්‍රමයට සකසා නිවසේ පරිභෝජනයට අවශ්‍ය  කහ ටික ඔබට ම නිවසේදී සකසා ගත හැකිය. පස් දෙනෙක් සිටින පවුලකට වසරකට වියලි කහ කිලෝ ග්‍රෑම් 2.5 ක් පමණ ප්‍රමාණවත් වේ.

## ගෘහස්ත පරිභෝජනයට කහ සැකසීම

### ❖ අස්වනු නෙලීම

කහ පත්‍ර කහ පැහැ වී වියලීමට පටන්ගත් විට අල මෝරා ඇති අතර අස්වනු මේ අවස්ථාවේදී නෙලාගත හැකිය. අස්වනු නෙලීමේදී රයිසෝම්වලට හානි නොවන ලෙස උදලු මුල්ලුවක ආධාරයෙන් ගලවාගනී. අල අතර පස් ලී පතුරක ආධාරයෙන් ඉවත් කර පිරිසිදු කරගත යුතුය. ගෘහාශ්‍රිතව පොලිසැක් මලුවල වගා කරන ලද කහ අල ද පත්‍ර කහ වී වියලෙන විට රයිසෝම්වලට හානි නොවන ලෙස ගලවාගනී.

### ❖ අස්වනු සැකසීම

**ප්‍රධාන පියවර 5කි.**

1. කහ අල පිරිසිදු කිරීම
2. කහ අල තැම්බීම
3. කහ අල පෙති කැපීම
4. කහ අල වියලීම
5. කහ කුඩු සාදා ගැනීම

1. කහ අල පිරිසිදු කිරීම

මව් අලවලින් ඇඟිලි අල වෙන්කරගෙන මව් අලවල මුල් කපා ඉවත් කරගන්න. මව් අල සහ ඇඟිලි අල වෙන වෙනම කිහිපවිටක් සෝදා ඒවායේ අපද්‍රව්‍ය ඉවත් කරගත යුතුය.




2. කහ අල තැම්බීම

තැම්බීමේ ක්‍රියාවලියේදී මව් අල දිග අතට දෙකට කපා ගන්න. පසුව ඇඟිලි අල සමග එකට තම්බාගත යුතුය.

ජල භාජනයක් රත්වීමට තබා ජලය නටවන්න. ඉන්පසු නටන ජලයට කහ අල එක්කරන්න.



මෙහිදී කහ අල ජලයෙන් වැසීතිබිය යුතුය. ජල බඳුන හොඳින් වසා ජලය නටන උෂ්ණත්වයෙහි පවත්වා ගනිමින් මිනිත්තු 30 ක් පමණ කාලයක් හොඳින් තම්බාගත යුතුය. අල හොඳින් තැම්බී ඇත්නම් අමු ගඳ ඉවත් වී ප්‍රසන්න කහ සුවඳක් වහනය වන අතර අල මෘදු වේ. මේ අවස්ථාවේ කහ අලයක් කඩා බැලූ විට නූල් ඇදෙයි නම් හොඳින් තැම්බී ඇති බව සනාථ වේ.

එමෙන්ම ගෘහස්ථ පරිභෝජනය සඳහා කහ සකස් කිරීමේදී පීඩන උඳුනක් (Pressure cooker) හෝ ස්ටීමරයක් භාවිත කර විනාඩි 20ක් පමණ තම්බා ගත හැකිය.

3. කහ අල පෙති කැපීම

තැම්බූ අල, වතුර බේරෙන්නට තබා සිසිල් වූ පසු මිලිමීටර 2ක් 3ක් ඝනකම් රවුම් පෙති කපා ගන්න.



4. කහ අල වියළීම

ගෘහස්ථව කහ වියලා ගැනීමේදී තම්බා පෙති කපාගත් කහ අල දින 3-5 ක් පමණ ක්‍රිස්පි ආකාර වනතෙක් වියලා ගත යුතුය. අමු කහ කිලෝ ග්‍රෑම් 5කින් 6කින් වියලි කහ 1kg සාදාගත හැකිය.



5. කහ කුඩු සාදා ගැනීම

වියලි කහ පෙති ගෘහස්ථ ඇඹරුම් යන්ත්‍රයක් මගින් පහසුවෙන් කුඩු කර ගත හැක.

**තුෂාරි ලියනගේ**
සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ)
අංශ ප්‍රධාන -පසු අස්වනු තාක්ෂණ අංශය
මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මාතලේ

# නිරෝගී ගම්මිරිස් වගාවකට මං පෙත..............

කුළුබඩු ලොවේ කිරුළ අභිමානයෙන් දරා සිටින්නා වූ, "කුළුබඩු ලොවේ රජ" නම් විරුදාවලියෙන් අභිෂේක ලබමින්, සිහසුන මත දීර්ඝ කලක් සාඩම්බරව වැජඹෙන ගම්මිරිස් ලොව පුරා විවිධ ආහාරයන් හා මුසුවී කට දිව පිනවන රස කාරකයක් මෙන්ම රෝග රැසකට මහගු ඖෂධයක් බවට පත්ව ඇත. එබැවින් ලෝක වෙළඳපොලෙහි ඉහළම ඉල්ලුමක් ලැබීමට සමත්වීමත් අරුමයක්ද? ගම්මිරිස් Piper nigrum L යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන අතර, ශ්‍රී ලංකාවේ හෙක්ටයාර 32000ක පමණ වපසරියක් තුළ වගා කෙරේ. ගම්මිරිස් බෝගය ආශ්‍රිතව ආර්ථිකව වැදගත්කමක් ඇති ඉක්මන් මැළවීම, සෙමෙන් මැළවීම, පත්‍ර කුඩාවීමේ රෝගය සහ බැක්ටීරියා පත්‍ර අංගමාරය වැනි රෝග ද, ආර්ථිකව වැදගත්කමින් අඩු ත්‍රෙඩ් / විල්ලුද අංගමාරය, දුඹුරු පුල්ලි රෝගය, ඇල්ගී, ලයිකන නිසා ඇතිවන රෝගයන්ද ඇතැම්විට දක්නට ලැබේ. ඇතැම් රෝග නිසා අස්වැන්න අඩු වීම, වැලේ දිරිය/වර්ධනය අඩුවීම මෙන්ම වැල අර්ධ ලෙස හෝ සම්පූර්ණයෙන්ම මියයාම පවා සිදුවේ. බොහෝ දෙනා රෝග පාලනය පිළිබඳව ඕනෑවටත් වඩා සැලකිළිමත් වුවත්, රෝග වළක්වා ගැනීම පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදක්වයි.

නීරෝගී වගාවක් පවත්වා ගැනීම තුළින් රෝග පළිබෝධ වගා බිමට ඒම වළක්වා ගැනීමට හැකි වනවා පමණක් නොව රෝග මර්දනය සඳහා වැයවන මුදලත් ශ්‍රමයත්, අස්වැන්නේ ගුණාත්මය හා ප්‍රමාණය ද රැකගත හැකිවේ. ඒ නිසා කෘෂිකාර්මික ක්‍රම අනුගමනය කිරීම තුළින්ම වගාව රැක ගැනීම අපට කළ හැක. ඒ සඳහා

- **නීරෝගී රෝපණ ද්‍රව්‍ය ලබාගෙන වගාව ආරම්භ කිරීම**

  නීරෝගී මව් ශාක තෝරා ගතයුතුය. එසේම මේ සඳහා දෙපාර්තමේන්තුව මඟින් සහතික කරන ලද රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම ඉතා වැදගත්ය.

- **වගාදර්ශ කීපයක් යොදා ගනිමින් වගාව සිදුකිරීම -**

  ඇතැම් වගාදර්ශ විවිධ රෝග පළිබෝධයන්ට ප්‍රතිරෝධීතාවයක් (ඔරොත්තු දීම) දක්වන බැවින් රෝග පළිබෝධ ක්ෂේත්‍රයට පැමිණීම අඩුවීමක් සිදු වනවා පමණක්ම නොව හානිවන අස්වැන්නේ ප්‍රමාණය සීමා කරගත හැකිය.

- **පස ආවරණය වන පරිදි ආවරණ වගාවක් යොදා ගැනීම-**

  මේ තුළින් පාංශු ඛාදනය අඩු කිරීමත්, තෙතමනය රැක ගැනීමත්, ඇතැම් විට පෝෂක පසට එකතු වීමත් (නයිට්‍රජන් තිර කරන රනිල ශාක) යන ක්‍රියාවන් සිදුවේ. එසේම වාණිජ වටිනාකමකින් යුතු බෝගයක් නම් අමතර ආදායමක්ද ලැබෙනවා පමණක් නොව,කාර්යක්ෂම භූමි පරිහරණයත්, අස්වැන්නෙන් පාඩුවක් වුවහොත් එය ද සමනය කරගත හැක. (උදා :- තේ වගාව)

- **සෙවන පාලනය -**

  ප්‍රමාණවත් සෙවනක් පවත්වාගෙන යාම තුළින් හිරු එළිය මනා ලෙස ක්ෂේත්‍රයට ලැබේ. එමගින් රෝග කාරක සහ පළිබෝධ හානි මෙන්ම පරපෝෂී පත්‍ර (හිරු එළිය නොවැටෙන - වියපත් පත්‍ර) සංඛ්‍යාව අඩු වීමත් නිසා ශාක ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය ද වේගවත් වේ. අස්වැන්න ද වැඩිවේ. (ප්‍රභාසංස්ලේෂණ පෘෂ්ඨ වර්ගඵලය වැඩිවේ).

- **ක්‍රමාණුකූල පොහොර භාවිතය -**

  නිර්දේශිත පොහොර මිශ්‍රණය නියමිත කාලාන්තරවලින් යෙදීම ඉතා වැදගත් අතර, ඊට අමතරව කාබනික පොහොර ද මිශ්‍රව යොදන්නේ නම් පසේ සරුබව මෙන්ම පසේ වයනය, ව්‍යුහය ද

දියුණු වේ. එසේම යොදන රසායනික පොහොරවල කාර්යක්ෂමතාවය ද ඉහළ යයි. පසේ වෙසෙන හිතකර ක්ෂුද්‍රජීවීන්ගේ මහා ජීවීන්ගේ ගහනය ද ඉහළ යයි. පස අධික ලෙස ආම්ලික භාෂ්මික ක්ෂාරීය වීම ද පාලනය වේ.

- මෙහිදී මයිකොරයිසා වැනි හිතකර දිළීර පසට එක් කරන්නේනම් ශාකවල වර්ධනය තවතවත් වැඩිවේ. රෝග කාරක ගහනය ද අඩුවේ.
- නියමිත කාලාන්තරවලින් ආධාරක ශාක කප්පාදු කර පසට එක්කිරීම මගින් ද පසේ භෞතික රසායනික ගුණාංග ඉහළ තත්ත්වයකට පත්කළ හැකිය.

- **ක්‍රමානුකූල වල් පාලනය** - බෝගය සමඟ පෝෂක, ජලය සඳහා තරඟ කරන වල් පැළෑටි ඇතැම් රෝග සහ පළිබෝධකයන්ට අන්තර් ධාරක ද වේ. එහෙත් පස සෝදායාමේ ක්‍රියාවලියේදී හිතකර අයුරින් ක්‍රියා කරන වල් පැළෑටි ගම්මිරිස් වගාවේදී වීසි ගැසීමෙන් හෝ කෙටි කර කපා අවස්ථාවට උචිත අන්දමින් පාලනය කිරීමට වගබලා ගතයුතුය.
- **නිසි පරිදි ජලය සම්පාදනය** - බෝගයේ බරින් 90%ක් පමණ අන්තර්ගත වන්නේ ජලයයි. සියලුම පරිවෘත්තීය ක්‍රියාවන් ඇතුළු ජීව ක්‍රියාවන්ට හා පෝෂක ද්‍රාව්‍ය තත්ත්වයට පත් වීමටත් ප්‍රමාණවත් තරම් ජලය තිබිය යුතුය. පුෂ්පීකරණය, කරල් පිරීමට, පසෙන් පෝෂක උරා ගැනීමට තදින්ම වගකිවයුතු ජලය රෝග වලට ඔරොත්තු දීමේ ශක්තිය ද ඇති කරයි. එබැවින් පසේ භෞතික ගුණාංග, ජල ප්‍රභවයේ ඇති ජල ප්‍රමාණය ද, භූවිෂමතාවය ද සලකා බලා සුදුසු ජල සම්පාදන ක්‍රමයක් තෝරාගත යුතුය.
- **ජලවහනය** - බොහෝ රෝගයන්ට හිතකර තෙත් පරිසරය ඇති වන්නේ අතිරික්ත ජලය නිසි පරිදි බැස නොයාමෙනි. මේ නිසා අහිතකර නිර්වායු ක්ෂුද්‍ර ජීවීන් ඇතිවීමත්, පාංශු වාතය/වාතනය දුර්වල වීමෙන් මුල් කුණු වීමත්, විෂ වායූන් හටගැනීම, පස ආම්ලික වීම වැනි අහිතකර තත්ත්ව ඇතිවේ. මෙහි අවසන් ප්‍රතිඵලය බෝගය දුර්වල වීමයි. එබැවින් භූ විෂමතාවය, පසේ ස්වභාවය වැනි සාධක සැලකිල්ලට ගෙන සුදුසු ජලවහන ක්‍රමයක් තීරණය කළ යුතුය.
- **නඩත්තු කටයුතු**- පොළව මට්ටමේ ඇති පාර්ශවික අතු (හරස් අතු) අඩි 1 1/2ක් පමණ ඉහළට ඉවත් කිරීම, රෝගී හා පළිබෝධ හානි වූ කොටස් ඉවත් කිරීම හා වැසි කාලයන්හිදී වසුන් ඉවත් කිරීම, හැකි තාක් යාන්ත්‍රික හානි වළක්වා ගැනීම වැනි කටයුතු සිදුකිරීම.
- **අස්වනු නෙලීමට සුදුසු අවස්ථාවේදී අස්වනු නෙලීම** - මෙමගින් බීජ හැලීමෙන් වන පාඩුව පාලනය වේ.
- **කාලීනව උද්ගතවන රෝග, පළිබෝධකයන් පිළිබඳව නිරන්තරයෙන් දැනුවත් වීම** - මෙමගින් රෝග පළිබෝධකයින් හඳුනා ගැනීමේ හා යාන්ත්‍රිකව සිදුකළ හැකි සරල පාලන ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබා ගතහැකිය. (උදාහරණ -ගම්මිරිස් වගාවේ කොළ කුඩාවීමේ රෝගය දුටු වහාම එම වැල වගා බිමෙන් ඉවත්කිරීමට කටයුතු කළ යුතුය.)
- **නිරන්තරයෙන්ම වගාව පිළිබඳව සුපරික්ෂාකාරී වීම** - රෝගයක් පළිබෝධයක් වගාවට ඇතුළු වූ සැනින් එය හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කළ හැකි නිසා සැම විටම පාහේ ආර්ථික හානිදායක මට්ටම ඉක්මවා යාම වළක්වා ගතහැකිය.

ඉහත සියලුම උපායන් මගින් බෝගවල නිරෝගී බව ආරක්ෂා වේ. ඒ නිසා රෝග පළිබෝධ වලින් තොර සාරුසාර වගාවක හිමිකාරිත්වයත්, මානසික තෘප්තිමත් බවත් ඔබට හිමිවේ.

**ඩී. වී. ආර්. ඉනෝකා දෙනියපහල,**
තාක්ෂණ නිලධාරී
ශාක ව්‍යාධී විද්‍යා අංශය
අපනයන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය - මාතලේ